වාර්ෂික වාර්තාව 2023



IPS

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

CONTENTS

1 අප පිළිබඳ දැක්ම මෙහෙයුම පාලක මණ්ඩලය

3 සභාපතිතුමාගේ පණිවිඩය

4 විධායක අධ්‍යක්ෂතුමියගේ වාර්තාව

6 වැදගත් සිදුවීම් 2023

8 පර්යේෂණ වැඩසටහන

9 සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරඟකාරිත්වය

14 ශ්‍රමය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය

19 සංක්‍රමණය සහ නාගරීකරණය

23 දරිද්‍රතාවය සහ සමාජ ශුභසාධනය

26 කෘෂිකර්මය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය

29 පරිසරය, ස්වභාවික සම්පත් සහ කාලගුණ වෙනස

31 පර්යේෂණ කාර්ය මණ්ඩලය

33 සහය කාර්ය මණ්ඩලය

34 සහය සේවා

34 මූල්‍ය සහ පරිපාලනය

37 මූල්‍ය විශේෂ අවස්ථා - 2014 - 2023

38 සන්නිවේදනය සහ ප්‍රවේශය

තොරතුරු පද්ධති ඒකකය

39 පුස්තකාලය සහ ප්‍රකාශන 2023

40 අභ්‍යන්තර සම්මන්ත්‍රණ

43 IPS සීමාවාසික වැඩසටහන 2023

45 මූල්‍ය ප්‍රකාශන

අප ගැන

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය යනු පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කර ඇති, ශ්‍රී ලංකාවේ තිබෙන ඉහළම ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය වේ. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහ සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රබල සාක්ෂි සපයා දීම පිණිස ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම අපගේ මෙහෙවර වේ.

දශක තුනකට අධික කාලයක් පුරා ස්වකීය ආයතනය විසින් සිදු කරන ලද විශිෂ්ඨ, ස්වාධීන පර්යේෂණ රාශිය නිසා ප්‍රතිපත්ති අධ්‍යයන අයතනය ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ක්ෂේත්‍රයෙහි විශිෂ්ඨතා කේන්ද්‍රයක් ලෙස පිළිගැනීමට ලක්වී තිබේ. මෙම ආයතනයෙහි පර්යේෂණ වැඩසටහන මගින් ශ්‍රී ලංකාවේ සහ ආසියානු කලාපයේ වර්තමාන සමාජ-ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ ඉතා වැදගත් ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කෙරෙයි. වාර්තා, පර්යේෂණ පත්‍රිකා, සඟරා ලිපි සහ ප්‍රසිද්ධ ඉදිරිපත් කිරීම් හරහා පුළුල්ව ප්‍රචාරණය කරනු ලබන ආනුභවික-පාදක පර්යේෂණ මගින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයට සහාය දීමේ ස්වකීය ජයග්‍රාහී වාර්තාව බිහි කිරීමට මූලික වූයේ මෙම ආයතනයේ ප්‍රබල අභ්‍යන්තර පර්යේෂණ කණ්ඩායමෙහි පරිපූර්ණ නිපුණත්වයයි.

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික පරිණාමය සඳහා උත්ප්‍රේරකයක් වන, ගෝලීය වශයෙන් පිළිගත් පර්යේෂණ ආයතනයක් බවට පත්වීම.

මෙහෙවර

සමාජ-ආර්ථික ගැටළු පිළිබඳ විශ්වාසනීය, තියුණු දැක්මක් සපයා දෙන, ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම මගින් අපගේ පාර්ශවකරුවන්ව දැනුවත් කිරීම සහ ප්‍රතිපත්ති න්‍යාය පත්‍ර හැඩගැස්වීම සහ එමගින් සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කිරීම.

පාලක මණ්ඩලය

මහාචාර්ය සිරිමල් අබේරත්න මහතා
සම්මානිත මහාචාර්ය
ආර්ථික විද්‍යා දෙපර්තමේන්තුව,
කොළඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය එම්.කේ.සී. සේනානායක මහතා
අධ්‍යක්ෂ ජෙනරාල්, රාජ්‍ය මූල්‍ය දෙපර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය,
භාණ්ඩාගාර ලේකම් වෙනුවට (නිල බලයෙන්)

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි මහතා
අධ්‍යක්ෂ ජෙනරාල්, ජාතික ක්‍රමසම්පාදන
දෙපර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
(නිල බලයෙන්)

එ.ආර්.කේ. විජේසේකර මහතා
සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වෙනුවට (නිල බලයෙන්)

මහාචාර්ය අනෝමා එස්.පී. අභයරත්න මහත්මිය,
ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඕ.පී. දයාරත්න බණ්ඩා මහතා
ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ආර්.එම්. අබේරත්න මහතා
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය දුෂ්නි වීරකෝන්
විධායක අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

සභාපතිතුමාගේ පණිවිඩය



මහාචාර්ය සිරිමල් අබේරත්න මහතා
සම්මානිත මහාචාර්ය
ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව,
කොළඹ විශ්වවිද්‍යාලය

අපි පසුගිය 2023 වර්ෂය පිළිබඳ නැවත ආවර්ජනය කරන විට, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විශේෂ අවස්ථා සහ ජයග්‍රහණ පිළිබඳවත්, අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී අපි මුහුණ දුන් අභියෝග පිළිබඳවත් ඔබ සමඟ තොරතුරු බෙදා ගැනීමට ලැබීම මාගේ වරප්‍රසාදයක් කොට සලකමි. ජාත්‍යන්තර වශයෙන් කීර්තියක් දිනා ගෙන ඇති ශ්‍රී ලංකාවේ බුද්ධි මණ්ඩලයක් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මෙරට ප්‍රතිපත්ති සම්පාදනයට පර්යේෂණ පදනම් කරගත් යෙදවුම් සපයා දීම මගින් සහ එහි පර්යේෂණ නිමැවුම් රටේ මහජනතාවට සහ අන්තර්ජාතික ප්‍රජාව වෙත බෙදාහැරීම මගින් ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික පරිවර්තනය උත්ප්‍රේරණය කරන ආයතනයක් වීමට ප්‍රයත්න දරයි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සිදු කරනු ලබන පර්යේෂණ නිමැවුම්, ප්‍රතිපත්ති මගපෙන්වීම් සහ දැනුම බෙදාහැරීම් ස්වකීය ආයතනික මෙහෙවරෙහි තවත් වැදගත් සන්ධිස්ථානයක් සාක්ෂාත් කර ගැනීම පිළිබිඹු කරයි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ඒකක සාර්ව ආර්ථිකය, වෙළඳාම, තරඟකාරිත්වය, සංක්‍රමණය, නාගරීකරණය, සෞඛ්‍යය, අධ්‍යාපනය, දරිද්‍රතාවය සහ අනෙකුත් ඒ ආශ්‍රිත සමාජ-ආර්ථික ගැටළු වැනි අතිශය වැදගත් ක්ෂේත්‍ර පිළිබඳව ගවේෂණය කරයි. වර්ෂය පුරා සිදු කරන මෙම පර්යේෂණ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල අපගේ වාර්තා, විවිධ පොත්වල පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත ප්‍රකාශනවල තොරතුරු මූලාශ්‍රය වී ඇත. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ වැඩසටහනෙන් කොටසක් මෙරට වර්තමාන ආර්ථික අර්බුදය සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැන නගින ප්‍රතිපත්තිමය ගැටළු සම්බන්ධයෙන් විමසා බැලීම සඳහා වෙන් කරන ලදී.

එම පර්යේෂණ මගින් සොයාගත් කරුණු ප්‍රතිපත්ති සාකච්ඡාවලට වැදගත් තොරතුරු සපයා දෙමින්, තීරණ හැඩගස්වමින්, අපගේ ජාතියේ යහපැවැත්මට දායකත්වය සපයා දුන්නේය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයන්ට සාක්ෂි පදනම් කරගත් යෙදවුම් සපයා දීම මගින් ස්වකීය දායකත්වය සපයා දෙමින්, ජනාධිපති ලේකම් කාර්යාලයේ, මුදල් අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙන්ම තවත් බොහෝ අමාත්‍යාංශවල සහ ව්‍යවස්ථාපිත ආයතනවල රජයේ ප්‍රතිපත්ති සම්පාදන කමිටු නියෝජනය කළේය. එමෙන්ම, ලෝක බැංකුව, ලෝක බැංකු සංසදය, සහ වෙනත් විදේශීය හා ජාත්‍යන්තර පර්යේෂණ සංවිධාන වැනි බහුපාර්ශ්වික සංවිධානවල අන්තර්ජාතික ප්‍රකාශන සඳහා පර්යේෂණ යෙදවුම් සපයා දෙමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජාත්‍යන්තර තලයේ පෙනී සිටිමින්, විවිධ ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති සංසද, සම්මන්ත්‍රණ සහ සමුළු ආදියට ස්වකීය ක්‍රියාකාරී නියෝජනය අඛණ්ඩව සපයා දුන්නේ ය.

2023 වර්ෂය ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන් ද නව අභියෝග රැසක් එල්ල කළ වර්ෂයක් විය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතිවූ ගෝලීය ආර්ථිකයේ කැළඹිලි සහිත කාල පරිච්ඡේදය ලොව පුරා ආර්ථිකයන්, සමාජ සහ ජීවිත කෙරෙහි අඛණ්ඩව බලපෑම් ඇති කළේය. මෙරට පෙර නොවූ විරූ ආර්ථික අර්බුදය මෙන්ම ආර්ථිකය උත්තේජනය කරන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි අභ්‍යන්තර මෙහෙයුම් කෙරෙහි මෙන්ම බාහිර මෙහෙයුම් කෙරෙහි ද අභියෝග නිර්මාණය කළේ ය. එසේ වුවත්, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කණ්ඩායම ආයතනයේ අභ්‍යන්තර මෙහෙයුම් සහ මූල්‍ය කාර්ය සාධනය කාර්යක්ෂමව කළමනාකරණය කර ගනිමින්, ස්වකීය විෂය පථය වූ පර්යේෂණ වැඩසටහන් සුමටව සහ ස්ථාවරව කළමනාකරණය කර ගත්තේය. මෙවන් වාතාවරණයක් තුළ, පෙර නොවූ විරූ අභියෝග හමුවේ ආයතනයේ අභ්‍යන්තර මෙහෙයුම් මෙන්ම බාහිර කාර්ය සාධනය ද මනාව කළමනාකරණය කිරීමට සමත් වූ ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මියගේ නායකත්වයෙන් යුත් පර්යේෂණ සහ පරිපාලන කාර්ය මණ්ඩලය යන දෙඅංශයෙන් සමන්විත ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන කණ්ඩායමේ කැපවීම මම ඉමහත් සාඩම්බරයෙන් යුතුව අගය කරමි.

රටේ ඉදිරි ගමනේ දී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සාක්ෂි මත පදනම් වූ විසඳුම් සපයා දීම සඳහා කැපවී සිටියි. අපි ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ අඛණ්ඩව සම්බන්ධ වෙමින්, අන්තර්කරණය වූ වර්ධනයක් වෙනුවෙන් පෙනී සිටිමින්, තිරසාර සංවර්ධනයට දායකත්වය සපයා දෙන්නෙමු. සෑම පුරවැසියෙකුටම දියුණුව අත්කර දෙන සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම අපගේ දැක්මයි. අපගේ කැපවූ කාර්ය මණ්ඩලයට, අපගේ පාලක මණ්ඩලයට සහ අපගේ මෙහෙවරට සහයෝගය දක්වන සියලු දෙනාට මම මගේ කෘතඥතාවය පුද කරමි. අපි එකට එක්වූ විට අපට දීප්තිමත් අනාගතයක් ගොඩනගා ගත හැක.

සිරිමල් අබේරත්න
සභාපති, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

විධායක අධ්‍යක්ෂතුමියගේ වාර්තාව



ආචාර්ය දුෂ්නි වීරකෝන්

තවත් කැළඹිලි සහිත වර්ෂයක සීඝ්‍රයෙන් වෙනස් වෙමින් තිබෙන සමාජ-ආර්ථික තත්ත්වයන්ට ප්‍රතිචාර දක්වමින්, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2023 වර්ෂය පුරාවට ම ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධ ගැටලු පිළිබඳ අතිශය වැදගත් අවබෝධයක් සපයා දීම පිණිස විශ්වාසනීය සහ ප්‍රබල පර්යේෂණ සිදු කිරීමේ දීර්ඝ ඉතිහාසය තව දුරටත් අඛණ්ඩව පවත්වාගෙන ගියේ ය.

උද්ධමන අනුපාතය සීඝ්‍රයෙන් පහත වැටීම සහ රුපියල ක්‍රමයෙන් නැවත ස්ථාවරත්වයට පත්වීමේ ලක්ෂණ පෙන්නුම් කිරීමත් සමග, සාර්ව-ආර්ථික තත්ත්වයන් ස්ථායී වීම තුළ සමස්තයක් ලෙස ආර්ථිකයේ ඵලදායිත්වය සහ තරඟකාරීත්වය මත ඇතිකරන අවහිරතාවයන්ට මුහුණ දීම කෙරෙහි ආයතනයේ ප්‍රතිපත්ති අවධානය වඩාත් තියුණු ලෙස යොමු කරන ලදී. 2023 වර්ෂයේ දී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මෙම ප්‍රතිපත්ති සාකච්ඡාවලට අවශ්‍ය අවබෝධයන් සපයා ගැනීම පිණිස ප්‍රධාන අධ්‍යයන කිහිපයක් කෙරෙහි අවධානය යොමු කළේය.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකූ විට, වර්ධනය සඳහා අපනයන පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ. රජය ද්විපාර්ශ්වික සහ කලාපීය වෙළඳ ගිවිසුම් මාලාවක් ආරම්භ කළ විට, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි අඛණ්ඩ පර්යේෂණ මගින් එම ගිවිසුම්වල විභව විශාලත්වය සහ ඒවා විවිධ ක්ෂේත්‍ර පුරා බෙදී යාම තීරණය කිරීම සඳහා පූර්ව බලපෑම් තක්සේරු කිරීම් මත පදනම්ව ඉතාම වැදගත් තියුණු අවබෝධයන් ජනනය කළේ ය. 2024 වර්ෂයේ දී අත්සන් කිරීමට යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමේ වෙළඳ විභවය පරීක්ෂා කර බලන සහ ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වශයෙන් හඳුන්වා දෙන ලද ශ්‍රී ලංකාවේ ආනයන මත පනවන ලද පුළුල් පාලනයන්හි දිරිගැන්වීම් වැරදි ලෙස අර්ථනිරූපණය කිරීම් පරීක්ෂා කර බලන පර්යේෂණ පත්‍රිකා වඩාත් පුළුල් සංවාදයක් සහ ප්‍රචාරණයක් සඳහා ප්‍රකාශයට පත් කරන ලදී. සහභාගී වන සාමාජිකයෙක් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, අදාළ අවවස්ථාවල, ශ්‍රී ලංකාවේ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධයන් 'කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වය' (ජනාධිපති ලේකම් කාර්යාලය) පිළිබඳ විශේෂඥ කණ්ඩායම වෙත ඉදිරිපත් කරන ලදී.

රැකියා සහ ජීවනෝපාය මත ආර්ථික අර්බුදය විසින් ඇතිකරන ලද අහිතකර ප්‍රතිවිපාක සඳහා ප්‍රතිපත්ති ප්‍රතිචාර අවශ්‍ය විය. ප්‍රධාන බදු සහ සහනාධාර ලබා දීමේ වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කරමින්, අසමානතාවය සහ දරිද්‍රතාවය කෙරෙහි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල බලපෑම තක්සේරු කිරීම පිණිස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ක්‍රියාකාරකම් සිදු කරන ලද අතර ම, තිරසාර සංවර්ධන ඉලක්ක සම්බන්ධ අර්ථවත් ප්‍රගතියක් අත්කර ගැනීම පිණිස වාර්ෂික රාජ්‍ය ආයෝජන පරතරය ඇස්තමේන්තු කරන පර්යේෂණ පත්‍රිකාවක් ද ප්‍රකාශයට පත් කළේය. එම ක්‍රියාමාර්ගවලට අමතරව, සමාජ ආරක්ෂණය සඳහා වන රාජ්‍ය වියදම්වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ක්‍රම වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම පිණිස තවත් ගැඹුරු අධ්‍යයනයක් සිදු කරන ලදී. එයට අමතරව, ශ්‍රී ලංකාවේ ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය (මුදල් අමාත්‍යාංශය) සකස් කර නිම කිරීම සඳහා වූ තාක්ෂණික කමිටුවට මෙන්ම සමාජ ආරක්ෂණ අරමුදලක් (කම්කරු අමාත්‍යාංශය) පිහිටුවීම සඳහා වන අනු කමිටුවට ද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහභාගී වීම තුළින් ප්‍රායෝගික ප්‍රතිපත්ති අදහස් ලබා දෙන ලදී.

බදුකරණ සහ මිලකරණ ප්‍රතිපත්ති සෘණාත්මක සෞඛ්‍ය සහ සමාජ බලපෑම් අවම කිරීම සඳහා ඇති පිරිවැය ඵලදායී ක්‍රම වන බව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති තත්ත්වයන් මගින් පෙන්වා දී ඇත. ප්‍රතිපත්ති සංශෝධනවලට අනුබල දීම කෙරෙහි අවධානය යොමු කරමින්, ඵලදායී දුම්කොළ බදුකරණය පිළිබඳව විශ්ලේෂණාත්මක කාර්යයන් අඛණ්ඩව සිදු කර ගෙන යාම සඳහා දුම්කොළ පාලනය පිළිබඳ වැඩසටහන් මෙන්ම, සීනි යොදන ලද පැණි බීම වර්ග වැනි සෞඛ්‍යයට අහිතකර ආහාර පුරුදු අඩු කිරීම අරමුණු කරගත් අධ්‍යයනයන් ද පදනම් කර ගෙන අපි ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ දීර්ඝ කාලීන වැඩසටහන් සකස් කර ඇත්තෙමු. ශ්‍රී ලංකාවේ මධ්‍යසාර බදු ප්‍රතිසංස්කරණ සඳහා සහාය වීම පිණිස ආර්ථික පර්යේෂණ සිදු කිරීම සඳහා අලුතින් වැඩසටහන් දියත් කරන ලදී. තවත් ප්‍රධාන දීර්ඝ කාලීන වැඩසටහනක් මගින් ශ්‍රී ලංකාවේ ඇඟලුම් අපනයන කර්මාන්තය කෙරෙහි අවධානය යොමු කරමින්, සෞඛ්‍ය බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම පිණිස සේවා ස්ථානයේ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා වසංගත ප්‍රතිචාර රීති පද්ධතියක් සැලසුම් කිරීමට සහ නියාමන ප්‍රතිපත්තිවලට අනුබලය දීමට අරමුණු කරයි.

ආර්ථික අර්බුදය ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධනයට ද දැඩි බලපෑමක් එල්ල කළේය. 2023 වර්ෂයේ දී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය නිපුණතා සහ ශ්‍රම බලකාය සංවර්ධනය කිරීමට සහාය වීම සඳහා ප්‍රධාන පර්යේෂණ වැඩසටහන් කිහිපයක් කෙරෙහි අවධානය යොමු කළේය. අධ්‍යාපනය ලබා දීම සඳහා තාක්ෂණය භාවිතා කිරීම ප්‍රාථමික සහ ද්විතීයික මට්ටම්වල දී අධ්‍යාපනයේ සාධනය කෙරෙහි එල්ල කරන බලපෑම සහ ඒවා ක්‍රියාත්මක කිරීමට ඇති බාධක විශ්ලේෂණය කිරීම අප්‍රිකානු, ආසියානු, ලතින් ඇමරිකානු සහ කැරිබියානු රටවල් ආවරණය වන වාර්තා මාලාවක කොටසක් විය. බහුවිධ රටවල් සම්බන්ධ අනෙකුත් අධ්‍යයනයන්හි දී, කෙන්යාව, සෙනගාලය, පිලිපීනය, ශ්‍රී ලංකාව, බ්‍රසීලය සහ පේරු යන රටවල් හයක් පුරා කාන්තාවන්ට ඔබින රැකියාවකට ප්‍රවේශ වීමට ඇති සන්දර්භමය බාධක පිළිබඳ ඇගයීමක් සිදු කෙරෙමින් පවතියි. ශ්‍රම වෙළඳපොළ ප්‍රතිපත්තිවල අනෙකුත් අංශ කෙරෙහි අවධානය යොමු කරමින්, විදේශගතව සිටින තාවකාලික ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අඛණ්ඩ


පාර්යේෂණවල කොටසක් ලෙස, ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයින්ගේ නිපුණතා, අපේක්ෂාවන් සහ නැවත සමාජගතවීමේ අභියෝග හඳුනා ගැනීම සඳහා සැලකිය යුතු ක්‍රියාකාරකම් ප්‍රමාණයක් ඉටු කරන ලද අතර, එම සේවකයින් වෙනුවෙන් ක්‍රියාත්මක ආයතනික සහාය යාන්ත්‍රණ සහ නැවත සමාජගත කිරීමේ වැඩසටහන් ගැඹුරින් විශ්ලේෂණය කරන ලදී. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටුවට සහ ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුවට (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය) සහභාගී වීම අපගේ දැනුම ප්‍රතිපත්ති බවට පරිවර්තනය කිරීමට පහසුකම් සලසයි.

දේශගුණික විපර්යාසවල ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින සහ බහුවිධ බලපෑම් තිරසාරභාවය පිළිබඳ ගැටළු කෙරෙහි පුළුල් පර්යේෂණ අවධානයක් යොමුකිරීමේ අවශ්‍යතාවය ඇති කරයි. 2023 වර්ෂයේ දී, අපගේ අධ්‍යයන මඟින් ගෘහාශ්‍රිත අවදානම කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම සහ ගොවියාගේ අනුවර්තනයවීමේ තීරණ කෙරෙහි බලපාන සාධක, දේශගුණික විපර්යාස සහ සංක්‍රමණය අතර සම්බන්ධය සහ වනාන්තර නැවත ස්ථාපනය කිරීමේ විවිධ වැඩසටහන්වල කාබන් ඩයොක්සයිඩ් අඩු කිරීමේ විභවය පිළිබඳ ආර්ථික විද්‍යාව වැනි විවිධ කරුණු පිළිබඳව විමසා බලන ලදී. දේශගුණ-සුහුරු කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳව වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා අදාළ පර්යේෂණ අධ්‍යයන මෙන්ම ආහාර හානිය අවම කිරීමේ මාර්ග සකස් කිරීම ද 2023 වර්ෂයේ ප්‍රධාන වැඩසටහන් විය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආහාර හා පෝෂණ ආරක්ෂණ කමිටුවේ ප්‍රතිපත්ති සහ නියාමන මැදිහත්වීම් පිළිබඳ විශේෂඥ මණ්ඩලයට (ජනාධිපති ලේකම් කාර්යාලය) සහභාගීවීම පර්යේෂණ සාක්ෂි විකසනය කිරීමේ ප්‍රතිපත්තිය දැනුම්වත් කිරීමේ වැදගත් මාර්ගයකක් සපයා දෙන ලදී.

වඩා පුළුල් ප්‍රසිද්ධ ප්‍රචාරණයක් සඳහා මෙම ගැටළු බොහොමයක් අපගේ ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2023' වාර්තාවෙහි සහ සමානයින් විසින් සමාලෝචිත ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ පත්‍රිකා හතක සාකච්ඡා කර ඇත. මේවා තවත් බොහෝ ප්‍රකාශන අතර, ගෝලීය සංවර්ධන මූල්‍ය වාතාවරණය තුළ ශ්‍රී ලංකාවේ ණය අර්බුදය (පැල්ග්‍රේව් මැක්මිලන්); සංවර්ධනය කෙරෙහි සංක්‍රමණයේ සහ ප්‍රේෂණවල බලපෑම (රූට්ලෙජ්) වැනි ග්‍රන්ථවල පරිච්ඡේද; සීනි යොදා රසගන්වන ලද පාන වර්ග සඳහා බදු පැනවීමේ දේශපාලන ආර්ථිකය (ග්ලෝබල් හෙල්ත් ඇක්ෂන්), කාන්තා ශ්‍රමිකයන් සංක්‍රමණය වීම තහනම් කිරීමේ බලපෑම් (සංක්‍රමණ ප්‍රතිපත්ති පරිචය) සහ කොවිඩ්-19 අතරතුර සංක්‍රමණිකයන්ගේ වැටුප් සොරකම් (ජනවාර්ගික හා සංක්‍රමණ අධ්‍යයන සඟරාව) වැනි සඟරා ලිපි; සහ කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය කෙරෙහි බලපාන සන්දර්භ-විශේෂිත බාධක (දරිද්‍රතාවය සහ ආර්ථික ප්‍රතිපත්ති ජාලය), අධ්‍යාපනය සඳහා තාක්ෂණය යොදා ගැනීමේ වාතාවරණයෙහි විශේෂ ලක්ෂණ සහ අභියෝග (සඳර්න් වොයිස් නෙට්වර්ක්) සහ කාන්තාවන්ට රැකියා සඳහා ඇති ප්‍රවේශය පිළිබඳ විශ්ලේෂණය (දරිද්‍රතාවය සහ ආර්ථික ප්‍රතිපත්ති ජාලය) වැනි මාතෘක පිළිබඳ විවිධ රටවල ක්‍රියාකාරී පත්‍රිකා වැනි සමානයින් විසින් සමාලෝචිත ජාත්‍යන්තර ප්‍රකාශන මඟින් අනුපූරණය වී ඇත.

2023 වර්ෂයේ දී, අපි කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ කේන්ද්‍රය, එක්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් සහ KIVU ඉන්ටර්නැෂනල්, එක්සත් ජනපදයේ වයිටල් ස්ට්‍රැටජීස් සහ ඉලිනොයිස් විශ්වවිද්‍යාලය, සහ ඕස්ට්‍රේලියාවේ ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා වන ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය සහ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ එවැනි තවත් බොහෝ ගෝලීය හවුල්කරුවන් සමග අපගේ ජාත්‍යන්තර නියැළීම සහ උපායමාර්ගික හවුල්කාරිත්ව අවස්ථා පුළුල් කර ගත්තෙමු.

ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති පසුබිම කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම අපගේ අරමුණෙහි ප්‍රමුඛතම අවධානය වේ. මහත් උනන්දුවෙන් සහ කැපවීමෙන් කටයුතු කරන අභ්‍යන්තර පර්යේෂක කණ්ඩායමේ සහ සහායක කාර්ය මණ්ඩලයේ කැපවීම නිසා රටේ ප්‍රමුඛතම ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය ලෙස ස්වකීය කීර්ති නාමය තවදුරටත් තහවුරු කරගනිමින් ඉදිරියට යාමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමත් විය. ඇත්ත වශයෙන්ම, මෙම අභියෝගාත්මක කාලය පුරාවට ප්‍රතිපත්ති සම්පාදනය සහ ශක්තිමත් මූල්‍ය ප්‍රතිඵල සඳහා වැදගත් වන උසස් තත්ත්වයේ, ජාත්‍යන්තරව පිළිගත් පර්යේෂණ සපයා දීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට හැකි වීම ඔවුන්ගේ කැපවීම සහ සහයෝගය පිළිබඳ සාක්ෂියකි. අපගේ පර්යේෂණ ක්‍රියාකාරකම්වල සහ මූල්‍ය කාර්ය සාධනයේ විස්තර සහ අපගේ ජයග්‍රහණ පිටුපස සිටින පුද්ගලයින් පිළිබඳ විස්තර මෙම වාර්තාවේ ඉතිරි කොටසෙහි ඉදිරිපත් කර ඇත. මම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මගේ සහෝදර කාර්ය මණ්ඩලය සහ පාලක මණ්ඩලයේ සභාපතිතුමා සහ පත් කළ සාමාජිකයින් ලබා දුන් සහසයෝගය වෙනුවෙන් එම සියලු දෙනාට ම මාගේ ස්තූතිය පුදකරන අතර, ඉදිරි වර්ෂයේ දී ද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ඵලදායී පර්යේෂණ සිදුකිරීමේ දී ඉදිරියෙන්ම සිටින ආයතනය වන බව සහතික කිරීම මගේ අපේක්ෂාව වේ.



ආචාර්ය දුෂ්නි වීරකෝන්,
විධායක අධ්‍යක්ෂ

අපගේ පර්යේෂණ සහ ප්‍රතිපත්ති නියැළීම් ක්‍රියාකාරකම්වල විෂය පථය

කාලීන ප්‍රතිපත්ති සංවාද පිළිබඳව දැනුම්වත් කිරීම පිණිස අපි සමානයින් වීසන් සමාලෝචිත ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පර්යේෂණ පත්‍රිකා සහ වාර්තා ප්‍රකාශයට පත් කරන්නෙමු.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සාමාජික ආචාර්ය චිරන්දති පතිරාජ ශ්‍රී ලංකාවේ කටුපොල් කර්මාන්තය පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන පර්යේෂකයින් කණ්ඩායමක ප්‍රධානියා ලෙස කටයුතු කළාය: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ අධ්‍යයන මාලාවෙහි පළකරන ලද ආර්ථික විශ්ලේෂණයක්, 2023.





බාහිර සමානයින් විසින් සමාලෝචිත ජාත්‍යන්තර ප්‍රකාශන මඟින් උසස් තත්ත්වයේ පර්යේෂණ සඳහා වන කීර්ති නාමය පවත්වාගනු ලැබේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සාමාජික ආචාර්ය බිලේෂා විරරත්න කාන්තාවන් සංක්‍රමණය වීමේ තහනම ලිහිල් කිරීම: එය ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය විසඳීමට උපකාරී වේද? යන මාතෘකාව යටතේ පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කළාය, 'සංක්‍රමණ ප්‍රතිපත්ති පිළිවෙත', 12(1), 2023.







අපගේ මධ්‍ය කාලීන පර්යේෂණ න්‍යාය පත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අපි ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදාන සඳහා ගෝලීය වශයෙන් තරඟ කරන්නෙමු.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සාමාජික ආචාර්ය අසංක විජේසිංහ කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ කේන්ද්‍රය (IDRC) සමඟ එක්ව ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ සේවිකාවන්ට ඇතිවන අහිතකර සෞඛ්‍ය බලපෑම් අවම කිරීම සඳහා වසංගත ප්‍රතිචාර වැඩිදියුණු කිරීම පිළිබඳ දෑවුරුදු පර්යේෂණ වැඩසටහනක් මෙහෙයවයි.





අපි අපගේ පර්යේෂණ ප්‍රවීණත්වයේ සාධම්බර සාක්ෂියක් ලෙස විවිධ රටවල් සම්බන්ධ ගෝලීය අධ්‍යයනයන්ට නායකත්වය දෙන්නෙමු.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය නිශා අරුණතිලක ශ්‍රී ලංකාව, කෙන්යාව, සෙනගාලය, පිලිපීනය, බ්‍රසීලය සහ පේරු යන රටවල් හයක් පුරා කාන්තාවන් සඳහා ඔබින රැකියා සම්බන්ධ සමාජ, ආර්ථික සහ නීතිමය බාධක පිළිබඳ අධ්‍යයනයක් මෙහෙයවයි.





අපි ප්‍රචාරණය සහ පුළුල් ජාතික පාර්ශ්වකාර සහභාගිත්වය සඳහා සංසදවලට සත්කාරකත්වය සපයා දීම පිණිස අපගේ පර්යේෂණ උපයෝගී කර ගන්නෙමු.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සාමාජික ලක්මිණි ප්‍රනාන්දු ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද 'ඔබින රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය' නැමති ජාතික ප්‍රතිපත්ති සම්මන්ත්‍රණයේදී, ශ්‍රී ලංකාවේ ඔබින රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය: සන්දර්භ-විශේෂිත බාධක ආමන්ත්‍රණය කිරීම නැමති මාතෘකාව යටතේ ලිපියක් ඉදිරිපත් කළාය. සමන් කැලේගම ශ්‍රවණාගාරය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.





අපි අපගේ බ්ලොග් සහ මත වේදිකා හරහා සාක්ෂි මහජන අවධානයට ගෙන එන්නෙමු.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ ආර්ථික විද්‍යාඥ සුනිමලී මදුරාවල රෝග සහ ණය සමඟ සටන් කිරීම: ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය මධ්‍යයෙහි බෝ නොවන රෝග සඳහා මූල්‍යකරණය පිළිබඳ ලිපියක් රචනා කළාය, ටෝකිං ඉකොනොමික්ස්, 2023 අප්‍රේල්.





අපගේ පර්යේෂණ සහ ප්‍රතිපත්ති නියැළීම් ක්‍රියාකාරකම්වල විෂය පථය

අපි ගෝලීය මාධ්‍ය වේදිකා හරහා රාජ්‍ය ප්‍රතිපත්ති සාකච්ඡාවල ශක්තිමත්ව නිරත වන්නෙමු.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි විධායක අධ්‍යක්ෂිකා ආචාර්ය දුෂ්නි වීරකෝන්, කොළඹ ජාතික කෞතුකාගාරයේ දී පවිගත කරන ලද, බී.බී.සී. පුවත් සේවයේ 'ශ්‍රී ලංකාව පිළිබඳ ගෝලීය ප්‍රශ්න: ඉහළ යමින් පවතින ගෝලීය සිවිල් නොසන්සුන්තාවය' පිළිබඳ විද්වත් මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කළාය, 2023 ජනවාරි.





අපගේ දැනුම බෙදා ගැනීම, අපගේ හවුල්කරුවන්ගෙන් ඉගෙන ගැනීම සහ ඒකාබද්ධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා කලාපීය ජාල ගොඩ නගා ගැනීම අපගේ ප්‍රධාන ඉලක්කයක් වේ.

බංගලාදේශයේ ධකා නුවර 'ප්‍රතිපත්ති සංවාද කේන්ද්‍රය (CPD)' විසින් සංවිධානය කරන ලද 14 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුවේ දී මහජන සෞඛ්‍ය සඳහා කලාපීය සහයෝගීතාවය පිළිබඳ සැසියක දී **ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සාමාජික ආචාර්ය ගංගා තිලකරත්න** සියුම් අවබෝධයන් සපයා දුන්නාය, 2023 නොවැම්බර්.





අපි විෂය මූලික සාක්ෂි ගෝලීය අවධානයට ගෙන ඒමට අපේක්ෂා කරන බැවින් අපගේ ව්‍යාප්තවීම කලාපයෙන් ඔබ්බට යයි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සාමාජික ආචාර්ය මනෝජ් තිබ්බොටුවාව, ඝානාවේ ඇක්‍රා නුවර පවතී, ඝානා විශ්වවිද්‍යාලය සහ සංඛ්‍යාන, සමාජීය සහ ආර්ථික පර්යේෂණ ආයතනය (ISSER) විසින් සංවිධානය කරන ලද 'ප්‍රතිපත්ති පර්යේෂණ ධාරිතාව සහ බලපෑම පිළිබඳ ගෝලීය හමුවේදී' 'ප්‍රතිපත්ති සඳහා අනුබලය දීමට පර්යේෂණ ආයතන සතු හැකියාව ශක්තිමත් කිරීම සඳහා වඩාත් සහයෝගීතාවයෙන් යුතු පර්යේෂණ සහ පුහුණු පැවැත්වීමේ වැදගත්කම පිළිබඳව කරුණු ඉදිරිපත් කළේය, 2023 අප්‍රේල්.





ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙහෙයවීම සඳහා අපි අපගේ පර්යේෂණ සොයා ගැනීම් පිළිබඳව රජයේ ආයතන දැනුවත් කරන්නෙමු.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ ආර්ථික විද්‍යාඥ ප්‍රියංකා ජයවර්ධන 'ශ්‍රී ලංකාවේ RESET ඇල්කොහොල් වැඩසටහනේ' අධ්‍යයනය මගින් සොයාගත් කරුණු දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA), සුරාබදු දෙපාර්තමේන්තුව, සහ මත්පැන් සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ඇඩික්) වෙත ඉදිරිපත් කරයි, දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ කාර්යාලය, 2023 දෙසැම්බර්.





අපගේ දැනුම ප්‍රතිපත්ති බවට පරිවර්තනය කිරීමේදී අපි ප්‍රාදේශීය සහ ජාතික මට්ටම් වලින් හැකි තාක් වැඩි පාර්ශ්වකරුවන් සංඛ්‍යාවක් සමග කටයුතු කරන්නෙමු.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ ආර්ථිකවිද්‍යාඥ ධිලනි හිරිමුතුගොඩගේ නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (කුරුණෑගල) කාර්යාලයේ නිලධාරීන් සඳහා 'ශ්‍රී ලංකාවේ භූගෝලීය දර්ශක පද්ධතිය' පිළිබඳ පුහුණු ඉදිරිපත් කිරීමක් සිදු කළ අතර, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දී සුළු අපනයන බෝග සඳහා භූගෝලීය දර්ශක උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමේ ජාතික කමිටුවට සහභාගී වූවාය.





උසස් තත්ත්වයේ පර්යේෂණ සපයා දීම පිණිස අපි අපගේ කනිෂ්ඨ පර්යේෂකයින් නවතම පර්යේෂණ ක්‍රම්වලට නිරාවරණය කරමින් ඔවුන්ට උපදේශනය සපයා දීම සහ ඔවුන්ව පුහුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරන්නෙමු.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ ආර්ථික විද්‍යාඥ ආචාර්ය පුලස්ති අමරසිංහ, අඩු නිපුණතා සහිත කම්කරුවන් සඳහා ශ්‍රම වෙළඳපල ප්‍රතිඵලවල ස්ත්‍රී-පුරුෂ සමාජභාව අසමානතාවයන්හි මූලාශ්‍ර: ඉන්දුනීසියාවේ සාක්ෂි නැමති මාතෘකාව යටතේ අභ්‍යන්තර සම්මන්ත්‍රණයක් ඉදිරිපත් කළේය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, 2023 ඔක්තෝබර්.







පර්යේෂණ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික ප්‍රතිපත්ති පසුබිම තුළ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි කාර්ය භාරය වන්නේ ප්‍රතිපත්ති තීරණ සඳහා වැදගත් වන ප්‍රබල විශ්ලේෂණාත්මක සාක්ෂි සපයා දීම සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට විවිධ ප්‍රතිපත්ති විකල්පවල ඇඟවීම් අවබෝධ කර ගැනීම සඳහා උපකාර කිරීමයි. අනෙකුත් ගැටළු අතර, ප්‍රතිපත්ති අනනුකූලතාවයන්, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිකම, සෞඛ්‍ය හා අධ්‍යාපනය අංශවල දුර්වල රාජ්‍ය සේවා සැපයීම, කුසලතා හිඟය, ඉහළ යමින් පවතින බලශක්ති පිරිවැය සහ මූල්‍ය හා ඉඩම් වෙත ප්‍රවේශ වීමේ බාධක වැනි වර්ධනය කෙරෙහි බලපාන ඉතාමත් තීරණාත්මක අවහිරතා පිළිබඳ දැඩි විශ්ලේෂණයක් සිදු කිරීම අවශ්‍ය වේ. ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණ ඇතිව, ආදායමෙහි සහ ධනයෙහි නිරන්තර අසමානතාවයන්, පරිසර හානිය සහ ස්වභාවික සම්පත් හායනය වීම, වැඩිහිටියන්ගේ සහ අනෙකුත් අවදානමට ලක්විය හැකි ජනගහනයේ යහපැවැත්ම යනාදියට අදාළව ප්‍රධාන ආර්ථික සංකල්ප, ආකෘති සහ දර්ශක අඛණ්ඩව සමාලෝචනය කළ යුතු වේ.

ආයතනයේ පර්යේෂණ න්‍යාය පත්‍රය රටේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව මෙම ගැටලු සහ අනෙකුත් ගැටලු ආමන්ත්‍රණය කරයි. ආයතනයේ ක්‍රියාකාරම් වැඩසටහන මගින් විවිධ පර්යේෂණ මාතෘකා පිළිබඳ ගවේෂණය කරන මූලික තේමා ක්ෂේත්‍ර හයක් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. එම තේමා ක්ෂේත්‍ර හයෙන් එක් එක් තේමා ක්ෂේත්‍රය යටතේ 2023 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ අප විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත සාරාංශ කර ඇත.

සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරඟකාරීත්වය

ක්‍රමයෙන් වර්ධනය වූ අර්බුදයකට පරිපූර්ණ විසඳුමක් සෙවීම සඳහා ශක්තිමත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති අනුගත කරගැනීම මගින් විශ්වාසනීයත්වය තහවුරු කිරීම දුර්වල වූ ආර්ථිකයෙහි ප්‍රධානතම ප්‍රමුඛතාවයන් ලෙස පවතියි. දශක ගණනාවක් තිස්සේ පැවති ආර්ථික අවකළමනාකරණය සහ වසංගතය නිසා ඇතිවූ ආර්ථික කඩාවැටීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ පවතින ඇණහිටුණු උද්ධමනය ආමන්ත්‍රණය කිරීම සඳහා වෙළඳ සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ඇතුළු මූල්‍ය මෙවලම් කට්ටලය වැඩිදියුණු කිරීම අත්‍යාවශ්‍ය වේ. රාජ්‍ය අංශය (රාජ්‍ය ආයෝජන, රජය සතු ව්‍යවසායන්) විසින් භාවිතා කරනු ලබන සම්පත්වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, ආර්ථික දිරිගැන්වීම් වැඩිදියුණු කිරීම (වෙළඳ ප්‍රතිසංස්කරණ, කෘෂිකර්මයේ මිල පද්ධති, විදුලිය වැනි රාජ්‍ය උපයෝගිතා), සහ ආයතනික කාර්යක්ෂමතාවය (දේශපාලන, බදු පරිපාලනය) වැඩි දියුණු කිරීම අරමුණු කරගත් ආර්ථික ප්‍රතිපත්ති, තිරසාර වර්ධන ප්‍රයත්නයක ප්‍රධාන ධාවකයන් වේ. සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරඟකාරීත්වය යන තේමා ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයනයන මගින් 2023 වර්ෂයේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී:

සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි වාර්ෂික ප්‍රමුඛතම ප්‍රකාශනය වන **ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2023** නැමති වාර්තාව මගින් දේශීය හා බාහිර ප්‍රතිපත්ති තත්ත්වයන් හමුවේ වර්ධනය සහ සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ආර්ථික දැක්ම විමසා බලන ලදී. රට ස්ථාවරත්වයට පත්වීමේ සහ යථා තත්ත්වයට පත්වීමේ ප්‍රයත්නවල මන්දගාමී ප්‍රගතියක් අත්කර ගනිමින් සිටින බැවින්, එම වාර්තාව මගින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති, වෙළඳාම, ශ්‍රම සහ ඉඩම් වෙළඳපොළ, අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා මූල්‍යකරණය, සංක්‍රමණය, සමාජ ආරක්ෂණය, බලශක්ති අංශයේ තිරසාර සංවර්ධනය වැනි ප්‍රධාන ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති තේරීම් සහ විවාද කෙරෙහි අවධානය යොමු කර ඇත. එම වාර්තාව ඔක්තෝබර් මාසයේ දී නිකුත් කරන ලදී,

විධායක මත සමීක්ෂණය: ගෝලීය තරඟකාරිත්ව වාර්තාව සම්පාදනය කිරීමේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි අඛණ්ඩව පවත්වාගෙන යන සහයෝගීත්වයක් මත, ලෝක ආර්ථික සංසදය විසින් සම්පාදනය කරන ලද වාර්ෂික ප්‍රකාශනයක් මගින් රටක ආර්ථික ඵලදායිතාවයට සහ කාර්යක්ෂමතාවයට බලපාන ආයතන, ප්‍රතිපත්ති, සහ අනෙකුත් සාර්ව හා ක්ෂුද්‍ර ආර්ථික මූලධර්ම පිළිබඳ තක්සේරුවක් සිදු කරන ලදී. 2012 වර්ෂයේ සිට, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය එම දර්ශකය සකස් කිරීම සඳහා දායකත්වය ලබා දීමට ලෝක ආර්ථික සංසදය සමග හවුල්කාරිත්වයෙන් කටයුතු කර ඇත.

2023 වර්ෂයේ දී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මෙම තේමාව යටතේ තවත් අධ්‍යයන කිහිපයක් සම්පූර්ණ කළේය. **තිරසාර සංවර්ධන ඉලක්ක මූල්‍යකරණ හිඳැස පියවා ගැනීම සඳහා රාජ්‍ය ආයෝජන** සිදු කිරීම පිළිබඳ අධ්‍යයනයක් මගින් තිරසාර සංවර්ධන ඉලක්කවල අර්ථවත් ප්‍රගතියක් සඳහා වාර්ෂික ආයෝජන අවශ්‍යතාවය ඇස්තමේන්තු කරන ලද අතර, රාජ්‍ය ආයෝජන භාවිතයෙහි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මාලාවක් යෝජනා කරන ලදී. එය අරමුදල් රැස්කිරීමේ දී, තිරසාර සංවර්ධන අංශ වෙත ආයෝජන යොමු කිරීමේදී සහ තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රවර්ධනය කිරීමෙහි ධනාත්මක බලපෑම උපරිම කිරීමේදී ඇතිවන අභියෝග ජයගැනීම සඳහා ප්‍රතිපත්ති මගපෙන්වීම් සපයා දුන්නේ ය. ලෝක බැංකුව සමග හවුල්කාරිත්වයෙන් යුතුව, ටියුලේන් විශ්වවිද්‍යාලයේ 'Commitment to Equity Institute' නැමති ආයතනය විසින් සකස් කරන ලද ක්‍රමවේදයක් භාවිතා කරමින්, **ශ්‍රී ලංකාවේ අසමානාත්මතාවය සහ දරිද්‍රතාවය කෙරෙහි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ බලපෑම ඇස්තමේන්තු කිරීම** පිළිබඳ තවත් අධ්‍යයනයක් මගින්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන බදු සහ සහනාධාර ලබා දීමේ වැඩසටහන් සිදුවීමේ ප්‍රමාණය තක්සේරු කර, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2019 වර්ෂයේ ගෘහස්ථ ආදායම් සහ වියදම් සමීක්ෂණයෙහි දත්ත පදනම් කර ගෙන මෙරට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට ඒවා බලපා ඇති ආකාරය පිළිබඳව විමර්ශනය කරන ලදී.

ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට අවශ්‍ය තොරතුරු සපයා දීම පිණිස, ශ්‍රී ලංකාවේ දුම්කොළ ජාවාරම පිළිබඳ පරිපූර්ණ අවබෝධයක් ලබා දීම සහ ජාවාරම නියාමනය කිරීමේ ඵලදායී ක්‍රම හඳුනා ගැනීම අරමුණු කරගෙන, එක්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් / එක්සත් රාජධානියේ KIVU ඉන්ටර්නැෂනල් සමග එක්ව සිදු කෙරෙන අඛණ්ඩ දිගුකාලීන වැඩසටහනක් යටතේ **ශ්‍රී ලංකාවේ දුම්කොළ ජාවාරම: විෂය පථය හඳුනා ගැනීමේ අධ්‍යයනයක්** නැමති අධ්‍යයනය සිදු කරනු ලැබේ.

වෙළඳ සහ කලාපීය ඒකාබද්ධතාවය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ලෝක බැංකුව සමග එක්ව, කලාපීය ඒකාබද්ධතාවය දකුණු ආසියානු කලාපයේ පිරිමින් සහ කාන්තාවන් කෙරෙහි ඇති කරන විශේෂක බලපෑම විමසා බැලීම සඳහා **දකුණු ආසියාවේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අන්තර්කරණය වූ කලාපීය ඒකාබද්ධතාවය: ආනුභවික ඇගයීමක්** නැමති අධ්‍යයනයක් නිම කළේය. කලාපීය ඒකාබද්ධතාවයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාව මානයන් ගවේෂණය කිරීම මගින්, කලාපයේ සියලුම පුද්ගලයන් අතර ප්‍රතිලාභ සමානව බෙදී යන බව වඩා හොඳින් සහතික කර ගැනීම සඳහා එය ප්‍රතිපත්ති සම්පාදකයින්ට උපකාරී වේ.

චීනය, තායිලන්තය, ඉන්දියාව, ජපානය සහ සිංගප්පූරුව සමග ශ්‍රී ලංකාව ඇති කරගැනීමට නියමිත වරණීය වෙළඳ ගිවිසුම්වල බලපෑම පූර්වයෙන් තක්සේරු කිරීම අරමුණු කරගනිමින්, සහ විවිධ රටවල් සමග වරණීය වෙළඳ ගිවිසුම්වල ශක්‍යතාවය මැනීම සඳහා දර්ශකයක් නිර්මාණය කිරීම පිණිස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අරමුදල් සැපයීම යටතේ, **ශ්‍රී ලංකාව සහ තෝරාගත් රටවල් අතර වරණීය වෙළඳ ගිවිසුම් පිළිබඳ ප්‍රාක්-සිද්ධික ආර්ථික ඇගයීම** නැමති විශ්ලේෂණය ආයතනයේ දැනට සිදු කෙරෙමින් පවතින අනෙකුත් අධ්‍යයනවලට ඇතුළත් වේ. මෙයට අමතරව, ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට සිදුකරන අපනයන සඳහා GSP+ පහසුකම අහිමිවීමෙන්

ඇතිවිය හැකි බලපෑම පූර්වයෙන් විශ්ලේෂණය කිරීම පිණිස, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අරමුදල් සපයනු ලබන, "ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට සිදු කරන අපනයනය සඳහා Generalised Scheme of Preferences Plus (GSP+) **පහසුකම ඉවත් කර ගැනීමෙන් ඇතිවිය හැකි බලපෑම** පිළිබඳ ඇගයීම් සිදුකරන ලදී. එයට අමතරව, බහුවිධ රටවල් සම්බන්ධ දත්ත කට්ටලයක් භාවිතා කරමින්, අපනයන සහ ගෝලීය අගය දාම සහභාගිත්වය මත GSP වෙළඳ වැඩපිළිවෙළෙහි බලපෑම තක්සේරු කිරීම පිණිස පශ්චාත්-සිද්ධික තක්සේරුවක් සිදු කරනු ලැබේ.

ආයෝජන සහ මූල්‍යය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය "පරිත්‍යාගශීලීත්වය සහ සමාජය පිළිබඳ ආසියානු මධ්‍යස්ථානය" විසින් පවත්වනු ලබන **"යහපත කිරීමේ දර්ශකය 2024"** සඳහා දත්ත රැස්කිරීමට අරමුණු කරයි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමග එක්ව සිදු කරනු ලබන මෙම විශ්ලේෂණය මගින් රට තුළ දේශීය පරිත්‍යාගශීලිත්වය මෙහෙයවනු ලබන නියමයන්, බදු ප්‍රතිපත්ති, ප්‍රසම්පාදන සහ පාරිසරික සාධක කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.


කර්මාන්ත සහ ව්‍යවසායකත්වය


ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ප්‍රංශ කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානය සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය **"ශ්‍රී ලංකා තේ සඳහා භූගෝලීය දැක්වීම** (Geographical Indication) **ලියාපදිංචිය කඩිනම් කිරීම සඳහා වන සිතියම්කරණ අධ්‍යයනය - අදියර I සහ II"** පිළිබඳ වැඩ සටහනක් නිම කරන ලදී. එමගින් ඵලදායී භූගෝලීය දැක්වීම් පද්ධතියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකා තේ අගය දාමය පුරා ඇති සුවිශේෂී පරිචයන් සහ පද්ධතික අවහිරතා සිතියම්ගත කරන ලදී. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරනු ලබන අතර, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ප්‍රංශ කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය විසින් එය ක්‍රියාත්මක කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ කෘෂි භෝග සඳහා භූගෝලීය දැක්වීමේ ක්‍රමය (Geographical Indication) හඳුන්වා දීම පිණිස, තෝරාගත් නියමු ව්‍යාපෘති දෙකක (කළු ගම්මිරිස් සහ අන්නාසි) භූගෝලීය දර්ශක සඳහා ස්වජාතීය ලියාපදිංචිය පදනම් කරගත් ජාතික පද්ධතියක් ස්ථාපනය කිරීම පිණිස ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමග එක්ව **ජාතික අගය දාම සංවර්ධනය, සොයාගැනීම සහ අලෙවිකරණය** පිළිබඳ අනුපූරක අධ්‍යයනයක් සිදුකර නිම කරන ලදී.


■ ප්‍රකාශන: වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත සහ ලිපි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි පුළුල් පරාසයක ප්‍රකාශන සහ ප්‍රකාශන වේදිකා ඔස්සේ කාලීන ගැටළු පිළිබඳ පර්යේෂණ නිමැවුම් ප්‍රචාරණය කරයි.













- **ආර්ථික හා දේශපාලන අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ශ්‍රී ලංකාව ගමන් කළ යුතු දුෂ්කර මාවත,** දුෂ්නි වීරකෝන්, නැගෙනහිර ආසියානු සංසදය, ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය, 2023 ජනවාරි.
- **ශ්‍රී ලංකාවේ කටුපොල් කර්මාන්තය: ආර්ථික විශ්ලේෂණයක්,** චිරන්දති පතිරාජ, රුවන් සමරවීර, හිරුණි ප්‍රනාන්දු සහ ජාන් බෝගොඩගේ, කාර්මිකකරණ පර්යේෂණ ප්‍රකාශන මාලා අංක12, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2023 ජුනි.
- **ශ්‍රී ලංකාවේ ආනයන පාලනයන්: දේශපාලන මනාපය සහ දිරිගැන්වීමේ විකෘති කිරීම්,** අසංක විජේසිංහ, නිලුපුලී රත්නායක සහ චතුර්ධිකා යෝගරාජා, ජාත්‍යන්තර ආර්ථිකවිද්‍යා ප්‍රකාශන මාලා අංක 15, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2023 ජූලි.
- **වෙළඳ විභවය අනාවරණය කිරීම: ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ පූර්ව කාලික විශ්ලේෂණයක්,** අසංක විජේසිංහ සහ නිලුපුලී රත්නායක, ජාත්‍යන්තර ආර්ථිකවිද්‍යා ප්‍රකාශන මාලා අංක 16, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2023 සැප්තැම්බර්.
- මයිකල් ට්‍රයිබ් සහ ජෝර්ජ් කරාච් (සංස්කරණය), ගෝලීය නිෂ්පාදන, ව්‍යාපාර සහ මූල්‍යකරණයේ දේශපාලන ආර්ථිකය, පැල්ග්‍රේව් මැක්මිලන්, චික්සත් රාජධානිය, 2023, කෘතියෙහි **සංවර්ධන මූල්‍යකරණයේ නූ දර්ශන මාරු කිරීම: නව ණය උගුලක අනතුරු ඇඟවීමේ කතාව,** දුෂ්නි වීරකෝන්,
- **අනන්‍යතාවය: ගෞරවය සඳහා ඇති ඉල්ලුම සහ ප්‍රතිවිරෝධ දේශපාලනය,** අසංක විජේසිංහ, ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සඟරාව, 10(1), පි.139-145.
- **ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2023,** ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.
- **තිරසාර සංවර්ධන ඉලක්ක මූල්‍යකරණ හිඳැස පියවීම සඳහා රාජ්‍ය ආයෝජන: ශ්‍රී ලාංකීය දෘෂ්ටිකෝණය,** ලක්මිණී ප්‍රනාන්දු, කාලීන පත්‍රිකා ප්‍රකාශන මාලා අංක 74, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2023 නොවැම්බර් 2023 ඔක්තෝබර්.

■ ශ්‍රී ලංකා රජයේ කමිටු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයට දායක වෙමින්, රජයේ ප්‍රතිපත්ති කමිටුවලට ආරාධිත සහභාගීත්වය ලබා දීම හරහා ජාතික ප්‍රතිපත්ති ගැටලුවල දී සහාය දීම සඳහා සහ එම ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා ස්වකීය පර්යේෂණ සාක්ෂි භාවිතා කරයි. 2023 වර්ෂයේ දී, පහත සඳහන් කමිටුවලට සහභාගීවීම හරහා යෙදවුම් සපයා දෙන ලදී:

- සංඛ්‍යාලේඛන සකස් කිරීම සඳහා වන ශ්‍රී ලංකා උපාය මාර්ගය පිළිබඳ මෙහෙයුම් කමිටුව, මුදල් අමාත්‍යාංශය.
- ජාතික ඵලදායිතා කොමිෂන් සභාව පිළිබඳ විශේෂඥ කමිටුව, ජනාධිපති ලේකම් කාර්යාලය.
- කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වය පිළිබඳ විශේෂඥ කණ්ඩායම, ජනාධිපති ලේකම් කාර්යාලය.
- ශ්‍රී ලංකාව සඳහා සෞඛ්‍ය මූල්‍යකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා පාලනය, වගවීම සහ සම්පත් සෙවීම පිළිබඳ විශේෂඥ කණ්ඩායම, සෞඛ්‍ය අමාත්‍යාංශය.
- ශ්‍රී ලංකාව සඳහා කෘතිම බුද්ධිය සම්බන්ධ උපාය මාර්ගයක් සකස් කිරීමේ කමිටුව 2023-2028, ජනාධිපති ලේකම් කාර්යාලය.
- නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය සඳහා පර්යේෂණ කුටිය, ජනාධිපති ලේකම් කාර්යාලය.
- ජාතික ඵලදායිතා කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම මෙහෙයවීම සඳහා වන ක්‍රියාකාරී කණ්ඩායම, ජනාධිපති ලේකම් කාර්යාලය.
- ජාතික ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ස්වාධීන ආයතනයක් නිර්මාණය කිරීම සඳහා වන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටුව, ජනාධිපති ලේකම් කාර්යාලය / අග්‍රාමාත්‍ය කාර්යාලය.
- ආර්ථික ස්ථායීකරණය, ප්‍රතිසාධනය සහ වර්ධනය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ කමිටුව, ජනාධිපති ලේකම් කාර්යාලය.
- රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.
- කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම අධීක්ෂණය කිරීම සඳහා වන මෙහෙයුම් කමිටුව. කර්මාන්ත හා සැපයුම් දාම කළමනාකරණ අමාත්‍යාංශය,
- පර්යේෂණ අධීක්ෂණ කමිටුව, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය.
- කර්මාන්ත සංවර්ධන ජාතික ප්‍රතිපත්තිය සැකසීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වන මෙහෙයුම් කමිටුව, කර්මාන්ත අමාත්‍යාංශය.

■ පර්යේෂණ ඉදිරිපත් කිරීම්/සාකච්ඡා

දේශීයව සහ ජාත්‍යන්තරව විවිධ සැසි සහ සංසද වලදී කථිකයා, සාකච්ඡාකරු, විද්වත් මණ්ඩල සාමාජික සහ උපදේශක යන භූමිකා ඉටු කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ප්‍රතිපත්ති නියැළීම් සහ සාකච්ඡා සඳහා පර්යේෂණ පදනම් කරගත් යෙදවුම් සපයා දෙයි.

- බී.බී.සී. ගෝලීය ප්‍රශ්න, **ශ්‍රී ලංකාව: ඉහළ යමින් පවතින ගෝලීය සිවිල් නොසන්සුන්තාව?,** නැමති වැඩසටහනේ විද්වත් මණ්ඩල සාමාජික, කොළඹ ජාතික කෞතුකාගාරය, ජනවාරි 12 (දුෂ්නි වීරකෝන්).



- සමාජ හා ආර්ථික ප්‍රගතිය සඳහා වන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද 'ආසියාවේ ඉන්දියාව: වඩාත් ගැඹුරු නියැළීම්' යන මාතෘකාය යටතේ පැවති සම්මන්ත්‍රණයේ දී '**ආසියා පැසිෆික් කලාපයේ වෙළඳ ඒකාබද්ධතාවය සහ ගෝලීය අගය දාම**' පිළිබඳ සැසියක සාකච්ඡාකරු වශයෙන් කටයුතු කිරීම, මාර්තු 3 - 5 (දුෂ්නි වීරකෝන්).
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සුළු අපනයන බෝග වැවිලි අංශය විසින් සංවිධානය කරන ලද, **ශ්‍රී ලංකාවේ තුගෝලීය දර්ශක පද්ධතිය** පිළිබඳ ඉදිරිපත් කිරීම, රත්නපුර නව මහජන පුස්තකාල ශ්‍රවණාගාරය, මාර්තු 17 (ඩිලානි හිරිමුතුගොඩගේ).
- සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සංවිධානය කරන ලද, 'සෞඛ්‍යය මූල්‍යකරණය පිළිබඳ ගෝලීය අත්දැකීම් සහ යහ පරිචයන් සහ ශ්‍රී ලංකාවට ඒවා අදාළ කරගත හැකි බව' යන මාතෘකාව යටතේ පැවති සම්මන්ත්‍රණයේදී **ශ්‍රී ලංකාව සඳහා සෞඛ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ විකල්ප පිළිබඳ ඉහළ මට්ටමේ උපදේශන සැසියේ** විද්වත් මණ්ඩල සාමාජික, කිංස්බරි හෝටලය, මාර්තු 27 (දුෂ්නි වීරකෝන්).



- ආසියා පදනම විසින් සංවිධානය කරන ලද, **ඒකාබද්ධ දකුණු ආසියාවක් කරා: වෙළඳාමේදී කාන්තාවන් සඳහා සවිබලගන්වන පරිසරයන්,** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික, මාර්තු 28, ගෝල් ෆේස් හෝටලය (චායා දිසානායක).

- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සුළු අපනයන භෝග වැවිලි සංවර්ධන අංශය සහ විසින් සංවිධානය කරන ලද **'ශ්‍රී ලංකාවේ රන් අන්නාසි සඳහා තුගෝලීය දර්ශක සහතිකකරණය'** නැමති සාකච්ඡාවේ දී සාකච්ඡාකරුවෙක් ලෙස සහභාගීවීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ, මැයි 18 (ඩිලානි හිරිමුතුගොඩගේ).

- අන්තර්ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද, 'ගෝලීය ආහාර ප්‍රතිපත්තිය 2023 වාර්තාව: ආහාර අර්බුද ප්‍රතිචාර පිළිබඳ නැවත සිතා බැලීම' නැමති වාර්තාව දකුණු ආසියාවේ දියත් කරන ලද අවස්ථාවේ **ස්ත්‍රී-පුරුෂ සමාජභාවය: දුර්වල සහ ගැටුම් වාතාවරණයන් තුළ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම** පිළිබඳ සැසිය මෙහෙයවීම, තකත්මන්ඩු, නේපාලය, ජූනි 19 - 21. (දුෂ්නි වීරකෝන්)




- **ශ්‍රී ලංකාවේ ආනයන පාලනයන්: දේශපාලන මනාප සහ දිරිගැන්වීම් විකෘති කිරීම්** නැමති වාර්තාව නිකුත් කිරීම සහිටුහන් කිරීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන වැඩසටහනේ දී එම මාතෘකාව යටතේ සිදු කළ ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, ජූලි 11 (අසංක විජේසිංහ).

- ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපායික අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද, 'වෙනස් වෙමින් පවතින ගෝලීය ගතිකයන්: ශ්‍රී ලංකාව සඳහා වන ගම්‍යමානයන්' පිළිබඳ සමාරම්භක ලක්ෂ්මන් කදිරගාමර් ආයතන විදේශ ප්‍රතිපත්ති සංසදයේ දී **ගෝලීය ආර්ථික තූ දර්ශනය සහ ශ්‍රී ලංකාව කෙරෙහි එයින් ඇති විය හැකි බලපෑම්** පිළිබඳ කථිකයෙක් ලෙස කටයුතු කිරීම, ලයිට්හවුස් ශ්‍රවණාගාරය, අගෝස්තු 9 (දුෂ්නි වීරකෝන්).

- **ණය ආපදාව තුළ නැගී එන වෙළඳපොළ, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වන විකල්ප සොයා බැලීම,** පිළිබඳ **විල්ටන් පාර්ක් සමුළුවේ දී ශ්‍රී ලංකාව පිළිබඳ සිද්ධි අධ්‍යයනය ඉදිරිපත් කිරීම,** විල්ටන් පාර්ක්, චික්සත් රාජධානිය, සැප්තැම්බර් 12 - 16, (දුෂ්නි වීරකෝන්)

- ලෝක බැංකුවේ දකුණු ආසියානු සංවර්ධන යාවත්කාලීන කිරීම: දකුණු ආසියාවේ වඩා වේගවත්, වඩා පිරිසිදු වර්ධනයක් කරා නැමති මාර්ගගත වැඩසටහනෙහි විද්වත් මණ්ඩල සාමාජික, ඔක්තෝබර් 3 (දුෂ්නි වීරකෝන්).

- ආසියා සහ පැසිෆික් කලාප සඳහා වන චික්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසමෙහි දකුණු සහ නිරිතදිග ආසියානු උප-කලාප කාර්යාලය විසින් සංවිධානය කරන ලද, 'තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ හත්වන දකුණු සහ නිරිතදිග ආසියානු සංසදයේ' **තිරසාර සංවර්ධන ඉලක්ක සමාලෝචනය පිළිබඳ දළ විශ්ලේෂණය** නැමති මාතෘකාව යටතේ පැවති සාකච්ඡාවක මුලසුන දැරීම, කත්මන්ඩු, නේපාලය, ඔක්තෝබර් 10-12 (දුෂ්නි වීරකෝන්).





- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද, 'පෝෂණ ප්‍රතිපත්ති සහ මහජන සෞඛ්‍ය' පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා **වෙළඳ ප්‍රතිපත්ති සහ ගෘහස්ථ පෝෂණය** පිළිබඳ ආරාධිත දේශනය, මාගර්ගත, ඔක්තෝබර් 21 (අසංක විජේසිංහ).

- යුනෙස්කෝ සංවිධානයේ නවදිල්ලියේ කාර්යාලය සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද, 'තිරසාර සංවර්ධනය සඳහා නිර්මාණශීලිත්වය උපයෝගී කර ගැනීම: **ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා නිර්මාණාත්මක කර්මාන්තය ඇගයීම' පිළිබඳ හඳුන්වාදීමේ වැඩමුළුවේ දී ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක සහ සංස්කෘතික කර්මාන්ත: වර්තමාන තත්ත්වය** පිළිබඳ ඉදිරිපත් කිරීම, සිනමන් ග්‍රෑන්ඩ්, කොළඹ, ඔක්තෝබර් 23 (ඩිලානි හිරිමුතුගොඩගේ).

- චීන සමාජවිද්‍යා විද්‍යාපීඨයේ ජාත්‍යන්තර උපාය මාර්ග පිළිබඳ ජාතික ආයතනය විසින් සංවිධානය කරන ලද 'උසස් තත්ත්වයේ චක් තීරයක්-චක් මාවතක් සහයෝගීතාවය: ජයග්‍රහණ සහ අපේක්ෂාවන්' පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ දී **චක් තීරයක් - චක් මාවතක් මෘදු සම්බන්ධතාවය: ශ්‍රී ලංකාවෙන් උගත හැකි පාඩම්** පිළිබඳ ඉදිරිපත් කිරීම, බීජිං, චීනය, ඔක්තෝබර් 28 (දුෂ්නි වීරකෝන්)

- චික්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ Citra Lab විසින් සංවිධානය කරන ලද, **ආර්ථිකයෙහි තත්ත්වය සහ දැනට සිදු කෙරෙමින් පවතින ප්‍රතිසංස්කරණ** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික, අහුන්ගල්ල, ඔක්තෝබර් 30,(අසංක විජේසිංහ).

- බංග්ලාදේශයේ ප්‍රතිපත්ති සංවාද කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද, '14 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුව (SAES XIV) 'නව සන්දර්භය තුළ දකුණු ආසියානු කලාපීය සහයෝගීතාවය නැවත සකස් කිරීම: ජාතික සහ ගෝලීය මානයන්' නැමති සමුළුවේ සමාරම්භක සැසියේ දී අදහස් දැක්වීම් සහ **'බහු-මාදිලි ප්‍රවාහනය: දේශසීමාන්තර කාර්ය සම්පාදන'** පිළිබඳ සැසියක මුලසුන දැරීම, ධකා, බංග්ලාදේශය, නොවැම්බර් 4-5 (දුෂ්නි වීරකෝන්).

- චික්සත් ජනපද විදේශ සේවා ආයතනයේ දකුණු සහ මධ්‍යම ආසියානු කලාපීය අධ්‍යයන වැඩසටහන සඳහා **ශ්‍රී ලංකාවේ ආර්ථිකය, යටිතල පහසුකම් සහ බලශක්තිය** පිළිබඳ ආරාධිත දේශනය, මාර්ගගත, නොවැම්බර් 8 (අසංක විජේසිංහ).



- කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය විසින් සංවිධානය කරන ලද 'වාර්ෂික පර්යේෂණ සමුළුව: අගය නිර්මාණය කිරීම සඳහා වූ පර්යේෂණ බහුවිෂයයික පර්යේෂණ තුළින් විශිෂ්ඨත්වය තිරසාරව පවත්වාගෙන යයි' නැමති සමුළුවේ **පර්යේෂණ ප්‍රතිපත්ති සංවාදයක** විද්වත් මණ්ඩල සාමාජික, නොවැම්බර් 24, (දුෂ්නි වීරකෝන්)



- නවදිල්ලියේ Carnegie India විසින් සංවිධානය කරන ලද, 'ගෝලීය තාක්ෂණ සමුළුවේදී' **ඩිජිටල් පොදු යටිතල පහසුකම් සඳහා ගෝලීය න්‍යාය පත්‍රය** පිළිබඳ සැසියක දී විද්වත් මණ්ඩල සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම, නවදිල්ලිය, දෙසැම්බර් 4-6, (දුෂ්නි වීරකෝන්)



- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ, නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (කුරුණෑගල) කාර්යාලයේ නිලධාරීන් සඳහා **ශ්‍රී ලංකාවේ භූගෝලීය දර්ශක** පද්ධතිය පිළිබඳ ඉදිරිපත් කිරීම සහ පුහුණු වැඩසටහන, කුරුණෑගල, දෙසැම්බර් 5 (ඩිලානි හිරිමුතුගොඩගේ)

- ඉන්දියාවේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වන පර්යේෂණ සහ තොරතුරු පද්ධතිය විසින් සංවිධානය කරන ලද, **'දකුණු ආසියානු ඒකාබද්ධතාවය: ප්‍රවණතා සහ ඉදිරි මාවත'** නැමති සම්මන්ත්‍රණයේ දී, **කෘෂිකර්ම අගය දාම පිළිබඳ දකුණු ආසියා ප්‍රතිපත්ති සංසද සැසිය** පිළිබඳ සැසිවාරයේ විද්වත් මණ්ඩල සාමාජික, මාර්ගගත, දෙසැම්බර් 10 (අසංක විජේසිංහ).

- පකිස්ථානයේ තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති ආයතනය විසින් සංවිධානය කරන ලද **වෙළඳාමේ කාන්තාවෝ: දකුණු ආසියාතික දෘෂ්ටිකෝණය** පිළිබඳ වෙබ්සම්මන්ත්‍රණයේ දී සාකච්ඡාකරුවෙක් ලෙස සහභාගිවීම, මාර්ගගත, දෙසැම්බර් 13 (අසංක විජේසිංහ)

■ ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය (TE Blog)

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි 'ටෝකිං ඉකොනොමික්ස්' බ්ලොග් අඩවිය ආයතනයේ නවතම සාක්ෂි පදනම් කරගත් සොයාගැනීම් බෙදා හරියි.

- **බාධා ජය ගැනීම: ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමක් සඳහා වූ ආර්ථික වාතාවරණය,** අසංක විජේසිංහ සහ නිලුපුලී රත්නායක, ටෝකිං ඉකොනොමික්ස්, මැයි 11.
- **ශ්‍රී ලංකාවේ අර්බුදය හේතුවෙන් ආනයන පාලනය කිරීම් මගින් ආනයන ආදේශක දිරිමත් කර තිබේද?,** අසංක විජේසිංහ සහ නිලුපුලී රත්නායක, ටෝකිං ඉකොනොමික්ස්, ජුනි 12.
- **ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මාර්ග සිතියම: සාක්ෂි අනුගමනය කිරීම,** දුෂ්නි වීරකෝන්, ටෝකිං ඉකොනොමික්ස්, ජූලි 18.
- **ශ්‍රී ලංකාවේ ග්‍රැෆයිට්: ගෝලීය විදුලි වාහන විප්ලවයේ විභව ක්‍රියාකාරිකයෙක්,** අසංක විජේසිංහ සහ මලීෂා වීරසිංහ, ටෝකිං ඉකොනොමික්ස්, අගෝස්තු 22.
- **ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති තෝරා ගැනීම: ස්ථායීකරණයේ සිට වර්ධනය දක්වා,** පර්යේෂණ කාර්ය මණ්ඩලය, ටෝකිං ඉකොනොමික්ස්, ඔක්තෝබර් 17.
- **රට ඇතුළත ප්‍රතිපත්ති සහ ගෝලීය වර්ධනයවීම් අතර: ශ්‍රී ලංකාවේ විදේශ අංශයේ දැක්ම,** ටෝකිං ඉකොනොමික්ස්, ඔක්තෝබර් 24.

ශ්‍රමය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය

යහපත් සෞඛ්‍ය, ගුණාත්මක අධ්‍යාපනය සහ ක්‍රියාකාරී ශ්‍රම වෙළඳපොළ වෙත ප්‍රවේශය යහපැවැත්ම සහ ආර්ථික සමෘද්ධිය මෙහෙයවන මානව සංවර්ධනය සහතික කිරීම සඳහාඅතිශය වැදගත් වේ.

කෙසේ වෙතත්, මූල්‍ය, මානව සහ භෞතික සම්පත් අවහිරතා හමුවේ, තාක්ෂණයේ නව දියුණුවීම් සමග ඉදිරියට යාම සහ සැමට ගුණාත්මක ප්‍රවේශයක් සහතික කිරීම වැඩි වැඩියෙන් දුෂ්කර වෙමින් පවතින බැවින් අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා ප්‍රවේශය ලබා දීමේ පවතින ආකෘතීන් දැන් අභියෝගයට ලක්වී ඇත. තාක්ෂණික දියුණුව, දේශගුණික විචලනයන් සහ ගෝලීයකරණය වැනි බොහෝ හේතූන් නිසා ශ්‍රම වෙළඳපොළවල සංවිධානය සහ සංයුතිය ද නිරන්තරයෙන් වෙනස් වෙමින් පවතියි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ මගින් ශ්‍රමය, රැකියා, අධ්‍යාපනය සහ සෞඛ්‍යය සම්බන්ධ ප්‍රතිපත්තිමය අභියෝගවලට විසඳුම් හඳුනා ගැනීම තුළින් රජයේ සංවර්ධන උපාය මාර්ගයට සහාය වීමට අරමුණු කරයි.

කුසලතා සහ අධ්‍යාපනය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 'සංවර්ධනය විශ්ලේෂණය සඳහා වන කණ්ඩායම' සහ සදර්න් වොයිස් නෙට්වර්ක් සමග සහයෝගයෙන් යුතුව අධ්‍යාපනික තාක්ෂණය පිළිබඳ කලාපීය **අති නවීනතම පත්‍රිකා පිළිබඳ අධ්‍යයනයක්** සම්පූර්ණ කළේය. ගුණාත්මක අධ්‍යාපනය වෙත ප්‍රවේශ වීමේ ඇති හිදැස් පියවීම සඳහා අධ්‍යාපනික තාක්ෂණය භාවිතා කළ හැකි ක්‍රම සොයා ගැනීම පිණිස මෙම අධ්‍යයනය මගින් ආසියාව පුරා අධ්‍යාපනික තාක්ෂණයෙහි විවිධ භාවිතයන් පිළිබඳන විමසා බලන ලදී. එමෙන්ම මෙම වාර්තාව මගින් අධ්‍යාපනික තාක්ෂණය සඳහා ඇති අභියෝග සහ පහසුකම් සපයන්නන් හඳුනාගන්නා ලද අතර, බාධක ජය ගැනීම සහ පහසුකම් සපයන්නන් උත්තේජනය කිරීම සඳහා නිර්දේශ ද ඉදිරිපත් කරයි.

සෞඛ්‍යය

2023 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ඩියුක් විශ්වවිද්‍යාලය / බිල් සහ මෙලින්ඩා ගේට්ස් පදනම සමග එක්ව එක් එක් රටෙහි ඇති විශේෂිත අඩුපාඩු පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ඇති කිරීමට, අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපත්තිමය විසඳුම් සකස් කිරීමට සහාය වීමට සහ සාක්ෂි ප්‍රතිපත්ති බවට පරිවර්තනය කිරීමෙහි නිරත වීමට උපකාරී වෙමින් **උපාය මාර්ගික සැලසුම්කරණය, කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ සෞඛ්‍ය මූල්‍යකරණයේ ප්‍රමුඛතාවය** සඳහා දත්ත සහ දැනුම වැඩිදියුණු කිරීම පිළිබඳ අධ්‍යයනයන් සම්පූර්ණ කළේය. කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය සමග එක්ව **ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ආහාර ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ නියමයන් ශක්තිමත් කිරීම** පිළිබඳ අධ්‍යයනයක් මගින් සෞඛ්‍යයට අහිතකර ආහාර පුරුදු අවම කිරීම සඳහා මෑතකදී හඳුන්වා දෙන ලද මූල්‍ය සහ නියාමන මැදිහත්වීම් දෙකක [සීනි යොදන ලද පැණි බීම සඳහා බද්දක් පැනවීම සහ සීනි යොදා රසගන්වන ලද පැණිබීම් වල සීනි මට්ටම පෙන්නුම් කරන පාට ලේබල් ක්‍රමයක් හඳුන්වා දීම] ඵලදායිත්වය විමර්ශනය කරන ලදී. මෙයට අමතරව, කොවිඩ්-19 වසංගතය කොළඹ අවට තෝරාගත් ස්ථානවල ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල් මුහුණ දෙන ආහාර පරිසරයට බලපා ඇති ආකාරය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හිදැස් සහ ඉහත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ඵලදායිතාවය, සහ ශ්‍රී ලංකාවේ ආහාර පරිසරය සහ සෞඛ්‍යයට අහිතකර ආහාර පුරුදු අඩු කිරීම වැඩිදියුණු කිරීම සඳහා මෙම ප්‍රතිපත්තිවල සැලැස්ම සහ ඒවා ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම පිළිබඳව ද විමසා බලන ලදී.

'වයිටල් ස්ට්‍රැටජීස්' ආයතනයේ අරමුදල් සැපයීම මත, ඉලිනොයිස් විශ්වවිද්‍යාලය සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සිදු කරන **'ශ්‍රී ලංකාවේ** RESET **ඇල්කොහොල් වැඩසටහන'** පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය මගින් රට තුළ මධ්‍යසාර බදු ප්‍රතිසංස්කරණ සඳහා සහාය වීම පිණිස ආර්ථික පර්යේෂණ සිදු කිරීමට අරමුණු කරයි. එය මතු සඳහන් ප්‍රධාන කොටස් හතරෙන් සමන්විත වේ: සාක්ෂි න්‍යාසයක් සකස් කිරීම, මිල සහ ආදායම් සංවේදීතාවය විශ්ලේෂණය කිරීම, බදු සමාකරණ විශ්ලේෂණ සිදු කිරීම සහ දේශපාලන ආර්ථිකය පරීක්ෂා කර බැලීම.

වික්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් ආයතනයේ අරමුදල් සැපයීම මත, KIVU ඉන්ටර්නැෂනල් සංවිධානය සමග එක්ව සිදු කරන **ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ දුම්කොළ පාලන ව්‍යාප්ති වැඩසටහන,** මගින් රාජ්‍ය ආදායම ඉහළ නංවන අතර ම දුම්කොළ භාවිතය මගින් සිදුවන හානිය අවම කිරීමේ අරමුණ ඇතිව රට තුළ දුම්කොළ පාලනය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති සංශෝධන සිදු කිරීමට අනුබලය ලබා දීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස, මෙම අධ්‍යයනය මගින් රජයේ ආදායම සහ දුම්කොළ භාවිතය මත බදු වල බලපෑම මැනීම, ප්‍රතිපත්ති සංශෝධන සඳහා සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරණ සිදු කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සමග සාකච්ඡා කිරීම ඇතුළත් බහුවිධ ප්‍රවේශයක් භාවිතා කරයි.

ශ්‍රම වෙළෙඳපොළ

ලෝක බැංකුව සමග හවුල්කාරිත්වයෙන් යුතුව සිදු කර 2023 වර්ෂයේ දී නිම කරන ලද **ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය සහ රැකියා සඳහා වන රාජ්‍ය වියදම් සමාලෝචනය** පිළිබඳ අධ්‍යයනය මගින් ශ්‍රම වෙළඳපොළ ප්‍රතිඵල ප්‍රවර්ධනය කරමින් කම්පන වලින් ආරක්ෂා කරන වැඩසටහන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය සඳහා වන රාජ්‍ය වියදම්වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්ති නිර්දේශ හඳුනාගෙන ඇත.


කාන්තාව සහ ශ්‍රම බලකාය


Co-Impact සංවිධානයේ අරමුදල් සැපයීම මත 'ආර්ථික ප්‍රතිපත්ති සඳහා හවුල්කාරිත්වය' සමග එක්ව 2023 වර්ෂයේ දී **'කාන්තාවන් සඳහා ඔබින රැකියා සම්බන්ධ සමාජ, ආර්ථික සහ නීතිමය බාධක'** පිළිබඳ අධ්‍යයනයක් නිම කරන ලදී. මෙම අධ්‍යයනය සංරචක දෙකින් සමන්විත විය. ඉන් පළමුවැන්න, කාන්තාවන් සඳහා ඔබින රැකියා වෙත ප්‍රවේශ වීමට ඇති සන්දර්භමය බාධක වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක ක්‍රමවේද භාවිතා කරමින් රට පුරා සිදු කරන ලද අධ්‍යයනයකි. දෙවැන්න, විශේෂයෙන් ම නීතිමය, සමාජීය සහ ආර්ථික බාධක කෙරෙහි අවධානය යොමු කරමින්, ශ්‍රී ලංකාවේ ගුණාත්මක රැකියා සඳහා කාන්තාවන්ට තිබෙන ප්‍රවේශය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන ක්‍රමවේද දෙක ම භාවිතා කළ අධ්‍යයනයකි.

ලෝක බැංකුවේ **දකුණු ආසියානු ස්ත්‍රී පුරුෂ සමාජභාවය නවෝත්පාදන විද්‍යාගාරය ිසෘ ධෂඛ* සමග එක්ව දකුණු ආසියාවේ කාන්තාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අන්තර්කරණය වූ කලාපීය ඒකාබද්ධතාවය: ආනුභවික ඇගයීමක් නැමති අධ්‍යයනය** 2023 වර්ෂයේ දී නිම කරන ලදී. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා දියුණු කළ යුතු කලාපීය ඒකාබද්ධතාවයේ විශේෂිත මානයන් මෙම අධ්‍යයනය මගින් හඳුනාගන්නා ලදී.

ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ කේන්ද්‍රය සමග එක්ව දැනට සිදු කෙරෙමින් පවතින **ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ සේවිකාවන්ට බලපාන අහිතකර සෞඛ්‍ය බලපෑම් අඩු කිරීම සඳහා වසංගත ප්‍රතිචාර වැඩිදියුණු කිරීම** පිළිබඳ තවත් අධ්‍යයනයක් මගින් සෞඛ්‍ය බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා සේවා ස්ථාන තත්ත්වයන් වැඩිදියුණු කිරීම පිණිස වසංගත ප්‍රතිචාර කාර්ය පටිපාටියක් සැලසුම් කිරීමට සහ නියාමන ප්‍රතිපත්තිවලට අනුබලය දීමට අරමුණු කරයි. මෙම අධ්‍යයනය මගින්, රට වසා දමා තිබූ තත්ත්වයක් අතරතුර වසංගතයේ බලපෑම්වලට කාන්තා ශ්‍රම බලකාය අසමානුපාතික ලෙස නිරාවරණය කරමින් බොහෝ නිමි ඇඳුම් කර්මාන්තශාලා ක්‍රියාත්මක වූ වාතාවරණයක් සලකා බලයි.

■ ප්‍රකාශන: වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත සහ ලිපි








ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි පුළුල් පරාසයක ප්‍රකාශන සහ ප්‍රකාශන වේදිකා හරහා කාලීන ගැටළු පිළිබඳ පර්යේෂණ මගින් සොයා ගත් කරුණු ප්‍රචාරණය කරයි.

- **ශ්‍රී ලංකාවේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ප්‍රතිඵල වැඩිදියුණු කිරීම: රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් සමඟ වඩා හොඳ හවුල්කාරිත්වයන් උපකාරී විය හැක,** නිශා අරුණතිලක, යුනෙස්කෝ, 2023 ජනවාරි.
- **ගුණාත්මක රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය: රට පුරා දත්ත ඇසුරෙන් සිදුකෙරෙන විශ්ලේෂණයක්,** අබ්දෙල්ක්‍රිම් අරාර්, නිශා අරුණතිලක, මර්සා ෆොන්ටානා, දිලෙනි ගුණවර්ධන, ප්‍රියංකා ජයවර්ධන, සහ උෂා පෙරේරා, ක්‍රියකාරී පත්‍රිකාවක් ලෙස ඉදිරියේ පළ කෙරෙන, 2023.
- **තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා:** වැඩ කරන වේලාවන් තුළ ශ්‍රී ලංකාවේ වැටුප් නොගෙවන රැකවරණ සේවා පිළිගැනීමට ලක්කිරී, අඩු කිරීම සහ නැවත බෙදාහැරීම: ශ්‍රී ලංකාවේ වැටුප් නොගෙවන රැකවරණ සේවාවල ස්ත්‍රී පුරුෂ භාවය මානයන් ගවේෂණය කිරීම. එස්. කෝට්ටේගොඩ සහ පී. පීරිස් (සංස්කරණය) කෘතියේ සුනිමලී මදුරාවල, කාන්තාව සහ මාධ්‍ය සාමූහික සහ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය (පී. 92-109), කොළඹ, 2023.
- **ඔබින රැකියා සඳහා කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වයට බලපාන සන්දර්භ-විශේෂිත බාධක ආමන්ත්‍රණය කිරීම: බහුවිධ-රටවල් සම්මන්ධ, මිශ්‍ර ක්‍රමවේද සහිත, ස්ත්‍රී පුරුෂ සමාජභාව සංවේදී විශ්ලේෂණය,** අබ්දෙල්ක්‍රිම් අරාර්, නිශා අරුණතිලක, ලක්මිණි ප්‍රනාන්දු, සුනිමලී මධුරාවල, කිමුතු කරින්ගොඩ, ආර්ථික ප්‍රතිපත්තිය සඳහා හවුල්කාරිත්වය, ක්‍රියාකාරී පත්‍රිකාව, 2023.
- **දුම්පානය තහනම් කලාප කලාප: දුම්පානයෙන් තොර ශ්‍රී ලංකාවකට මාවතක්,** සුනිමලී මදුරාවල, චතුර්ගා කරුණානායක, සහ සුරේෂ් රණසිංහ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.
- **ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ආහාර වේල් සඳහා වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ නියමයන්: බදුකරණයේ දේශපාලන ආර්ථිකය සහ සීනි යොදන ලද පැණි බීම සඳහා අනතුරු ඇඟවීමේ වර්ණ ලේබල් යෙදීම පිළිබඳ විශ්ලේෂණයක්,** සුනිමලී මදුරාවල, කිමුතු කිරින්ගොඩ, ඈන් මාරි තොව් සහ නිශා අරුණතිලක, ග්ලෝබල් හෙල්ත් ඇක්ෂන්, 16:1, 2023
- **තනි දුම්වැටි තහනම් කිරීමේ යෝජනාව: ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා විකල්ප,** ඩිලනි හිරිමුතුගොඩගේ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රතිපත්ති සාකච්ඡා සංක්ෂිප්තය, 2023 අප්‍රේල්.











- **කොවිඩ්-19 වසංගතය අතරතුර ශ්‍රී ලංකාවේ ජායා අධ්‍යාපනය: ප්‍රධාන ධාරාවේ අධ්‍යාපනයට අදාළ ප්‍රවණතා, බලපෑම් සහ භූමිකාව,** අශානි අබයසේකර, උෂා පෙරේරා සහ තිසාලි ද සිල්වා, සෞඛ්‍ය හා අධ්‍යාපන පර්යේෂණ ප්‍රකාශන මාලා අංක 21, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2023 මැයි.
- **සමාජ මාධ්‍ය හරහා වක්‍රාකාරයෙන් දුම්කොළ ප්‍රවර්ධනය කිරීම,** ඩිලානි හිරිමුතුගොඩගේ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රතිපත්ති සාකච්ඡා සංක්ෂිප්තය, 2023 මැයි.
- **ශ්‍රී ලංකාව තුළ ඵලදායී බීඩි බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම,** චරන්දනී පතිරාජ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රතිපත්ති සංදේශය, 2023 මැයි.
- **දුම්කොළ බදු ඉහළ නැංවීම සඳහා වූ යෝජනාව,** ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ දුම්වැටි භාවිතය පිළිබඳ පර්යේෂණ කණ්ඩායම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රතිපත්ති සංදේශය, 2023 ජූනි.
- **ශ්‍රී ලංකාව තුළ ඵලදායී බීඩි බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම,** ප්‍රියංකා ජයවර්ධන, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රතිපත්ති සංදේශය, නොවැම්බර් 2023.
- **ආසියාවේ සහ මැදපෙරදිග සහ උතුරු අප්‍රිකාවේ අධ්‍යාපනයේ දී තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධ පසුබිම සහ අභියෝග,** හිමානි විතානගේ, නිශා අරුණාතිලක, ලක්ෂිලා වනිගසිංහ සහ බිනුර සෙනෙවිරත්න, කාලීන පතික්‍රිකා අංක 89, සදර්න් වොයිස්, දෙසැම්බර් 2023.
- **ශ්‍රී ලංකාවේ ඔබින රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය: සන්දර්භ-විශේෂිත බාධක ආමන්ත්‍රණය කිරීම,** නිශා අරුණාතිලක සහ සුනිමලී මදුරාවල, ආර්ථික ප්‍රතිපත්තිය සඳහා හවුල්කාරිත්වය (PEP) ප්‍රතිපත්ති සංක්ෂිප්ත අංක 268, ආර්ථික ප්‍රතිපත්ති සඳහා හවුල්කාරිත්වය, දෙසැම්බර් 2023.

■ ශ්‍රී ලංකා රජයේ කමිටු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයන්ට දායක වෙමින්, රජයේ ප්‍රතිපත්ති කමිටුවලට ආරාධිත සහභාගීත්වය සපයා දීම හරහා ජාතික ප්‍රතිපත්ති ගැටලුවලට සහාය දැක්වීමට සහ ආමන්ත්‍රණය කිරීමට ස්වකීය පර්යේෂණ සාක්ෂි භාවිතා කරයි. 2023 වර්ෂයේ දී, ආයතනය පහත සඳහන් කමිටු හරහා යෙදවුම් සපයා දෙන ලදී:

- ශ්‍රී ලංකාව සඳහා සෞඛ්‍ය මූල්‍යකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම පිණිස 'අවදානම් සහ සම්පත් බෙදාගැනීම සම්බන්ධ තාක්ෂණික කමිටුව පිළිබඳ විශේෂඥ කණ්ඩායම, සෞඛ්‍ය අමාත්‍යාංශය, 2023 ජූලි.
- තාක්ෂණ සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව පිළිබඳ ස්ථාවර කමිටුව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.
- උසස් අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ ස්ථාවර කමිටුව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.
- සාමාන්‍ය අධ්‍යාපනය සහ මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.

■ පර්යේෂණ ඉදිරිපත් කිරීම් / සාකච්ඡා

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දේශීයව සහ ජාත්‍යන්තර වශයෙන් විවිධ සැසි සහ සංසද වලදී කථිකයා, සාකච්ඡාකරු, විද්වත් මණ්ඩල සාමාජික සහ උපදේශක යන භූමිකා ඉටුකරමින්, ප්‍රතිපත්ති නියැළීම් සහ සාකච්ඡා සඳහා පර්යේෂණ පදනම් වූ යෙදවුම් පිරිනමයි.

- ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය (SLMA) විසින් සංවිධානය කරන ලද **අර්බුද තත්ත්වය තුළ පවුල් සවිබල ගැන්වීම - නිවසේ ආර්ථිකය** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික. ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය, මාර්තු 17 (නිශා අරුණාතිලක)
- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද **'නිවසේ සිට රාජකාරි කිරීමේ ප්‍රතිපත්තියේ ජයග්‍රාහකයින් සහ පරාජිතයින්'** පිළිබඳ ඉදිරිපත් කිරීම. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මාර්තු 31 (නිශා අරුණාතිලක)

- ආර්ථික ප්‍රතිපත්ති සඳහා හවුල්කාරිත්වය විසින් සංවිධානය කරන ලද, 'ආර්ථික ප්‍රතිපත්ති සඳහා හවුල්කාරිත්වය වාර්ෂික සම්මන්ත්‍රණය 2023' අවස්ථාවේදී **ඔබින රැකියා සඳහා ප්‍රවේශවීමේ දී පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාව පරතරය - රටපුරා සිදු කරන ලද අධ්‍යයනය** පිළිබඳ ඉදිරිපත් කිරීම, මාර්ගගත, ජූනි 5 (ප්‍රියංකා ජයවර්ධන)

- ආර්ථික ප්‍රතිපත්ති සඳහා හවුල්කාරිත්වය විසින් සංවිධානය කරන ලද 'ආර්ථික ප්‍රතිපත්ති සඳහා හවුල්කාරිත්වය වාර්ෂික සමුළුව 2023 අවස්ථාවේ දී **ශ්‍රී ලංකාවේ ඔබින රැකියා සඳහා කාන්තාවන්ට තිබෙන ප්‍රවේශය: සන්දර්භ-විශේෂිත බාධක ආමන්ත්‍රණය කිරීම** පිළිබඳ ඉදිරිපත් කිරීම, මාර්ගගත, ජූනි 5 (සුනිමලී මදුරාවල)

- කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද 'කම්කරු නීති ප්‍රතිසංස්කරණ සඳහා වූ උපදේශන රැස්වීමේදී' **'ඔබින රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා කම්කරු නීති ප්‍රතිසංස්කරණ'** පිළිබඳ ඉදිරිපත් කිරීම, කම්කරු දෙපාර්තමේන්තුව, ජූනි 7, (නිශා අරුණතිලක).

- සදර්න් වොයිස් සහ GRADE සංවිධාන විසින් Zoom තාක්ෂණය ඔස්සේ සංවිධානය කරන ලද 'සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ අධ්‍යාපනයේ දී තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ තත්ත්ව' නැමති මාතෘකාව යටතේ පැවති 'වෙබිනෙක්' වැඩමුළුවේ දී **'අධ්‍යාපනයේ දී තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ අති නවීනතම කලාපීය පත්‍රිකා'** පිළිබඳ ඉදිරිපත් කිරීම, ජූනි 8, (හිමානි විතානගේ).

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද, 'බෝ නොවන රෝග අවදානම් සාධක සහ මන්දපෝෂණය පාලනය කිරීම සඳහා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සංවාදයේ' දී **ආහාර පරිසරයන් වැඩිදියුණු කිරීම සඳහා වන රාජ්‍ය මූල්‍ය සහ නියාමන ප්‍රතිපත්ති පිළිබඳ ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති** අධ්‍යයන ආයතනය, ජූනි 27 (නිශා අරුණතිලක)



- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද, 'බෝ නොවන රෝග අවදානම් සාධක සහ මන්දපෝෂණය පාලනය කිරීම සඳහා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සංවාදයේ' දී **සීනි යොදන ලද පැණි බීම සඳහා බදු පැනවීමේ සහ අනතුරු ඇඟවීමේ වර්ණ ලේබල් යෙදීමෙහි ඵලදායීත්වය** පිළිබඳ ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජූනි 27 (ප්‍රියංකා ජයවර්ධන)

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද, 'බෝ නොවන රෝග අවදානම් සාධක සහ මන්දපෝෂණය පාලනය කිරීම සඳහා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සංවාදයේ' දී **ආහාර පරිසරයේ දේශපාලන ආර්ථිකය සහ අඩු ආදායම් ප්‍රජාවන් තුළ බෝ නොවන රෝග අවදානම් සාධක පිළිබඳ ආහාර පරිසරයේ බලපෑම** පිළිබඳ ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජූනි 27, (සුනිමලී මදුරාවල).

- චික්සත් රාජධානියේ සංවර්ධන අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද, 'දරිද්‍රතාවය, කුසගින්න සහ රැකියා: වසංගතය පිළිබඳ යාවත්කාලීන කිරීම් සහ ප්‍රතිසාධන අපේක්ෂාවන්' පිළිබඳ සම්මන්ත්‍රණයක දී **'කාන්තාවන්ගේ ඔබින රැකියා, දරිද්‍රතාවය සහ පෝෂණය: බහු-කලාපීය සියුම් අවබෝධයන්'** පිළිබඳ සැසියක විද්වත් මණ්ඩල සාමාජික, ජූනි 28, (නිශා අරුණතිලක).

- මත්පැන් සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ඇඩික්) විසින් මූවන්ඩි ඉන්ටර්නැෂනල් සංවිධානය සමග එක්ව සංවිධානය කරන ලද පර්යේෂණ දියත් කිරීමේ අවස්ථාවේ දී **ශ්‍රී ලංකාවේ ඵලදායී මධ්‍යසාර බදුකරණයේ වැදගත්කම** පිළිබඳ ඉදිරිපත් කිරීම, කිංග්ස්බර් හෝටලය, සැප්තැම්බර් 5 (ප්‍රියංකා ජයවර්ධන)

- 'සදර්න් වොයිස් සම්මන්ත්‍රණය 2023 - තිරසාර සංවර්ධනයේ ඉදිරි දශකය මෙහෙයවීම' නැමති සම්මන්ත්‍රණයේ දී **'ආසියාවේ අධ්‍යාපනය සඳහා තාක්ෂණය යොදා ගැනීම'** පිළිබඳ ඉදිරිපත් කිරීම, නයිරෝබි, කෙන්යාවේ, ඔක්තෝබර් 24-25 (නිශා අරුණතිලක).

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද, 'ඔබින රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය' පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්මන්ත්‍රණයේ දී හඳුන්වාදීමේ අදහස් දැක්වීම සහ **'විනිත රැකියා නිර්මාණය කිරීම'** පිළිබඳ සැසියක් මෙහෙයවීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ඔක්තෝබර් 31 (නිශා අරුණතිලක)



- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, විසින් සංවිධානය කරන ලද 'ඔබින රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය' පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්මන්ත්‍රණයේ දී, **ශ්‍රී ලංකාවේ ඔබින රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය: සන්දර්භ-විශේෂිත බාධක ආමන්ත්‍රණය කිරීම** පිළිබඳ ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ඔක්තෝබර් 31 (නිශා අරුණතිලක)

- 'දකුණු ආසියාවේ පෝෂණය සඳහා බෙදාහැරීම (D4N): සමානාත්මතාවය සහ අන්තර්කරණය' පිළිබඳ සම්මන්ත්‍රණයේදී **ශ්‍රී ලංකාමේ අනතුරු ඇඟවීමේ වර්ණ මුද්‍රණය කිරීම: සීනි යොදන ලද පැණි බීම තෝරා ගැනීම මෙහෙයවීම,** පිළිබඳ ඉදිරිපත් කිරීම, මාර්ගගත, නොවැම්බර් 1, (ප්‍රියංකා ජයවර්ධන).











- CGIAR සංවිධානය සමග සහයෝගයෙන් යුතුව ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද 'දකුණු ආසියාවේ පෝෂණය සඳහා බෙදාහැරීම (D4N): සමානාත්මතාවය සහ අන්තර්කරණය' නැමති සම්මන්ත්‍රණයේ දී, **'අදහස්, ආයතන සහ බලය: ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ආහාර රටා වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ නියමයන්හි දේශපාලන ආර්ථිකය පිළිබඳ අධ්‍යයනයක්'** නැමති මාතෘකාව යටතේ සිදු කරන ලද ඉදිරිපත් කිරීම, මාර්ගගත, නොවැම්බර් 1 (සුනිමලී මදුරාවල).

- ප්‍රතිපත්ති සංවාද කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද '14 වෙනි දකුණු ආසියානු ආර්ථික සමුළුවේ දී' **මහජන සෞඛ්‍ය පිළිබඳ කලාපීය සහයෝගීතාව** නැමති මාතෘකාව යටතේ පැවති සැසියේ විද්වත් මණ්ඩල සාමාජික, ධකා, බංග්ලාදේශය, නොවැම්බර් 4-5 (ගංගා තිලකරත්න).

- චික්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් විසින් සංවිධානය කරන ලද, චික්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් ලන්ඩන් ගෝලීය පිළිකා සතිය නැමති වෙබ් සම්මන්ත්‍රණයේ දී **'අඩු සහ මැදි ආදායම් රටවල දුම්කොළ කර්මාන්තයේ බාධක නිරාකරණය කිරීම - ශ්‍රී ලංකාවේ දෘෂ්ටි කෝණය** පිළිබඳ ඉදිරිපත් කිරීම, නොවැම්බර් 14, (නිශා අරුණතිලක).

- TV1 රූපවාහිනී නාලිකාවේ නිවිස් ෆස්ට් වැඩසටහන ඔස්සේ විකාශය වූ 'ද පීපල්ස් ප්ලැට්ෆෝම්' වැඩසටහනේ දී **'ඔබින රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය'** පිළිබඳ සාකච්ඡාව. නොවැම්බර් 16 (නිශා අරුණතිලක)

- TV1 රූපවාහිනී නාලිකාවේ නිවිස් ෆස්ට් වැඩසටහන ඔස්සේ විකාශය වූ 'ටෝක් ඔෆ් ද ටවුන්' වැඩසටහනේ දී **කාන්තාවන් සඳහා වඩාත් සුරක්ෂිත සේවා ස්ථාන** පිළිබඳ සාකච්ඡාව, නොවැම්බර් 17 (නිශා අරුණතිලක).

- රජයේ හවුල්කරුවන්ට - චිනම් දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සහ සුරාබදු දෙපාර්තමේන්තුව, සහ මත්පැන් සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ඇඩික්) වෙත ශ්‍රී ලංකාවේ RESET **ඇල්කොහොල් වැඩසටහන** නැමති අධ්‍යයනය මඟින් සොයාගත් කරුණු පිළිබඳ ඉදිරිපත් කිරීම, දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ කාර්යාලය, දෙසැම්බර් 19 (ප්‍රියංකා ජයවර්ධන).

■ ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය (TE Blog)

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 'ටෝකිං ඉකොනොමික්ස්' බ්ලොග් අඩවිය හරහා ස්වකීය නවතම සාක්ෂි පදනම් කරගත් සොයාගැනීම් බෙදා ගනියි.

- DigitALL: **ඩිජිටල් පරිවර්තනය තුළ ශ්‍රී ලාංකික කාන්තාවන් අතහැර දමා තිබේද?** ලක්ෂිලා වනිගසිංහ, ටෝකිං ඉකොනොමික්ස්, මාර්තු 8.
- **ශ්‍රී ලාංකික කාන්තාවන්ට කවර හෝ රැකියාවකට වඩා ඔවුන්ට ඔබින රැකියා ප්‍රවර්ධනය කිරීම** වැදගත් වීමට හේතු, නිශා අරුණතිලක, ටෝකිං ඉකොනොමික්ස්, මාර්තු 14.
- **රෝග සහ ණය සමග සටන් කිරීම: ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය මධ්‍යයෙහි බෝ නොවන රෝග සඳහා මූල්‍යකරණය,** සුනිමලී මදුරාවල, ටෝකිං ඉකොනොමික්ස්, අප්‍රේල් 20.
- **විසඳුමක් සොයා ගැනීම: ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ නවෝත්පාදන පසුගාමී වීමට හේතු,** ඩිලානි හිරිමුතුගොඩගේ, ටෝකිං ඉකොනොමික්ස්, අප්‍රේල් 26.
- **බෝ නොවන රෝගවලට එරෙහි ශ්‍රී ලංකාවේ සටන: සීනි යෙදූ පැණි බීම බද්ද සාර්ථකද?**, ප්‍රියංකා ජයවර්ධන, ටෝකිං ඉකොනොමික්ස්, සැප්තැම්බර් 18.
- **ප්‍රමා හිතකාමී ප්‍රතිපත්තිවලට ප්‍රමුඛත්වය දීම: ශ්‍රී ලංකාවේ ප්‍රමා මන්දපෝෂණ අර්බුදය ආමන්ත්‍රණය කිරීම,** නිශා අරුණතිලක, ටෝකිං ඉකොනොමික්ස්, ඔක්තෝබර් 11.
- **ශ්‍රී ලාංකාවේ කාන්තාවන් සවිබල ගැන්වීම: 'ශ්‍රී ලංකාවේ ඔබින රැකියාව සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්මන්ත්‍රණයේ විශේෂ අවස්ථා,** කිමුතු කිරින්ගොඩ සහ හිමානි විතානගේ, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 6.

සංක්‍රමණය සහ නාගරීකරණය

ගෝලීයකරණය ඉහළ යාම සහ විවිධ රටවල් අතර ඒක පුද්ගල ආදායමේ විෂමතා ඉහළ යාමත් සමග ශ්‍රී ලාංකිකයන් රැකියා සඳහා පමණක් නොව, අධ්‍යාපනය සඳහා සහ පවුල් ඒකක ලෙස ද සංක්‍රමණය වේ. ඒ සමගම ශ්‍රී ලංකාවට ද සංචාරකයන් සහ ශ්‍රමිකයන් ලෙස විදේශිකයෝ පැමිණෙති. මිනිසුන් ආර්ථික අවස්ථා සොයා නාගරික කේන්ද්‍ර කරා සංක්‍රමණය වන විට ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණික රටා ද වෙනස් වෙමින් පවතියි. මෙම තත්ත්වය මගින් හරිත, සුහුරු සහ ඔරොත්තු දෙන නගර සංවර්ධනය කිරීමේ, නාගරීකරණයේ විෂමතා ආමන්ත්‍රණය කිරීමේ, සහ නාගරික ප්‍රදේශවල නිවාස, ගොඩබිම් ප්‍රවාහනය සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය නිර්මාණය කර තිබේ. ඒ සමානවම, ජාත්‍යන්තර සංක්‍රමණය සැලකීමේ දී, ජාත්‍යන්තර සංක්‍රමණයේ පශ්චාත් වසංගත සමයේ ගෝලීය ගතිකයන්ට අනුකූල වීම පිණිස, පාලන රාමු, ආපසු පැමිණීමේ සහ නැවත සමාජගත කිරීමේ සහාය, සහ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සමග සම්බන්ධ වීම වැනි අංශ පිළිබඳව නැවත විමසා බැලිය යුතු වේ.

සංක්‍රමණය සහ සංවර්ධනය

2023 වර්ෂයේ දී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය "ජාත්‍යන්තර විධායක සේවා බලකාය" සමග එක්ව, **ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයන්ගේ නිපුණතා, අපේක්ෂාවන් සහ නැවත සමාජගත වීමේ අභියෝග** පිළිබඳ අධ්‍යයනයන් නිම කරන ලද අතර, එම අධ්‍යයන මගින් ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයන්ගේ නිපුණතා, අපේක්ෂාවන් සහ ඔවුන් නැවත ඒකාබද්ධ කිරීමේ අභියෝග සම්බන්ධයෙන් පවතින දත්ත හිඩැස් හඳුනාගන්නා ලද අතරම, ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයින් සඳහා තිරසාර නැවත සමාජගත කිරීමේ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමේ උපාය මාර්ග මෙන්ම නිර්දේශ ද ඉදිරිපත් කර ඇත. 'ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග එක්ව සිදු කරන ලද, **'සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ශ්‍රම සංක්‍රමණ පර්යේෂණ පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ නිපුණතා ගොඩනැගීම'** පිළිබඳ තවත් අධ්‍යයනයක් මගින් "ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ ක්‍රියාත්මක කරන්නන්ගේ අවශ්‍යතාවලට අදාළ දැනුමෙහි අඩුපාඩු හඳුනාගෙන, පර්යේෂණ යෝජනා සංකල්පනය කිරීමට, පර්යේෂණ සිදුකිරීමේ හැකියාව ගොඩනැගීමට සහ පර්යේෂණ මගින් සොයාගන්නා කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට උපකාර කරන ලදී. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අරමුදල් සපයන ලද, **'බහුවිධ අර්බුද සහ ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයින්: ශ්‍රී ලංකාවේ පවතින ආයතනික සහාය යාන්ත්‍රණ සහ නැවත සමාජගත කිරීමේ වැඩසටහන්'** පිළිබඳ අධ්‍යයනයක් මගින් කොවිඩ්-19 වසංගතය සහ ඉන් පසුව ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික අර්බුදය පැවති කාලය තුළ ආපසු පැමිණි සංක්‍රමණික සේවකයින් සඳහා ශ්‍රී ලංකා රජය විසින් පිරිනමන ලද සහාය යාන්ත්‍රණ සහ නැවත සමාජගත කිරීමේ වැඩසටහන් පරීක්ෂා කර බලන ලද අතර, අනාගත දේශීය හා ගෝලීය අර්බුද සඳහා පෙරසූදානම සහතික කිරීම පිණිස ගත යුතු ඉදිරි මාවත ද නිර්දේශ කරන ලදී. අවසාන වශයෙන්, පිහිටුවා නුවර පිහිටි ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අරමුදල් සැපයීම මත, ශ්‍රම සංක්‍රමණය සහ සංක්‍රමණිකයන් සඳහා වන දකුණු ආසියානු මධ්‍යස්ථානය සමග එක්ව සිදු කරන ලද සංක්‍රමණිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ඔබින රැකියා ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අධ්‍යයනයක් මගින්, සංක්‍රමණය තිරසාර සංවර්ධනය සමග ඒකාබද්ධ කිරීම සාක්ෂාත් කර ගැනීම පිණිස **සංක්‍රමණිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ඔබින රැකියා ප්‍රවර්ධනය කිරීම** සඳහා සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති සැකසීම පිණිස ඉගැන්වීම් සහ හැකියා සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමට සහ ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන ලදී.

නාගරීකරණය සහ අභ්‍යන්තර සංක්‍රමණය


ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය සමග එක්ව දේශගුණික විපර්යාස, පරිසර හායනය සහ ශ්‍රී ලංකාවේ සංක්‍රමණය අතර ඇති සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනයක් නිම කරන ලදී. මෙම සංදර්භය තුළ, මිශ්‍ර ක්‍රමවේදයක් අනුගමනය කරමින් සිදු කරන ලද මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සහ සංක්‍රමණය අතර සම්බන්ධතාවය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කරන ලදී.


■ ප්‍රකාශන: වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත සහ ලිපි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි පුළුල් පරාසයක ප්‍රකාශන සහ ප්‍රකාශන වේදිකා ඔස්සේ කාලීන ගැටළු පිළිබඳ පර්යේෂණ නිමැවුම් ප්‍රචාරණය කරයි.

- **කාන්තාවන් සංක්‍රමණයවීම පිළිබඳ තහනම් ලිහිල් කිරීම: එය ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය විසඳීමට උපකාරී වේද?,** බිලේෂා වීරරත්න, සංක්‍රමණ ප්‍රතිපත්ති පරිචය, XII වෙනි වෙළුම, අංක 1, පෙබරවාරි 2023.
- **ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සහ සංක්‍රමණය අතර සම්බන්ධතා පිළිබඳ ඇගයීම් වාර්තාව,** බිලේෂා වීරරත්න සහ තවත් අය, සංක්‍රමණ සඳහා වන ජාත්‍යන්තර සංවිධානය, මැයි 2023.
- **ආපසු පැමිණෙන සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ නිපුණතා, අපේක්ෂාවන් සහ නැවත සමාජගත කිරීමේ අභියෝග,** බිලේෂා වීරරත්න, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) සහ YouLead වැඩසටහන, YouLead වැඩසටහන මගින් ප්‍රකාශයට පත් කරන ලදී, 2023.







- **සංක්‍රමණ සහ ආර්ථික ප්‍රේෂණ: සංවර්ධනය කෙරෙහි බලපෑම,** බිලේෂා වීරරත්න, Triandafyllidou, A. විසින් සංස්කරණය කරන ලද සංක්‍රමණ සහ සරණාගත අධ්‍යයනය පිළිබඳ රූට්ලෙජ් අත්පොත, රූට්ලෙජ්.
- **කොවිඩ්-19 වසංගතයේ පෙළඹවීමෙන් සිදු වූ වැටුප් සොරකම: ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ සාක්ෂි,** බිලේෂා වීරරත්න, වාර්ගික සහ සංක්‍රමණ අධ්‍යයන සඟරාව, 2023.

■ ශ්‍රී ලංකා රජයේ කමිටු

- ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුවට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ නියෝජනය සපයා දෙන ලදී, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය.

■ පර්යේෂණ ඉදිරිපත් කිරීම්/ සාකච්ඡා

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දේශීයව සහ ජාත්‍යන්තර වශයෙන් විවිධ සැසි සහ සංසද වලදී කථිකයා, සාකච්ඡාකරු, විද්වත් මණ්ඩල සාමාජික සහ උපදේශක යන භූමිකා ඉටුකරමින්, ප්‍රතිපත්ති නියැළීම් සහ සාකච්ඡා සඳහා පර්යේෂණ පදනම් වූ යෙදවුම් පිරිනමයි.

- 'කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ආපසු සංක්‍රමණයවීමේ සංසිද්ධි: දකුණු සහ අග්නිදිග ආසියාවේ අත්දැකීම්' යන මාතෘකාව යටතේ අප්‍රිකානු ආර්ථික හා සමාජ විද්‍යා පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයේ දී **කොවිඩ්-19 වසංගතයේ පෙළඹවීමෙන් සිදු වූ වැටුප් සොරකම: ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ සාක්ෂි** පිළිබඳ ඉදිරිපත් කිරීම, Université Mohammed VI Polytechnique, රබාත්, මොරොක්කෝ, පෙබරවාරි 2-3, (බිලේෂා වීරරත්න).







- ජාත්‍යන්තර සංක්‍රමණය පිළිබඳ පර්යේෂණ වැඩසටහන විසින් සංවිධානය කරන ලද 'ජනතාව සංචරණයවීම් සහ සංක්‍රමණ තන්ත්‍ර' පිළිබඳ සම්මන්ත්‍රණයේ දී **ශ්‍රී ලංකාවේ සංක්‍රමණ සහ ප්‍රේෂණ ප්‍රතිපත්ති සහ ආර්ථික අර්බුද** පිළිබඳ ඉදිරිපත් කිරීම, කේරළ, ඉන්දියාව, පෙබරවාරි 8-10 (බිලේෂා වීරරත්න).
- ලාහෝර් ආර්ථිකවිද්‍යා විද්‍යාලය විසින් සංවිධානය කරන ලද 'සමාජ ප්‍රේෂණ සහ සමාජ විපර්යාස: නිවෙස් සහ සත්කාරක රටවල් අතර සම්බන්ධතා' පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ දී සමාජ ප්‍රේෂණ සහ **සමාජ මාධ්‍ය: ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික හා දේශපාලන අර්බුද වලදී සාක්ෂි,** පිළිබඳ ඉදිරිපත් කිරීම, ලාහෝර්, පෙබරවාරි 21-22, (බිලේෂා වීරරත්න).



- සන්ඩේ ටයිම්ස් ව්‍යාපාරික සමාජය විසින් සංවිධානය කරන ලද **සංක්‍රමණ ප්‍රවණතා සහ මානව ප්‍රාග්ධනයේ ඉගිලීම** පිළිබඳ සාකච්ඡාවක විද්වත් මණ්ඩල සාමාජික, මූව් ඇන්ඩ් පික් හෝටලය, මාර්තු 7 (බිලේෂා වීරරත්න).

- ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයේ දකුණු ආසියානු කලාපීය කාර්යාලය විසින් සංවිධානය කරන ලද **ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයේ ගෝලීය ආහාර ප්‍රතිපත්ති වාර්තාව 2023 - දකුණු ආසියාව** නැමති වාර්තාව දියත් කිරීමේ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික, ජූනි 19, (බිලේෂා වීරරත්න)





- කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ ගල්ෆ් පර්යේෂණ කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද, 'ගල්ෆ් කලාපයේ මෑතකාලීන ශ්‍රම හා සංක්‍රමණ ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති: ආර්ථිකයන් සහ සමාජ කෙරෙහි ඇතිවන බලපෑම' යන මාතෘකාව යටතේ පැවති වැඩමුළුවේ දී **ගල්ෆ් සහයෝගිතා සභාවට අයත් රටවල ප්‍රමයින්ගේ අධ්‍යාපන ප්‍රතිඵල සහ රැකියා අපේක්ෂා කෙරෙහි සංක්‍රමණික සේවක ප්‍රතිපත්තිවල සහ බාහිර සිදුවීම්වල බලපෑම්** පිළිබඳ ඉදිරිපත් කිරීම, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය, ජූලි 11-13, (බිලේෂා වීරරත්න).

- TV1 රූපවාහිනී නාලිකාවේ ෆේස් ද නේෂන් වැඩසටහනේ 'බුද්ධි ගලනය' පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාවට සහභාගීවීම, අගෝස්තු 16, (බිලේෂා වීරරත්න).

- YouLead වැඩසටහන විසින් සංවිධානය කරන ලද, 'ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයන්ගේ කුසලතා, අපේක්ෂාවන් සහ නැවත සමාජගතවීමේ අභියෝග: ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක වලින් ලබාගත් සාක්ෂි' නැමති වාර්තාව දියත් කිරීමේ අවස්ථාවේ දී **ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයන්ගේ කුසලතා, අපේක්ෂාවන් සහ නැවත සමාජගතවීමේ අභියෝග: ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක වලින් ලබාගත් සාක්ෂි** පිළිබඳ ඉදිරිපත් කිරීම, අගෝස්තු 25, (බිලේෂා වීරරත්න).











- බැංකුකරණ අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද **රට නැවත ගොඩනැගීම සඳහා මානව ප්‍රාග්ධනය රඳවා තබා ගැනීම සහ පොහොසත් කිරීම** යන මාතෘකාව යටතේ සිදු කළ ප්‍රධාන දේශනය. ශ්‍රී ලංකා මහ බැංකුව, සැප්තැම්බර් 26, (බිලේෂා වීරරත්න)
- සංක්‍රමණ සඳහා වන ජාත්‍යන්තර සංවිධානය සහ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද, 'කොළඹ ක්‍රියාවලි නැවත ඒකාබද්ධ කිරීමේ දැනුම සංසදය' වැඩසටහනේ දී **නැවත සමාජගත කිරීමේ දැනුම සංසදයේ** විද්වත් මණ්ඩල සාමාජික, Courtyard Marriot, කොළඹ, දෙසැම්බර් 14, (බිලේෂා වීරරත්න).
- විදේශයන්හි ශ්‍රී ලංකාවේ කටයුතු පිළිබඳ කාර්යාලය විසින් සංවිධානය කරන ලද, **වඩා හොඳ ශ්‍රී ලංකාවක් සඳහා සැමරීම: විභවයන් මුදා හැරීම** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික, ජනාධිපති ලේකම් කාර්යාලය, දෙසැම්බර් 18, (බිලේෂා වීරරත්න).





■ ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය (TE Blog)

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 'ටෝකිං ඉකොනොමික්ස්' බ්ලොග් අඩවිය මගින් එහි නවතම සාක්ෂි පදනම් කරගත් සොයාගැනීම් බෙදා ගනියි.

- **දේශසීමා වලින් ඔබ්බට කුසලතා: ආපසු පැමිණෙන ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් සංක්‍රමණ ජයග්‍රහණය සඳහා කුසලතා වලින් සන්නද්ධවී සිටින්නේද?,** පියුමි රණදේව, ටෝකිං ඉකොනොමික්ස්, සැප්තැම්බර් 11.
- **ශ්‍රී ලංකාවේ සංක්‍රමණික සේවිකාවන්: අවිනිශ්චිත කාලයක් විදේශගත වීම,** මනීෂා වීරද්දන, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 8.

දරිද්‍රතාවය සහ සමාජ ශුභසාධනය

කොවිඩ්-19 වසංගතය සහ ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික අර්බුද, මෙරට දරිද්‍රතාවය අඩු කිරීමේ වැඩසටහන් සහ තිරසාර සංවර්ධන ඉලක්ක බොහොමයක් අත්කර ගෙන තිබූ ප්‍රගතිය ආපසු හැරවීමට හේතු වී තිබේ. මෙම බහු-මාන අර්බුද, දරිද්‍රතාවයේ මට්ටම් ගැඹුරු වීම සහ පුළුල් වීම, අසමානාත්මතාවය සහ අවදානම්සහගත භාවය ඉහළ යාම, සහ ළමයින් අතර මන්දපෝෂණය ඉහළ යාම ඇතුළු ගැටළු කිහිපයක් ඇති කරයි. කෙටි කාලීනව මෙම අර්බුදවල බලපෑම් අවම කිරීම සඳහා රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇතත්, අහිතකර බලපෑම් ආපසු හැරවීම සඳහා, විශේෂයෙන් ම දිළිඳු කොටස් කෙරෙහි ඇති වන බලපෑම අවම කිරීම සඳහා වඩාත් දිගුකාලීන ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. ඉහළ යමින් පවතින දරිද්‍රතා සහ අවදානම් මට්ටම් මගින් ආවරණය පුළුල් කළ හැකි සහ අවශ්‍යතා ඇති සියල්ලන්ට ම ප්‍රමාණවත් සහයෝගයක් ලබා දිය හැකි ශක්තිමත්, ඔරොත්තු දීමේ හැකියාව සහිත සහ ඒකාබද්ධ සමාජ ආරක්ෂණ පද්ධතියක් ගොඩනැගීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. තවද, ජනගහනයේ සියලු ම කොටස් සඳහා ඵලදායී රැකියා අවස්ථා සහ ගුණාත්මක සේවාවන් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමට පියවර ගත යුතු වේ.

දරිද්‍රතාවය සහ අවදානම්සහගත භාවය



කැනඩාවේ IDRC විසින් අරමුදල් සපයනු ලැබ, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ මැලේසියාවේ University Tenaga Nasional විශ්වවිද්‍යාලය සමඟ එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය **කොවිඩ්-19 වසංගතයෙහි සහ අනාගත වසංගත වල තර්ජන තක්සේරු කිරීම සහ පාලනය කිරීම සඳහා වන කෘතිම බුද්ධි රාමුව පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක්** (AI4COVID **ව්‍යාපෘතිය**) නිම කරන ලදී. එම පර්යේෂණයේ අරමුණු මතු සඳහන් පරිදි වේ: (අ) වසංගත පාලනය කිරීමේ උපාය මාර්ග යටතේ 'හඳුනාගන්නා ලද විවිධ කණ්ඩායම්වල' හැසිරීම හඳුනා ගැනීම, ආදර්ශනය කිරීම සහ පුරෝකථනය කිරීම පිණිස කෘතිම බුද්ධි ශිල්පීය ක්‍රම සකස් කිරීම; (ආ) ශ්‍රී ලංකාව සහ මැලේසියාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ගෝලීය දකුණේ හඳුන්වා දෙන ලද ලද මෙම උපායමාර්ගවල බලපෑම අවබෝධ කර ගැනීම; සහ, (ඇ) කොවිඩ්-19 හෝ ඒ හා සමාන බෝවන රෝගවල අනාගත ව්‍යාප්තිය පුරෝකථනය කිරීමට සහ කළමනාකරණය කිරීමට කෘතිම බුද්ධිය මත පදනම් වූ විසඳුම් සකස් කිරීම. එමෙන්ම, මෙම අධ්‍යයනය මගින් කාන්තාවන්, ළමයින් සහ අඩු වරප්‍රසාද ලත් කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කොවිඩ්-19 වසංගතයෙහි සමාජ-ආර්ථික බලපෑම ද විමර්ශනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ නිමැවුම් කිහිපයක් ඉදිරිපත් කරන ලද අතර, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ කෘතිම බුද්ධිය භාවිතා කිරීම පිළිබඳව සෞඛ්‍ය අංශයේ සේවකයින් දැනුවත් කිරීම සඳහා 'බලපෑම් සම්මන්ත්‍රණයක්' සහ වැඩමුළුවක් 2023 වර්ෂයේ දී සංවිධානය කරන ලදී.

ආර්ථික අර්බුදය සඳහා යුනිසෙෆ් සංවිධානයේ ශ්‍රී ලංකා කාර්යාලයේ ප්‍රතිචාර ලේඛනගත කිරීම පිළිබඳ අධ්‍යයනය මගින් අනාගතයේ එවැනි අර්බුද ඇති වුවහොත් මුහුණ දීමට සිදු වන අභියෝග, උගත් පාඩම් සහ සංවර්ධන හවුල්කරුවන්ට වඩා හොඳින් ස්ථානගත විය හැකි ආකාරය පිළිබිඹු කරමින්, පහත සඳහන් ක්ෂේත්‍ර ඇතුළු තේමාත්මක ක්ෂේත්‍ර හයක් ඔස්සේ යුනිසෙෆ් සංවිධානයේ ප්‍රතිචාර සමාලෝචනය කිරීමට සහ විශ්ලේෂණය කිරීමට අරමුණු කරයි: (i) සෞඛ්‍ය සහ පෝෂණය, (ii) සමාජ ප්‍රතිපත්ති, (iii) අධ්‍යාපනය, (iv) ළමා ආරක්ෂාව, (v) ජලය, සනීපාරක්ෂාව සහ සෞඛ්‍යාරක්ෂාව සහ (vi) සමාජ වර්යාවන් සහ වෙනස්වීම. යුනිසෙෆ් සංවිධානයේ දකුණු ආසියාව සඳහා වන කලාපීය කාර්යාලය මෙම අධ්‍යයනය සඳහා අරමුදල් සපයයි.

සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාව තුළ පුළුල් පරාසයක සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක වන නමුත් එම සමාජ ආරක්ෂණ පද්ධතිවල විසඳිය යුතු හිඩැස් සහ ගැටළු කිහිපයක් තිබේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අරමුදල් සපයනු ලැබ, දැනට සිදු කෙරෙමින් පවතින **අස්වැසුම් වැඩසටහනේ ඵලදායීත්වය ඇස්තමේන්තු කිරීම** පිළිබඳ අධ්‍යයනයෙහි අරමුණ වන්නේ එහි ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා විවිධ සුදුසුකම් නිර්ණායක යටතේ අස්වැසුම් වැඩසටහනෙහි මුදල් සහනාධාර ලබා දීම මගින් කුටුම්භ කෙරෙහි ඇති කරන බලපෑම අනුකරණය කිරීම සඳහා විශ්ලේෂණාත්මක රාමුවක් සකස් කිරීම ය.

ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය පිළිබඳ ක්‍රියාමාර්ගවල ශක්‍යතාවය සහ ඒවා හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනය මගින් (යුරෝපා සංගමය විසින් අරමුදල් සපයන ලද) ශ්‍රී ලංකාව තුළ සමාජ ආරක්ෂණයෙහි ඵලදායීත්වය, ඉලක්ක කිරීම සහ බෙදා හැරීම වැඩිදියුණු කිරීම සඳහා සහාය වීමට අරමුණු කරන ලදී. උපදේශන අදියරේදී, මෙම ව්‍යාපෘතිය විසින් දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වැඩිදියුණු කිරීමේ ප්‍රවේශය ක්‍රියාවට නැංවීමට සහාය වීම සහ සමාජ ආරක්ෂණ අංශයේ ඩිජිටල් තාක්ෂණයන් වැඩිදියුණු කිරීමට සහාය වීම ඇතුළුව සමාජ ආරක්ෂණ අංශය තුළ සහාය සපයා දිය යුතු ක්ෂේත්‍ර කිහිපයක් හඳුනා ගන්නා ලදී.



සමාජ ආරක්ෂණ අංශයේ ගැටළු සහ අවශ්‍යතා සාකච්ඡා කිරීම පිණිස ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමා සහ රජයේ නිලධාරීන් අතර පැවති හමුව. (https://www.ft.lk/news/EU-to-helpimprove-the-social-security-system-in-Sri-Lanka/56-744865)

■ ප්‍රකාශන: වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත සහ ලිපි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි පුළුල් පරාසයක ප්‍රකාශන සහ ප්‍රකාශන වේදිකා ඔස්සේ කාලීන ගැටළු පිළිබඳ පර්යේෂණ නිමැවුම් ප්‍රචාරණය කරයි.









- **ශ්‍රී ලංකාවේ බහුමාන අර්බුදය: අවධානම් සහගති කණ්ඩායම් කෙරෙහි බලපෑම,** ගංගා තිලකරත්න සහ ලක්ෂිලා වනිගසිංහ, ට්‍රේඩ් ඉන්සයිට්, 18 වෙනි වෙළුම, අංක 1-4, SAWTEE, නේපාලය.
- **කාල දරිද්‍රතාවය සහ ආදායම් දරිද්‍රතාවය අතර සම්බන්ධය: ශ්‍රී ලංකාවේ උදාහරණය,** හිමානි විතානගේ සහ දුනුසිංහ, පී.එම්., ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සඟරාව, 10(2), පි. 71 - 95.
- **කොවිඩ්-19 වසංගතයේ බහුවිධ රැළි හරහා ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික හා චර්යාත්මක බලපෑම් පිළිබඳ දත්ත කට්ටලයක්,** ගංගා තිලකරත්න සහ AI4COVID පර්යේෂණ කණ්ඩායම, සමාජ විද්‍යා පර්යේෂණ ජාලය, 2023 නොවැම්බර්.
- **ආහාර සුරක්ෂිතතාවය,** ලක්ෂිලා වනිගසිංහ, තිරසාර සංවර්ධනය පිළිබඳ පරිවර්තන සිතියම, ලෝක ආර්ථික සංසදය (WEF), මාර්තු 2023.

■ ශ්‍රී ලංකා රජයේ කමිටු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයන්ට දායක වෙමින්, රජයේ ප්‍රතිපත්ති කමිටුවලට ආරාධිත සහභාගීත්වය සපයා දීම හරහා ජාතික ප්‍රතිපත්ති ගැටලුවලට සහාය දැක්වීමට සහ ආමන්ත්‍රණය කිරීමට ස්වකීය පර්යේෂණ සාක්ෂි භාවිතා කරයි. 2023 වර්ෂයේ දී, ආයතනය පහත සඳහන් කමිටු හරහා යෙදවුම් සපයා දෙන ලදී:

- ශ්‍රී ලංකාවේ ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය සකස් කර නිම කිරීමේ තාක්ෂණික කමිටුව, මුදල් අමාත්‍යාංශය (ගංගා තිලකරත්න)
- සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීමේ අනුකමිටුව, කම්කරු අමාත්‍යාංශය (නිශා අරුණාතිලක)



■ පර්යේෂණ ඉදිරිපත් කිරීම්/සාකච්ඡා

- බංග්ලාදේශයේ ධකා නුවර පැවති 14 වෙනි දකුණු ආසියා ආර්ථික සමුළුවේ දී **'මහජන සෞඛ්‍යය පිළිබඳ කලාපීය සහයෝගිතාව'** පිළිබඳ සැසියේ විද්වත් මණ්ඩල සාමාජික, 2023 නොවැම්බර් 4-5 (ගංගා තිලකරත්න)
- එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා හදිසි අරමුදල විසින් සංවිධානය කරන ලද, **ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දත්තවල වැදගත්කම: ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය 2019 ප්‍රතිඵල: ජාතික සහ ළමා විශ්ලේෂණ** වළිදැක්වීමේ උත්සවය, පිළිබඳ සාකච්ඡාවක විද්වත් මණ්ඩල සාමාජික, ගෝල් ෆේස් හෝටලය, අප්‍රේල් 28 (නිශා අරුණාතිලක).
- යුනිසෙෆ් සංවිධානයේ දකුණු ආසියාණු කලාපීය කාර්යාලය විසින් සංවිධානය කරන ලද වැඩමුළුවකදී **'ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට යුනිසෙෆ් සංවිධානයේ ප්‍රතිචාරය'** පිළිබඳ ඉදිරිපත් කිරීම. (මාර්ගගත) 2023 දෙසැම්බර් 13 (ගංගා තිලකරත්න)

■ අදහස් වේදිකා

- 2023 ඔක්තෝබර් 14 වැනි දින 'ද මෝර්නිං' පුවත්පතේ **'Social Protection Systems Far from Perfect'** නැමති මාතෘකාව යටතේ පැවති සම්මුඛ සාකච්ඡාව (ගංගා තිලකරත්න විසිනි)
- **ශ්‍රී ලංකාව සහ තිරසාර සංවර්ධන ඉලක්ක: කොවිඩ්-19 වසංගතයෙහි සහ ආර්ථික අර්බුදයෙහි බලපෑම්,** පොලිසි ඉන්සයිට්ස්, ජනවාරි 12.
- **ශුභසාධනය ප්‍රතිසංස්කරණය කිරීම: අස්වැසුම යනු ශ්‍රී ලංකාවේ දුප්පතුන් අපේක්ෂා කරන ගැලවීමද?**, ලක්ෂිලා වනිගසිංහ, ටෝකිං ඉකොනොමික්ස්, සැප්තැම්බර් 5.

කෘෂිකර්මය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මාන්ත අංශය අඩු ඵලදායිතාවය, අකාර්යක්ෂම සම්පත් භාවිතය සහ තිරසාර නොවන කෘෂිකාර්මික පිළිවෙත් හේතුවෙන් දැඩි බලපෑමට ලක්වී තිබේ. අඩු ඵලදායිතාවය, භාණ්ඩ මිල උච්ඡාවචනය වීම සහ අධික නිෂ්පාදන පිරිවැය හේතුවෙන් අපනයනය ඉලක්ක කරගත් වැවිලි අංශය ද අර්බුදයකට ලක්ව ඇත. මේ සියල්ල රටේ ආහාර අනාරක්ෂිතභාවය, මන්දපෝෂණය සහ දරිද්‍රතාවයට දායක වෙයි. මේම ගැටළු හඳුනා ගනිමින් රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා උසස් තාක්ෂණික නවෝත්පාදන භාවිතා කිරීමට, දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන ධීවර හා කිරි නිෂ්පාදන ඇතුළුව ආරක්ෂිත සහ පෝෂ්‍යදායී ආහාර සඳහා ප්‍රවේශය සහතික කිරීමට, සුනුරු ව්‍යාපාර පිළිවෙත් තුළින් ආහාර හානි අවම කිරීමට සහ නව අගය එකතු කළ අපනයන වැඩි කිරීමට අපේක්ෂා කරයි.

ආහාර සුරක්ෂිතතාව

ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) විසින් **ප්‍රතිපත්ති පර්යේෂණ ධාරිතාව සහ බලපෑම** (PRCI) වැඩසටහන යටතේ අරමුදල් සපයනු ලැබ මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලය (MSU) සහ ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය (IFPRI), වොෂින්ටන් ඩී.සී., ඇතුළු හවුල්කරුවන් සමූයක් විසින් ක්‍රියාත්මක කරන ලද, **සාම්ප්‍රදායික ගොවිතැනේ සිට කාබනික ගොවිතැනට මාරුවීම: ශ්‍රී ලංකාවේ රසායනික පොහොර තහනම් කිරීමේ සිදුවීම** පිළිබඳ අධ්‍යයනයක් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් නිම කරන ලදී. රසායනික පොහොර තහනම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සහල් අංශයට ඇති වන බලපෑම් ඇගයීම මෙම අධ්‍යයනයේ සමස්ත අරමුණ විය. මෙම අධ්‍යයනය මගින් සැලසුම් නොකර රසායනික පොහොර තහනම් කිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙහි ඇඟවීම් පිළිබඳ සාක්ෂි ජනනය කරන ලද අතර, ඉදිරි මග පිළිබඳව වැදගත් යෝජනා ද ඉදිරිපත් කරන ලදී.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය **කලාපීය උපායමාර්ගික විශ්ලේෂණය සහ දැනුම සහාය පද්ධතිය** (ReSAKSS) - **ආසියාව** වැඩසටහන යටතේ ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය විසින් අරමුදල් සපයන ලද **යුක්‍රේන යුද්ධය මගින් ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන ආහාර සුරක්ෂිතතා ගම්‍යමානයන්** පිළිබඳ තවත් අධ්‍යයනයක් නිම කළේය. මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය, කෘෂිකර්මාන්තය සහ ආහාර සුරක්ෂිතතාය අතර ඇති සම්බන්ධතාවය මත යුක්‍රේනයේ වර්ධනය වෙමින් පවතින අර්බුදයේ බලපෑම සහ අපනයන සීමා කිරීම්, ආනයන වියදම් ඉහළ යාම සහ උද්ධමනය යන ඍණාත්මක ඇඟවීම් අවම කිරීම සඳහා අනුගමනය කළ හැකි මාර්ග ගවේෂණය කරන ලදී.

ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) විසින් **ප්‍රතිපත්ති පර්යේෂණ ධාරිතාව සහ බලපෑම** (PRCI) වැඩසටහන යටතේ අරමුදල් සපයනු ලැබ මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලය සහ ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය ඇතුළු හවුල්කරුවන් සමූයක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, **කෘෂිකර්මාන්තය, ආහාර සුරක්ෂිතතාවය සහ ගෘහ සුභසාධනය කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම යන මාතෘකාව** යටතේ දැනට සිදු කෙරෙමින් පවතින අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවි පවුල්වල ජීවනෝපාය කෙරෙහි දේශගුණික විපර්යාසවලින් ඇතිකරන බලපෑම අවබෝධ කර ගැනීමට අරමුණු කරයි. මෙම අධ්‍යයනය මගින් ගොවීන්ට දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීමට ඇති විවිධ අනුවර්තන ක්‍රමෝපායන්, මුහුණ දීමේ යාන්ත්‍රණ සහ අනුවර්තනයවීම සඳහා ඇති බාධක විශ්ලේෂණය කරයි.

කෘෂිකර්ම ප්‍රතිපත්ති සහ ආයතන

කොළඹ පිහිටි ශ්‍රී ලංකාවේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමග සහයෝගීත්වයෙන් යුතුව **ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ රට පිළිබඳ වැඩසටහන්කරණ රාමුව** 2023-2027 පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනය මගින් දැනට තිබෙන ලිපිලේඛන පිළිබඳ සමාලෝචනයක් හරහා සහ අදාළ රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමග සාකච්ඡා කර ආහාර සහ කෘෂිකර්මාන්ත, ධීවර, පශු සම්පත්, වනාන්තර, සහ පරිසරය යන අංශවල ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රමුඛතා හඳුනාගෙන ඇත.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ඔස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය සමග එක්ව **දකුණු ආසියාව සඳහා කෘෂිකර්මාන්ත අංශයේ දේශගුණික අනුවර්තනය සහ අන්තර්කරණය වූ සංවර්ධනය** පිළිබඳව සිදු කරන ලද තවත් අධ්‍යයනයක් මගින්, අන්තර්කරණය වූ සංවර්ධනය සඳහා දේශගුණ අනුවර්තනය අභිප්‍රේරණ ඉලක්කය ලෙස ගනිමින්, දකුණු ආසියාවේ කෘෂිකාර්මික හා ග්‍රාමීය ආර්ථික පරිවර්තනය සඳහා ප්‍රතිපත්ති-පර්යේෂණ අතුරු මුහුණතෙහි ඵලදායී ප්‍රතිපත්ති සංවර්ධනයට සහ ධරිතාවය වැඩි දියුණු කිරීමට ඇති බාධක හඳුනා ගන්නා ලදී.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අරමුදල් සපයන ලද, **දුම්කොළ ගොවීන් විකල්ප වගා සඳහා පරිවර්තනය කිරීම: ක්‍රියාකාරී සැලැස්මක්** නැමති දැනට සිදු කෙරෙමින් පවතින අධ්‍යයනයට විකල්ප භෝග හඳුනා ගැනීම මගින් දුම්කොළ වගාව සඳහා යොදාගෙන ඇති ඉඩම් ප්‍රමාණය අඩු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම ඇතුළත් වේ. මෙම අධ්‍යයනය මගින් විවිධ දිස්ත්‍රික්කවල පවතින සාපේක්ෂ ලාභදායීත්වය, කෘෂි තෑ විද්‍යාත්මක කලාප සහ අවස්ථා පදනම් කර ගෙන, ගොවීන්ට සමාන ආර්ථික ශක්‍යතාවයක්, වගා විභවයක් සහ අගය දාම සහාය සපයා දිය හැකි විකල්ප භෝග කෙරෙහි අවධානය යොමු කරයි.

ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සමග එක්ව දැනට සිදුකරමින් පවතින **ශ්‍රී ලංකාවේ අන්තර්කරණය වූ කෘෂිකාර්මික පරිවර්තනය සම්බන්ධ රාජ්‍ය වියදම් පිළිබඳ විශ්ලේෂණය** නැමති අධ්‍යයනයට උප අංශ හෝ ආයතන අතර අවධානය යොමු කිරීම මාරුවී ඇති ආකාරය සොයා බැලීම සඳහා ඓතිහාසික වියදම් ප්‍රවනතා පරීක්ෂා කිරීම මෙන්ම අරමුදල් අඩුවෙන් සපයා දෙන සහ අරමුදල් අධික ලෙස සපයා දෙන යන උප අංශ දෙක ම ඉස්මතු කරමින් අරමුදල්වල වර්තමාන බෙදීයාම පරීක්ෂා කිරීම ඇතුළත් වේ.

කෘෂි ව්‍යාපාර අගය දාම

ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා වන ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය සමග එක්ව **සුහුරු ව්‍යාපාර පිළිවෙත් හරහා පකිස්තානයේ සහ ශ්‍රී ලංකාවේ ආහාර හානි අවම කිරීමේ මාර්ග සකස් කිරීම** නැමති දැනට සිදු කෙරෙමින් පවතින අධ්‍යයනය මඟින්, පකිස්තානයේ සහ ශ්‍රී ලංකාවේ කුඩා වතු හිමි ගොවි ප්‍රජාවන් සඳහා දිගුකාලීන ආහාර සුරක්ෂිතතාවය සහ තිරසාර බලපෑම් නිර්මාණය කර දෙන නව්‍ය, දේශීය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන විසඳුම් හරහා අඹ සහ තක්කාලි වගාවන්හි අගය දාමවල ආහාර හානිය විසඳීමට ප්‍රයත්න දරනු ලැබේ.


■ ප්‍රකාශන: වාර්තා, පොත්වල පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත සහ ලිපි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි පුළුල් පරාසයක ප්‍රකාශන සහ ප්‍රකාශන වේදිකා ඔස්සේ කාලීන ගැටළු පිළිබඳ පර්යේෂණ නිමැවුම් ප්‍රචාරණය කරයි.









- **ශ්‍රී ලංකාවේ දුම්කොළ ගොවිතැන පරිවර්තනය කිරීම: අගය දාම විශ්ලේෂණයක්,** නිමේෂා දිසානායක, ඩිලානි හිරිමුතුගොඩගේ සහ මනෝජ් තිබ්බොටුවාව, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රකාශන මාලා අංක 11, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජනවාරි 2023.
- **යුක්‍රේන යුද්ධය සහ ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි එය ඇතිකරන ඇඟවීම්,** මනෝජ් තිබ්බොටුවාව, නිමේෂා දිසානායක, සහ සචිනි නිවර්තනා, ප්‍රතිපත්ති සටහන අංක 24, ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය, වොෂිංටන් ඩී.සී., පෙබරවාරි 2023.
- **වී වගා අංශය කෙරෙහි රසායනික පොහොර තහනම මඟින් ඇතිකරන බලපෑම: ප්‍රවණතා ලකුණු ගැලපීම සහ අගය දාම විශ්ලේෂණය,** සචිනි නිවර්තනා, නිමේෂා දිසානායක, මනෝජ් තිබ්බටුවාව, සහ රෝහිත රොසෙයිරෝ, පර්යේෂණ පත්‍රිකා අංක 21, 'ෆීඩ් ද ෆියුචර්', එක්සත් ජනපද රජයේ ගෝලීය කුසගිනි සහ ආහාර සුරක්ෂිතතා වැඩසටහන, මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලය, එක්සත් ජනපදය, සැප්තැම්බර් 2023.
- **දකුණු ආසියාවේ කෘෂිකාර්මාන්ත අංශයේ සංවර්ධන සන්දර්භය සහ ප්‍රතිපත්ති අභියෝග,** මනෝජ් තිබ්බොටුවාව, අසංක විජේසිංහ, බිලේෂා වීරරත්න, නිශා අරුණතිලක, තිලක් මල්ලවාරච්චි, සහ ක්ලිවෝ විල්සන්, වාර්තා අංක FR 2023-050, කත්මණ්ඩු නුවර පැවති 'Policy-Research Interface Mediation and Enabling (PRIME)' Workshop. නැමති වැඩමුළුව සඳහා සකස් කරන ලද පසුබිම් පත්‍රිකාව, ACIAR, කැන්බරා, ඔස්ට්‍රේලියාව, 2023 නොවැම්බර්.

■ ශ්‍රී ලංකා රජයේ කමිටු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රජයේ ප්‍රතිපත්ති කමිටුවල සක්‍රීය ලෙස නියැළීම හරහා රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයට සාක්ෂි පදනම් කර ගත් යෙදවුම් සපයා දෙමින් ජාතික ප්‍රතිපත්ති ගැටලු ආමන්ත්‍රණය කරයි. 2023 වර්ෂයේ දී, පහත සඳහන් කමිටුවලට සහභාගීවීම හරහා යෙදවුම් සපයා දෙන ලදී:

- ආහාර හා පෝෂණ ආරක්ෂණ කමිටුවේ ප්‍රතිපත්ති සහ නියාමන මැදිහත්වීම් පිළිබඳ විශේෂඥ පර්ෂදය, ජනාධිපති ලේකම් කාර්යාලය (මනෝජ් තිබ්බොටුවාව).
- කෘෂිකාර්ම ආංශික කමිටුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (මනෝජ් තිබ්බොටුවාව).
- සුළු අපනයන භෝග සඳහා භූගෝලීය දර්ශක ක්‍රමෝපායය ක්‍රියාත්මක කිරීමේ ජාතික කමිටුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (ඩිලානි හිරිමුතුගොඩගේ).

■ පර්යේෂණ ඉදිරිපත් කිරීම්/ සාකච්ඡා



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දේශීයව සහ ජාත්‍යන්තර වශයෙන් විවිධ සැසි සහ සංසද වලදී කථිකයා, සාකච්ඡාකරු, විද්වත් මණ්ඩල සාමාජික සහ උපදේශක යන භූමිකා ඉටුකරමින්, ප්‍රතිපත්ති නියැළීම් සහ සාකච්ඡා සඳහා පර්යේෂණ පදනම් වූ යෙදවුම් පිරිනමයි.

- 'දකුණු ආසියාවේ කෘෂිකාර්මාන්තයේ අඟය දාම වැඩි දියුණු කිරීම' නැමති මාතෘකාව යටතේ පැවති ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමයේ '16 වෙනි වාර්ෂික පර්යේෂණ සංසදයේ දී' **සහල්වල අඟය දාම විශ්ලේෂණය: රසායනික පොහොර තහනමෙන් උගත් පාඩම්** පිළිබඳ ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජනවාරි 20 (මනෝජ් තිබ්බොටුවාව).

- ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථිකවිද්‍යා සංගමයේ '16 වෙනි වාර්ෂික පර්යේෂණ සංසදයේ' දී **ඉඩම් හිමියන්ගේ කුඹුරු ඉඩම් උරුමක්‍රමය සැලසුම් කිරීමේ සමාජ-ආර්ථික නිර්ණායක** පිළිබඳ ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජනවාරි 20 (සුලෝචනා සිල්වා).

- ශ්‍රී ලංකා ආර්ථික විද්‍යාඥයින්ගේ විශ්වවිද්‍යාල සංසදයේ 'ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සමුළුව 2022' අවස්ථාවේදී **කුඹුරු ඉඩම්වල වර්තමාන ක්‍රියාකරුගේ පවුල් තුළ උරුම ක්‍රම සැලැස්ම තෝරාගැනීම කෙරෙහි බලපාන උරුමකරුවන්ගේ ලක්ෂණ** පිළිබඳ ඉදිරිපත් කිරීම, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, (සුලෝචනා සිල්වා).





- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය විසින් සත්කාරකත්වය දරන ලද, '9 වෙනි වාර්ෂික උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය (UReS - 2022)', අවස්ථාවේදී **ආර්ථික ප්‍රතිපාප්තිය සඳහා තිරසාර ආහාර පද්ධති** පිළිබඳ මුඛ්‍ය දේශනය පවත්වන ලදී, පෙබරවාරි 16, (මනෝජ් තිබ්බොටුවාව)

- ඝානා විශ්වවිද්‍යාලය සහ සංඛ්‍යාන, සමාජ, සහ ආර්ථික පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද 'ප්‍රතිපත්ති පර්යේෂණ ධාරිතාව සහ බලපෑම ගෝලීය හමුවේදී', **ප්‍රතිපත්තිවලට අනුබලය දීම පිණිස පර්යේෂණ ආයතනවල ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා වඩාත් සහයෝගී පර්යේෂණ සහ පුහුණුවීම් සිදුකිරීමේ වැදගත්කම** පිළිබඳ ඉදිරිපත් කිරීම, ඇක්රා, ඝානාව, අප්‍රේල් 25-27, (මනෝජ් තිබ්බොටුවාව).

- ආසියානු සංවර්ධන බැංකු ආයතනය සහ ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද **'ප්‍රතිපත්ති-පර්යේෂණ අතුරුමුහුණත් මැදිහත්වීමේ සහ සක්‍රීය කිරීමේ වැඩමුළුව: දකුණු ආසියාවේ කෘෂිකාර්මික අංශයේ දේශගුණ අනුවර්තනය සහ අන්තර්කරණය වූ සංවර්ධනය'** නැමති වැඩමුළුවේ දී **වර්තමාන කෘෂිකාර්මික පිළිවෙත් සහ වෙළඳාමෙහි සෞඛ්‍ය, පෝෂණ සහ සමාජමය බලපෑම්** පිළිබඳ ඉදිරිපත් කිරීම, කත්මණ්ඩු, නේපාලය, ජුනි 12-16, (අසංක විජේසිංහ).

- ආසියානු සංවර්ධන බැංකු ආයතනය සහ ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද **'ප්‍රතිපත්ති-පර්යේෂණ අතුරුමුහුණත් මැදිහත්වීමේ සහ සක්‍රීය කිරීමේ වැඩමුළුව: දකුණු ආසියාවේ කෘෂිකාර්මික අංශයේ දේශගුණ අනුවර්තනය සහ අන්තර්කරණය වූ සංවර්ධනය'** නැමති වැඩමුළුවේ දී **දකුණු ආසියානු රටවල කෘෂිකර්ම අංශය මුහුණ දෙන ප්‍රධාන ප්‍රතිපත්ති අභියෝග** පිළිබඳ ඉදිරිපත් කිරීම, කත්මණ්ඩු, නේපාලය, ජුනි 12-16, (මනෝජ් තිබ්බොටුවාව).

- 'සද්ධර්ම වොයිස්' සංවිධානය විසින් සංවිධානය කරන ලද **ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අනාගතය සඳහා ප්‍රමුඛතා** පිළිබඳ සාකච්ඡාවක විද්වත් මණ්ඩල සාමාජික, මාර්ගගත, ජූනි 20, (ලක්ෂිලා වනිගසිංහ).

- ACIAR ශ්‍රී ලංකා සංරචකයේ ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී **අපනයනය සඳහා TomEJC අඹ නිෂ්පාදනය පිළිබඳ දැනුම් ලබා දීම** පිළිබඳ ඉදිරිපත් කිරීම, ඕක් රේ රිජන්සි හෝටලය, මහනුවර නොවැම්බර් 23 (චන්දුල ඉදිරිසිංහ).

පරිසරය, ස්වභාවික සම්පත්, සහ දේශගුණික විපර්යාස

ගෝලීය දේශගුණික විපර්යාස වලින් විල්ලවන තර්ජනය මගින් වර්ධනය යනු අඩු කාබන් සහ දේශගුණික ප්‍රත්‍යාවර්තී වර්ධනයක් විය යුතු ය අමතර කොන්දේසිය පනවා ඇත. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් 'තිරසාර පරිසර කළමනාකරණය' ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 10 න් එකක් ලෙස හඳුනාගෙන ඇත. එයට අමතරව, එය විදුලිබලය හා බලශක්තිය, ජලය, ආපදා කළමනාකරණය සහ අලි-මිනිස් ගැටුම යන ක්ෂේත්‍ර සඳහා ද ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ගණනාවක් යෝජනා කරයි. මෙම රාමුව පරිසරය හා ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමේ අති ඉමහත් වැදගත්කම අවධාරණය කරයි.

පරිසර සහ ස්වභාවික සම්පත් ප්‍රතිපත්ති

ඒකාබද්ධ කඳුවැටි සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICIMOD) සමග හවුල්කාරිත්වයෙන් යුතුව **වනාන්තර ප්‍රතිසංස්කරණයේ ආර්ථිකවිද්‍යාව: ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්කවල වන භූ දර්ශන ප්‍රතිසංස්කරණය** නැමති මාතෘකාව යටතේ සිදු කරනු ලබන අධ්‍යයනය, දකුණු ආසියාවේ ස්වභාව ධර්මය පදනම් කරගත් විසඳුමක් ලෙස මෙන්ම කාබන් අවම කිරීමේ විකල්පයක් ලෙස ද විවිධ ආකාරවල වනාන්තර ප්‍රතිසංස්කරණ වැඩසටහන්වල (වගා සහ ස්වභාවික පුනර්ජනනය යන දෙයාකාරයේ ම) කාබන් ඩයොක්සයිඩ් (CO2) අඩු කිරීමේ විභවයෙහි ආර්ථිකවිද්‍යාව පිළිබඳ විමසා බැලෙන අධ්‍යයනයකි.

දේශගුණික විපර්යාස

ඉන්දියාවේ IPE Global සමග එක්ව දැනට සිදු කරමින් තිබෙන, **ශ්‍රී ලංකාවේ දේශගුණ සුහුරු කෘෂිකර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්ති සමාලෝචනය** නැමති අධ්‍යයනය මගින් දකුණු ආසියාවේ ආහාර පද්ධති කෙරෙහි අවධානය යොමු කරමින්, ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස සහ කෘෂි-ආහාර පද්ධති ආශ්‍රිත ප්‍රතිපත්ති සන්දර්භය විශ්ලේෂණය කරන අතර, දේශගුණික අනුවර්තනය සඳහා හවුල්කාරිත්ව සහ ආයෝජන අවස්ථා හඳුනා ගනියි.

■ ප්‍රකාශන: වාර්තා, පොත්වල පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත සහ ලිපි



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි පුළුල් පරාසයක ප්‍රකාශන සහ ප්‍රකාශන වේදිකා ඔස්සේ කාලීන ගැටළු පිළිබඳ පර්යේෂණ නිමැවුම් ප්‍රචාරණය කරයි.

- **සමාජ, ආර්ථික සහ පාරිසරික ක්ෂේත්‍ර පුරා ව්‍යාපාර තිරසාරභාවය,** චිරන්දතී පතිරාජ, ලංකා මන්ත්ලි ඩයිජස්ට්, 2023 ජූනි.
- **මිනිස්-වනජීවී සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා රක්ෂණය: රජයන්, සංරක්ෂණවේදීන් සහ රක්ෂණකරුවන් සඳහා මාර්ගෝපදේශයක්,** මනෝජ් තිබ්බොටුවාව, පරිසරය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර ආයතනය, ලන්ඩන්, එක්සත් රාජධානිය, සැප්තැම්බර් 2023

■ ශ්‍රී ලංකා රජයේ කමිටු

ප්‍රතිපත්ති සහාය තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා කර්මාන්තවල දේශගුණික ප්‍රතිචාර කඩිනම් කිරීම, UNIDO සමග සක්‍රීයව සම්බන්ධ වීමෙන්, පරිසර අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයට සාක්ෂි මත පදනම් වූ යෙදවුම් සපයා දෙන ලදී.

■ පර්යේෂණ ඉදිරිපත් කිරීම්/ සාකච්ඡා

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දේශීයව සහ ජාත්‍යන්තර වශයෙන් විවිධ සැසි සහ සංසද වලදී කථිකයා, සාකච්ඡාකරු, විද්වත් මණ්ඩල සාමාජික සහ උපදේශක යන භූමිකා ඉටුකරමින්, ප්‍රතිපත්ති නියැළීම් සහ සාකච්ඡා සඳහා පර්යේෂණ පදනම් වූ යෙදවුම් පිරිනමයි.

- 'ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 9 වෙනි ජාත්‍යන්තර සමුළුවේ දී **'වඩාත් හරිත හෙට දිනයක් සඳහා දේශගුණික විපර්යාස සහ තිරසාර අධ්‍යාපනය'** පිළිබඳ සැසියක විද්වත් මණ්ඩල සාමාජික, මොනාක් ඉම්පීරියල් හෝටලය, දෙසැම්බර් 8, (චිරන්දනී පතිරාජ)

■ ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය (TE Blog)

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 'ටෝකිං ඉකොනොමික්ස්' බ්ලොග් අඩවිය එහි නවතම සාක්ෂි පදනම් කරගත් සොයාගැනීම් ප්‍රචාරණය කරයි.

- **එක්ස්ප්‍රස් පර්ල් ව්‍යසනය: ගිනිදැල්වල සිට වළක්වා ගැනීම දක්වා,** රුවන් සමරවීර, ටෝකිං ඉකොනොමික්ස්, මැයි 3.
- **ශ්‍රී ලංකාවේ කටුපොල් කර්මාන්තය: ආර්ථික ප්‍රතිලාභ සහ පාරිසරික තිරසාරත්වය සමබර කර ගැනීම,** චිරන්දනී පතිරාජ, ටෝකිං ඉකොනොමික්ස්, ජූනි 7.
- **සංරක්ෂණය සහ ජීවනෝපායන් අතර පරතරය පිරවීම: ලෝක අලි ඇතුන් පිළිබඳ දිනයේ දී ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම ආමන්ත්‍රණය කිරීම,** රුවන් සමරවීර, ටෝකිං ඉකොනොමික්ස්, අගෝස්තු 10.

පර්යේෂණ කාර්ය මණ්ඩලය



දුෂ්නි විරකෝන්
BSc (ක්වීන්ස් විශ්වවිද්‍යාලය බෙල්ෆාස්ට්), MA, PhD (මැන්චෙස්ටර්)
විධායක අධ්‍යක්ෂ



නිශා අරුණතිලක
BSc (දකුණු අ.ඒ.ජ. විශ්වවිද්‍යාලය), MA, PhD (ඩියුක්)
පර්යේෂණ අධ්‍යක්ෂ



ගංගා තිලකරත්න
BA (මැන්චෙස්ටර්)
MPhil (කැන්ටබ්)
PhD (මැන්චෙස්ටර්)
පර්යේෂණ සාමාජික



බිලේෂා විරරත්න
BA (කොළඹ)
MA (Rutgers)
PhD (CUNY)
පර්යේෂණ සාමාජික



මනෝජ් තිබ්බොටුවාවල
BSc, MSc (පේරාදෙණිය)
PhD (බටහිර ඕස්ට්‍රේලියාව)
පර්යේෂණ සාමාජික



අසංක විජේසිංහ
BSc (පේරාදෙණිය)
MS (උතුරු ඩැකෝටා),
PhD (ඔහියෝ)
පර්යේෂණ සාමාජික



චිරන්දනී පතිරාජ
BSc, MPhil (පේරාදෙණිය)
PhD (මෙල්බර්න්)
පර්යේෂණ සාමාජික



ලක්මිණි ප්‍රනාන්දු
BSc (පේරාදෙණිය)
MDevEcon (ක්වීන්ස්ලන්තය),
PhD (ඇඩිලේඩ්)
පර්යේෂණ සාමාජික

පර්යේෂණ කාර්ය මණ්ඩලය



පුලස්ති අමරසිංහ
BSc (මේරිලන්ඩ්),
MSc (අයෝවා),
PhD (UNC-Chapel Hill)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ



ප්‍රියංකා ජයවර්ධන
BSc (කොළඹ)
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ



සුනිමලී මදුරාවල
BA (කොළඹ)
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ



ඩිලනි හිරිමුතුගොඩගේ
BA (කොළඹ)
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ



අශානි අබයසේකර
BA (පේරාදෙණිය)
MA (ANU)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ
(ඕස්ට්‍රේලියාවේ මොනෂ් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි අධ්‍යයන නිවාඩු)



රුවන් සමරවීර
BSc (ඌව වෙල්ලස්ස)
පර්යේෂණ නිලධාරී (එක්සත් රාජධානියේ නොටින්හැම් ට්‍රෙන්ට් විශ්ව විද්‍යාලයේ MSc උපාධි අපේක්ෂක, අධ්‍යයන නිවාඩු)



ලක්ෂිලා වනිගසිංහ
BA (SIUC)
MSc (SIUC)
පර්යේෂණ නිලධාරී



කිමුතු කිරින්ගොඩ
BA (කොළඹ), LLB (ලන්ඩන්)
MSc (බෙඩ්ෆර්ඩ්ෂයර්)
පර්යේෂණ නිලධාරී



සුරේෂ් රණසිංහ
MSc (නොටින්හැම්), BA (කොළඹ), LLB (O.U.S.L.), AAL
පර්යේෂණ නිලධාරී



රමේෂා නිලුපුලි රත්නායක
BA (කොළඹ), MSc (නොටින්හැම්)
පර්යේෂණ නිලධාරී



ඌෂා පෙරේරා
BA (කොළඹ)
MSc අපේක්ෂක, ලීඩිස් (අධ්‍යයන නිවාඩු),
පර්යේෂණ නිලධාරී



පියුමි රණදේව
BSc (වයඹ)
පර්යේෂණ සහකාර



මනීෂා විරද්දන
BA (පේරාදෙණිය)
පර්යේෂණ සහකාර



හිමානි විතානගේ
BA (කොළඹ), BSc (LSE)
පර්යේෂණ සහකාර



චායා දිසානායක
BSc (Jaffna)
පර්යේෂණ සහකාර



සුලෝචනා සිල්වා
BSc (පේරාදෙණිය)
පර්යේෂණ සහකාර



චන්දුල ඉදිරිසිංහ
BSc (පේරාදෙණිය)
පර්යේෂණ සහකාර



නිශාමිණී ඉහළගෙදර
BSc (පේරාදෙණිය)
පර්යේෂණ සහකාර

සහාය කාර්යමණ්ඩලය



ගයනි කල්දේරා
ACA, BSc (ජයවර්ධනපුර)
අධ්‍යක්ෂ මූල්‍ය සහ පරිපාලන



නන්දක පොතුවැව
BSc (කැලණිය)
තොරතුරු පද්ධති ප්‍රධානී



ඩිනාලි පෙරේරා
කළමනාකරු - ප්‍රකාශන සහ උත්සව



දිලිනි ගල්කැටිය
BSc (පේරාදෙණිය) MBA (කොළඹ)
කළමනාකරු - මානව සම්පත් සහ පරිපාලනය



ගිත්මා චන්ද්‍රසේකර
BA (කොළඹ), MSc (Leiden)
කළමනාකරු- සන්නිවේදන සහ ක්‍රමෝපායික මහජන සම්බන්ධතා



ගයේන්ද්‍ර කරුණාරත්න
සංස්කාරක



නාලක ලියනපතිරණ
වෙබ් කළමනාකරු සහ පද්ධති පරිපාලක



තුවාන් බංසජයා
පහසුකම් කළමනාකරණ නිලධාරී



මධුෂා හෙට්ටිආරච්චි
සහකාර ගණකාධිකාරී



විශාකා නර්මදා
සහකාර පුස්තකාලයාධිපති



තාරක මුදන්නායක
රහස්‍ය ලේකම්



අමේෂ් තෙන්නකෝන්
ප්‍රකාශන නිලධාරී



ෂැනින් ඩැනියෙල්
සන්නිවේදන නිලධාරී



නයෝමි ජයකොඩි
පරිපාලන සහාය නිලධාරී



බර්නඩෙට් ප්‍රබාලෝජිනි
පෙරටු කාර්යාල සම්බන්ධීකාරක



දිනිති උපේක්ෂා
මුද්‍රල් සහ පරිපාලන සහකාර



හයිඩි ද සිල්වා
ගිණුම් සහකාර



තිලංකා ප්‍රසාදි
පුස්තකාල සහායක

සහාය කාර්යමණ්ඩලය



රියදුරු/කාර්යාල සහායක
ජී.ආර්. වික්‍රමසේන



රියදුරු/කාර්යාල සහායක
එච්.එස්. උදයකාන්ත



රියදුරු/කාර්යාල සහායක
නිහාල් වසන්ත



රියදුරු/කාර්යාල සහායක
පී.යූ.කේ. රාජසිරි

උපකාරක සේවා

මුදල් සහ පරිපාලනය

මූල්‍ය, පරිපාලන, මානව සම්පත්, නඩත්තු, මෙහෙයුම්, ප්‍රවාහන සහ ප්‍රසම්පාදන සේවා සැපයීම ඔස්සේ පර්යේෂණ ඒකකයන්හි ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමට හා සහයෝගය දැක්වීමට මුදල් සහ පරිපාලන ඒකකය ස්ථාපිත කොට ඇත.

සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ මූල්‍ය කාර්යසාධනය රු. මි. 229.94 ක අතිරික්තයක් වාර්තා කරන ලදී. රු. මිලියන 535 ක සමස්ත ආදායම, ව්‍යාපෘති ආදායම් (52%), ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) ආයෝජන භාර අරමුදලෙන් එකතු වූ මුදල් (23%), පොළී ආදායම (24%) සහ වෙනත් විවිධ ආදායම් (1%) වලින් සමන්විත විය.

2023 වර්ෂයේ දී ආයතනය රු. මි. 27 ක ප්‍රාග්ධන ආයෝජනයක් සිදු කරමින් සූර්ය පැනල පද්ධතියක් සවිකිරීමේ කටයුතු නිම කළේය. ඉදිරියේ දී ආයතනයේ විදුලි බල අවශ්‍යතාවයෙන් 40% ට වැඩි ප්‍රමාණයක් මෙම සූර්ය පැනල පද්ධතිය මගින් උත්පාදනය කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

2022 වර්ෂයේදී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පර්යේෂකයින් තිදෙනෙකුට සහ සහාය කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකුට සමු දුන් අතර, ආයතනය සඳහා නව කාර්ය මණ්ඩල සාමාජිකයන් අට දෙනෙකු බඳවා ගන්නා ලදී.

ආයතනික පාලනය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලන ව්‍යුහය සමන්විත වන්නේ පාලක මණ්ඩලයකින් ("IPS අධ්‍යක්ෂ මණ්ඩලය"), විධායක අධ්‍යක්ෂවරයාගෙන් සහ කළමනාකරණ කමිටු වලිනි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන්ගේ පත්කිරීම් සහ වගකීම් 1988 අංක 53 දරණ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන (IPS) පනත තුළ නිර්වචනය කොට ඇත. ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමේ සහ කාර්යසාධනය පිළිබඳ කටයුතු මෙහෙයවීමේ වගකීම දරනුයේ විධායක අධ්‍යක්ෂවරයා සහ කළමනාකරණ කමිටු විසිනි.

සෑම වසරක් ආරම්භයේදී ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රැස්වීම් පැවැත්වීමේ වැඩසටහනක් පිළිබඳ එකඟතාවයකට එළඹෙන අතර, අවම වශයෙන් වර්ෂයකට දෙවරක් රැස්වීම් පැවැත්වීම සිදු වේ. එසේ ම අවශ්‍ය අවස්ථාවලදී අතිරේක රැස්වීම් කැඳවීමද සිදු වේ. වාර්ෂික සැලසුම් පළිබඳව සාකච්ඡා කිරීම සහ එකඟතාවයකට එළඹීම සඳහා සෑම වර්ෂයකම ආරම්භයේදී විධායක අධ්‍යක්ෂකවරයා විසින් සියලු කමිටු රැස්වීම් කැඳවනු ලබන අතර, ප්‍රගතිය අධීක්ෂණය කිරීම උදෙසා කාර්තුමය වශයෙන් රැස්වීම් කැඳවීමේ වගකීම දරනු ලබන්නේ එක් එක් කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා විසිනි.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සහ ත්‍රෛවාර්ෂික ආයතනික සැලැස්මක් පිළියෙල කොට අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මන්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. අයවැයගත පිරිවැය හා සාපේක්ෂව අත් කර ගනු ලබන ප්‍රගතිය කාර්තුමය පදනමක් මත සමාලෝචනයට ලක් කොට වාර්තා කරනු ලැබේ.

විගණන කමිටුව

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි (IPS) විගණන කමිටුව ආයතනික කළමනාකරණය, රාජ්‍ය ගිණුම්කරණය සහ මූල්‍ය යන ක්ෂේත්‍රයන් තුළ වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටුව ද කාර්තුමය වශයෙන් රැස් වේ. අභ්‍යන්තර විගණන කටයුතු අඛණ්ඩ පදනමකින් ක්‍රියාත්මක වනු ලබන අතර, විගණන ඔස්සේ අනාවරණය කරනු ලබන සියලුම කරුණු කාර්තුමය පදනමක් මත සාකච්ඡාවට ලක් කරමින්, ඇති විය හැකි අවදානම් තත්ත්වයන් හඳුනාගැනීමත්, එවන් අවදානම් තත්ත්වයන් අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීමත් සිදු වේ.

විගණන කමිටුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවක් වශයෙන් ක්‍රියාත්මක වනු ලබන අතර, විගණන කමිටු රැස්වීම් වල කාර්යසටහන් අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනගැනීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කරනු ලැබේ.

ආයෝජන කමිටුව

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) ආයෝජන කමිටුවේ සභාපතිත්වය බැංකුකරණ ක්ෂේත්‍රයේ වෘත්තියවේදියෙකු වන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) අධ්‍යක්ෂ මන්ඩල සාමාජිකයෙකු විසින් දරනු ලැබේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) කළමනාකාරිත්වයේ සාමාජිකයන් සමගින් ආයෝජනය විෂය පිළිබඳ ප්‍රවීණයකු වන ස්වාධීන සාමාජිකයෙකුද මෙම කාරක සභාව තුළ කටයුතු කරනු ලැබේ. කාරක සභාව ද්වි වාර්ෂික වශයෙන් රැස් වන අතර අවශ්‍ය අවස්ථාවලදී අතිරේක රැස්වීම් පවත්වනු ලැබේ.

අවදානම් කළමනාකරණ කාර්ය පටිපාටිය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS) විසින් ස්වකීය අභ්‍යන්තර සහ බාහිර වටපිටාවන් තුළින් පැනනැගීමේ විභවතාවයක් පවතින අවදානම් තත්ත්වයන් ගණනාවක් පිලිබඳව කරුණු සොයා බලන අතර ව්‍යුහාත්මක සහ පූර්ව ක්‍රියාකාරී ආකාරයකින් මෙම අවදානම් තත්ත්ව හඳුනාගැනීමේ, මැන බැලීමේ සහ කළමනාකරණය කිරීමේ වැදගත්කම අවබෝධ කරගනු ලැබේ. ආයතනයේ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටියේ අභිමතාර්ථය වන්නේ ආයතනික ඉලක්ක අත්පත් කර ගැනීම තුළදී වී සඳහා අවිනිශ්චිත තාවයන්ගෙන් බාධාවක් ඇති නොවීමට වග බලා ගැනීමයි. අවදානම් කළමනාකරණය පිලිබඳ අවසන් වගකීම සහ අධීක්ෂණ කාර්යභාරය දරනු ලබන්නේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) අධ්‍යක්ෂ මන්ඩලය විසිනි. සමස්ත අවදානම් පිළිබඳ ස්වකීය රාජකාරී සහ වගකීම් ඉටු කිරීමේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) අධ්‍යක්ෂ මන්ඩලයට වී වෙනුවෙන් වෙන් වූ කළමනාකරණ කමිටුවේ සහයෝගය සැලසෙනු ලැබේ.


ඇතිවීමේ විභවතාවයක් පවතින අවදානම් තත්ත්ව සහ ප්‍රධාන අවදානම් අවම කිරීම සඳහා වන ප්‍රවේශ

මෙහෙයුම් සහ කීර්තිනාම අවදානම, මූල්‍ය අවදානම, අනුකූලතා අවදානම සහ තරඟකාරීත්ව අවදානම් යනාදිය ආයතනය කෙරෙහි ඇති වීමේ ඉඩකඩක් පවතින ප්‍රධාන අවදානම් තත්ත්වයන් වශයෙන් ආයතනය විසින් පොදුවේ හඳුනාගෙන ඇත.


අවදානම් වර්ගය	අවදානම අවම කිරීම සඳහා වන ප්‍රවේශ
මෙහෙයුම් සහ කීර්තිනාම අවදානම	• ඉලක්කගත සන්නිවේදන ක්‍රමෝපාය සහ මෙවලම් ඔස්සේ ස්වකීය ප්‍රධාන පාර්ශ්වකරුවන්ට සමීප වීම • තොරතුරු තාක්ෂණ සහ අනෙකුත් ආශ්‍රිත සහාය සේවාවන්හි සාධනීයභාවය ඇගයීමට ලක් කිරීම • අඛණ්ඩ පදනමක් මත අභ්‍යන්තර විගණන පැවැත්වීම සහ කාර්තුමය පදනමක් මත විගණන වලින් අනාවරණය කරගනු ලබන කාරණා සමාලෝචනයට ලක් කිරීම • වාර්ෂික පදනමක් මත බාහිර විගනන පැවැත්වීම සහ ඒවායේදී අවධාරණය කරනු ලබන කිසියම් විශේෂ කාරණා වේ නම් ඒවා සමීපව සමාලෝචනය කිරීම • ආයතනයේ සියලු දේපල සම්බන්ධයෙන් පුළුල් රක්ෂණ ආවරණයක් පවත්වා ගැනීම • සේවකයන්ගේ රෝහල්ගත කිරීම් සහ බරපතල රෝගාබාධ සඳහා රක්ෂණාවරණයක් සැපයීම
මූල්‍ය අවදානම	• මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම එනම්, 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන වෙන්කිරීම් නොමැතිවීමේ තත්ත්වයක් මත පර්යේෂණ ප්‍රදාන සහ පොලී ආදායම ඉහළ නංවාගැනීම • ණය අවදානම අවම කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු කිහිපයක් තුළ ආයතනයේ ආයෝජන කළඹ පවත්වා ගෙන යාම • කලින් කලට අයවැය පාලන සහ අධීක්ෂණ අපගමන සිදු කිරීම • බාධාවීමකින් තොරව ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා ද්‍රවශීල අරමුදල්වල (Liquid funds) ප්‍රමාණවත්භාවය සහතික කරමින් ආයතනයේ මූල්‍යමය ස්ථාවරය අඛණ්ඩවම අධීක්ෂණයට ලක් කිරීම • ආයෝජන තීරණ පිළිබඳ අවසන් තීරණයකට එළඹීමට ප්‍රථම විවිධ ආයෝජන ඇගයුම් තාක්ෂණ ක්‍රම භාවිතා කිරීම
අනුකූලතා අවදානම	• අදාල නියාමන ආයතන වෙත ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ වීවායේ දී ගොනුගත කිරීමට අවශ්‍ය ලේඛන යනාදිය පිළිබඳව අඛණ්ඩව අධීක්ෂණය කිරීම
තරඟකාරීත්ව අවදානම	• අනෙකුත් තරඟකාරී පර්යේෂණ ආයතන සමග සන්සන්දනාත්මකව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මාධ්‍ය දෘශ්‍යතාවය අධීක්ෂණය සහ වැඩි දියුණු කිරීම.
මානව සම්පත් ආශ්‍රිත අවදානම	• ගැලපෙන සුදුසුකම් සහිත කාර්යමණ්ඩලය බඳවාගැනීම සහ රඳවා ගැනීම • සේවක අගය ප්‍රස්තුතය සවිමත් කිරීම • පුහුණු සහ සංවර්ධන කටයුතු සඳහා අඛණ්ඩවම ආයෝජනය කිරීම • උසස් අධ්‍යාපනය සඳහා වැටුප් රහිත නිවාඩු ලබාදීම වැනි ආකාරයෙන් වෘත්තීයමය අභිවෘද්ධිය අත්පත් කරගැනීම උදෙසා අවස්ථා සැලසීම • සේවක නියුක්ත වීම ඉහළ මට්ටමෙන් පවත්වා ගැනීම • වාර්ෂික කාර්යසාධන සංවර්ධන සමාලෝචන (PDRs) සිදු කිරීම • තොරතුරු තාක්ෂණ පද්ධතියක් සහ අන්තර්ජාල ආරක්ෂාව ක්‍රියාත්මක කිරීම
තොරතුරු තාක්ෂණ අවදානම	• තොරතුරු තාක්ෂණ පද්ධතියක් සහ අන්තර්ජාල ආරක්ෂාව ක්‍රියාත්මක කිරීම • තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම • ආයතනය තුළ පවත්නා මධ්‍යගත තොරතුරු ගබඩා කළමනාකරණ පද්ධතියක් සහ ආයතනයෙන් බාහිර ක්ලවුඩ් අවකාශ කළමනාකරණ පද්ධතියක් (offsite cloud storage backup management system) ක්‍රියාත්මක කිරීම • වාර්ෂික තොරතුරු තාක්ෂණ ආරක්ෂක විගණන හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම

මූල්‍ය විශේෂ අවස්ථා - 2014 - 2023

ආදායම, වියදම සහ අතිරික්තය



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ආදායමෙහි සංයුතිය



සන්නිවේදනය සහ මහජන සම්බන්ධතා

සන්නිවේදන මාර්ග සාධනීය අයුරින් භාවිතා කිරීම ඔස්සේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ පිළිබඳව තොරතුරු ව්‍යාප්ත කිරීම සහ ජනවිහිදුම්කරණ වැඩසටහන් පුළුල් කිරීම ආයතනයේ එක් ප්‍රධාන අභිමතාර්ථයක් වේ. ප්‍රකාශන, ප්‍රතිපත්ති සංක්ෂිප්ත, විශේෂ අවස්ථා සහ සංවාද වැනි විවිධ මාධ්‍ය ඔස්සේ දේශීය සහ ජාත්‍යන්තර පාර්ශ්වකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ මහජනතාව වෙත ස්වකීය බහුමාන පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු බෙදා හැරීම මෙයට ඇතුළත් වේ. තවද, විවිධ ඉලක්කගත ප්‍රේක්ෂකයන් වෙත ළඟාවීම අරමුණු කරගනිමින් විවිධ මාධ්‍ය වේදිකා ඔස්සේ පුවත්පත් නිවේදන, ලිපි සහ සම්මුඛ සාකච්ඡා මගින් පර්යේෂණ වලින් අනාවරණය කරගනු ලබන කරුණු සහ තොරතුරු ප්‍රචාරණය කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් නිරන්තරයෙන් සිදු කරනු ලබයි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2023 වර්ෂයේ දී ප්‍රකාශන හයක් එළිදක්වන ලද අතර, ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2023' ද එයට ඇතුළත් වේ. එයට අමතරව, පර්යේෂණ කාර්ය මණ්ඩලය සඟරා ලිපි, පොත් පරිච්ඡේද සහ ක්‍රියාකාරී පත්‍රිකා ස්වරූපයෙන් වෙනත් බාහිර ප්‍රකාශන ගණනාවක් ද ප්‍රකාශයට පත් කළේය. ඉන්දියාවේ 'පර්යේෂණ සහ තොරතුරු පද්ධති' (Research and Information Systems) නැමති ආයතනය සමග සම-කළමනාකරණය කර, සමානයින් විසින් සමාලෝචනය කර, Sage Publications විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර සඟරාවක් වන දකුණු ආසියානු ආර්ථික සඟරාවේ වෙළුම් දෙකක් ද අනෙකුත් ප්‍රකාශන අතර විය.

2023 වර්ෂයේ දී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය නිල බ්ලොග් අඩවිය වන 'ෆෝකිං ඉකොනොමික්ස්' සඳහා බ්ලොග් ලිපි 19 ක් නිෂ්පාදනය කරන ලද අතර, එම ලිපි පුළුල් ලෙස කියවනු ලබන පුවත්පත් සහ මාර්ගගත ප්‍රවෘත්ති නාලිකා විසින් ප්‍රකාශයට පත් කරන ලදී. එයට අමතරව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ලිපි 12 ක් පළකරමින් සහ කාර්ය මණ්ඩලයේ සැලකිය යුතු සංඛ්‍යාවක් ගෝලීය වේදිකාවල පෙනී සිටීමින් අඛණ්ඩව ජාත්‍යන්තර තලය තුළද පෙනී සිටියහ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති විවාද සඳහා දායක වීම පිණිස මුද්‍රිත, විකාශන සහ විද්‍යුත් මාධ්‍ය සම්මුඛ සාකච්ඡා 14 ක ද පෙනී සිටියහ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආකාර්ෂණීය අන්තර්ගතයන් සමගින් ස්වකීය ෆේස්බුක්, ට්විටර්, ඉන්ස්ටග්‍රෑම්, ලින්ක්ඩ්ඉන් සහ යූටියුබ් පිටු නිතිපතා යාවත් කාලීන කරමින් සමාජ මාධ්‍යවල ස්වකීය පෙනීසිටීම 2023 වර්ෂයේ දී සැලකිය යුතු ලෙස පුළුල් කළේය. ආයතනය විශේෂයෙන් ම ට්විටර් ඔස්සේ ක්‍රියාකාරී වෙමින්, එම වැදගත් සමාජ මාධ්‍ය වේදිකාව භාවිතා කරමින් විශේෂ අවස්ථා සජීවීව යාවත්කාලීන කරමින් සැලකිය යුතු ආකර්ෂණයක් දිනාගෙන ඇත.

2023 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය ඉතා වැදගත් කරුණක් ලෙස ඉස්මතු වූ අතර, එය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික ප්‍රකාශනය වන ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2023 වාර්තාවෙහි ද පිළිබිඹු කරන ලදී. 'ආර්ථික ප්‍රතිපත්ති තෝරා ගැනීම්: ස්ථායීවීමේ සිට වර්ධනය දක්වා' නැමති තේමාව යටතේ පළකරන ලද මෙම ප්‍රකාශනය මගින් ගැඹුරු අර්බුදයකින් නැගී එමින් සිටින ජාතියකට ඉතාමත් වැදගත් වන ප්‍රතිපත්ති විවාද සහ තෝරාගැනීම් පුළුල් ලෙස ගවේෂණය කරන ලදී. තවද, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රාජ්‍ය ප්‍රතිපත්ති සාකච්ඡාවල වඩාත් ශක්තිමත් ලෙස නියැළීම සඳහා අපගේ ප්‍රකාශිත පුළුල් පර්යේෂණ මාලාවෙන් උකහා ගනිමින් ජාතික ප්‍රතිපත්ති සම්මන්ත්‍රණයකට සහ ප්‍රචාරණ සම්මන්ත්‍රණ පහකට සත්කාරකත්වය සපයා දුන්නේය. ආයතනය ස්වකීය ප්‍රමුඛ පර්යේෂණ සමගින් විවිධ පාර්ශවකරුවන් පුළුල් පරාසයක් වෙත ප්‍රවේශ වීමට සමත්වී තිබේ.

තොරතුරු පද්ධති ඒකකය (ISU)

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ තොරතුරු පද්ධති ඒකකය විශිෂ්ඨත්වයේ කලාපීය කේන්ද්‍රයක් ලෙස ආයතනයේ තරඟකාරිත්වයට සහාය වෙමින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තොරතුරු පද්ධති ඒකකය මෘදුකාංග, සන්නිවේදනය, දෘඩාංග, ජාලකරණය, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය, වෙබ් සංවර්ධනය, තොරතුරු බෙදා හැරීම සහ දත්ත සංචිත සංවර්ධනය කිරීම ඇතුළු තොරතුරු පද්ධතිවල විවිධ අංශ කළමනාකරණය කිරීමේ වගකීම දරයි. මෙම කාර්යයන් සාමූහිකව, කාර්යක්ෂම ලෙස මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට සහ ආයතනයේ සාර්ථකත්වයට ඉවහල් වේ.

2022 වර්ෂයේ දී තොරතුරු පද්ධති ඒකකය අන්තර්ජාල තොරතුරු පද්ධතියේ ධාරිතාවයන් වැඩිදියුණු කරන නව සේවාදායක පද්ධතියක් ක්‍රියාත්මක කළේය. මෙම වැඩිදියුණු කිරීම පහත සඳහන් කාර්යයන් ඇතුළුව විවිධ පහසුකම් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හේතු විය:

අතථ්‍ය පුද්ගලික ජාල (VPN) පද්ධතිය: ආයතනයේ ජාල සම්පත් වෙත ආරක්ෂිත දුරස්ථ ප්‍රවේශයක් සපයා දීම පිණිස සහ නිවසේ සිට රාජකාරි කිරීම සඳහා පහසු ක්‍රම සපයා දීම පිණිස VPN පද්ධතිය ක්‍රියාත්මක කරන ලදී. කාර්යාල පරිශ්‍රයෙන් පිටත දී රාජකාරි ඉටුකරන විට පවා බාධාවකින් තොරව ඵලදායිතාවය සහතික කරමින් දුරස්ථ ලෙස අවශ්‍ය සම්පත් වෙත ප්‍රවේශ වීමට කාර්ය මණ්ඩලයට ඉඩ සලසන තාක්ෂණයන් සහ මෙවලම් ක්‍රියාත්මක කිරීම මෙයට ඇතුළත් වේ.

වීඩියෝ සම්මන්ත්‍රණ: තොරතුරු පද්ධති ඒකකය Zoom තාක්ෂණය ඔස්සේ පවත්වනු ලබන රැස්වීම් වැනි වීඩියෝ සම්මන්ත්‍රණ විසඳුම් භාවිතා කිරීම සඳහා පහසුකම් සලසා දී ඇත. වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය අන්තර්ජාලය ඔස්සේ අතථ්‍ය රැස්වීම් පැවැත්වීමට, හවුල්කාරිත්වයන්ට සහ ඉදිරිපත් කිරීම් සිදුකිරීමට පහසුකම් සලසමින් සන්නිවේදනය වැඩිදියුණු කරන බැවින් සහභාගීවන්නන් පෞද්ගලිකව පැමිණ රැස්වීම් පැවැත්වීමේ අවශ්‍යතාවය අඩු කරයි.

මෙම ජයග්‍රහණවලට අමතරව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2023 වර්ෂයේ දී ස්වකීය ජාල පද්ධති වැඩිදියුණු කළේය. විශ්වාසනීය හා කාර්යක්ෂම සන්නිවේදනය, දත්ත හුවමාරුව සහ ආයතනය තුළ තොරතුරු වෙත ප්‍රවේශය සඳහා ඉතා වැදගත් වන මෙම ජාල වැඩිදියුණු කිරීම මගින් සමස්ත ජාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ආයතනයේ ඇති කැපවීම පෙන්නුම් කරයි.

තොරතුරු පද්ධති ප්‍රගාමී ලෙස කළමනාකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම මගින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය තරඟකාරීත්වය පවත්වා ගනිමින් කලාපීය විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියාත්මක වන බව තොරතුරු පද්ධති ඒකකය විසින් සහතික කරයි. මෙම ප්‍රයත්නයන් මගින් ආයතනයේ සාර්ථකත්වය සඳහා අත්‍යාවශ්‍ය වන කාර්යක්ෂම කාර්ය ප්‍රවාහය, ඵලදායී සන්නිවේදනය සහ විවිධ මාර්ගගත ක්‍රියාකාරකම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අවස්ථාව සලසා දෙයි.

පුස්තකාලය


ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පුස්තකාලය ආයතනයේ පර්යේෂණ සහ සහායක කාර්ය මණ්ඩලයට තොරතුරු සම්පත් සපයා දෙමින් සහ බාහිර පරිශීලකයන්ට ද සේවා සපයා දෙමින් අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2023 වර්ෂයේ දී, පුස්තකාලය ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් කෙරෙහි අවධානය යොමු කළේය: පුස්තකාල සහ තොරතුරු සේවා ඩිජිටල්කරණය සහ අලෙවිකරණය එම ක්ෂේත්‍ර දෙක වේ. පුස්තකාලය මෙම වර්ෂයේ මුල් භාගයේ දී පුස්තකාල සීමාවාසික පුහුණුලාභියෙකුගේ සහාය ඇතිව ඩිජිටල්කරණ ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කළේය. එය 'JSTOR' ඇතුළු විවිධ දත්ත සංචිත සහ විද්‍යුත් පත්‍රිකා වෙත ප්‍රවේශය සහතික කර ඇත. එයට අමතරව, පුස්තකාලය දිනපතා පුවත්පත්වල විද්‍යුත් පුවත්පත ප්‍රසම්පාදනය කිරීමේ පිළිවෙත අඛණ්ඩව පවත්වාගෙන ගියේය.


කාලීන කටයුතු පිළිබඳව පරිශීලකයින් දැනුවත් කිරීම පුස්තකාලයේ ප්‍රමුඛතාවයක් ලෙස පැවතුණි. පුස්තකාලය අලුතින් එකතුවූ කෘති පිළිබඳ තොරතුරු වරින් වර පර්යේෂණ කාර්ය මණ්ඩලය අතර බෙදා හැරියේය. පුස්තකාලයේ අන්තර්ජාලය, මාර්ගගත පොදු ප්‍රවේශ සුචිය (Online Public Access Catalog), සහ විද්‍යුත් දත්තසංචිත වැනි අත්‍යාවශ්‍ය මෙවලම් කාර්ය මණ්ඩලයට හුරු කරවීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. පුස්තකාලය අන්තර්-පුස්තකාල ණය සහ ලේඛන භාරදීමේ ඉල්ලීම් කාර්යක්ෂමව මෙහෙයවන ලදී.


සන්නිවේදන කණ්ඩායම සමඟ එක්ව කටයුතු කරමින් පුස්තකාලය උපදෙස් වීඩියෝ තුනක් නිර්මාණය කිරීමට අරමුණු කරයි: පුස්තකාල මාර්ගගත පොදු ප්‍රවේශ සුචිය - පුස්තකාලයේ මාර්ගගත නාමාවලිය විමර්ශනය කිරීම සඳහා මාර්ගෝපදේශයක්; පුස්තකාල අන්තර්ජාලය - අභ්‍යන්තර සම්පත් සහ සේවා පිළිබඳ දළ විශ්ලේෂණයක්; සහ ඩිජිටල් පුස්තකාල "Econsapce" - ඩිජිටල් පුස්තකාල සම්පත් භාවිතා කිරීමේ පරිශීලක-හිතකාමී නිබන්ධනයක් එම වීඩියෝ තුන වේ. පුස්තකාල කළමනාකරණ මෘදුකාංගයේ නවතම අනුවාද වෙත, විශේෂයෙන් ම, KOHA සහ Dspace (ඩිජිටල් පුස්තකාල මෘදුකාංගය) යාවත්කාලීන කිරීම ඉදිරි වර්ෂය සඳහා ප්‍රමුඛතාවලට ඇතුළත් වේ. පරිශීලකයන්ගේ අත්දැකීම් වැඩි දියුණු කිරීම සඳහා සහ දැනුම හා සම්පත් වෙත බාධාවකින් තොරව ප්‍රවේශවීම සඳහා පහසුකම් සැලසීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පුස්තකාලය කැපවී සිටියි.

ප්‍රකාශන 2023


- **කොවිඩ්-19 වසංගතය අතරතුර ශ්‍රී ලංකාවේ ජායා අධ්‍යාපනය: ප්‍රධාන ධාරාවේ අධ්‍යාපනය සම්බන්ධ ප්‍රවනතා, බලපෑම් සහ භූමිකාව,** සෞඛ්‍ය හා අධ්‍යාපන පර්යේෂණ ප්‍රකාශන මාලා අංක 21, අශානි අබයසේකර, උෂා පෙරේරා සහ තිසලි ද සිල්වා, 2023 මැයි
- **ශ්‍රී ලංකාවේ කටුපොල් කර්මාන්තය: ආර්ථික විශ්ලේෂණයක්,** කාර්මිකකරණ පර්යේෂණ ප්‍රකාශන මාලා අංක 12, චිරන්දනී පතිරාජ, රුවන් සමරවීර, හිරුණි ප්‍රනාන්දු සහ ජාන් බෝගොඩගේ, 2023 ජූනි.
- **ශ්‍රී ලංකාවේ ආනයන පාලනයන්: දේශපාලන මනාප සහ දිරිගැන්වීම් විකෘති කිරීම්,** ජාත්‍යන්තර ආර්ථිකවිද්‍යා ප්‍රකාශන මාලා අංක 15, අසංක විජේසිංහ, නිලුපුලී රත්නායක සහ චතුර්ධිකා යෝගරාජා, 2023 ජූලි.
- **වෙළඳ විභවය එළිදැක්වීම: ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ පූර්ව විශ්ලේෂණයක්,** ජාත්‍යන්තර ආර්ථිකවිද්‍යා ප්‍රකාශන මාලා අංක 16, අසංක විජේසිංහ සහ නිලුපුලී රත්නායක, 2023 සැප්තැම්බර්.
- 'ආර්ථික ප්‍රතිපත්ති තෝරාගැනීම්: ස්ථායීවීමේ සිට වර්ධනය දක්වා' යන තේමාව යටතේ පළකළ **ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය** 2023 වාර්තාව, ඔක්තෝබර් (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ කණ්ඩායම)
- **තිරසාර සංවර්ධන ඉලක්ක මූල්‍යකරණ පරතරය පියවීම සඳහා රාජ්‍ය ආයෝජන: ශ්‍රී ලාංකික දෘෂ්ටිකෝණයක්,** කාලීන පත්‍රිකා මාලා අංක 74, ලක්මිණී ප්‍රනාන්දු, නොවැම්බර්.













අභ්‍යන්තර සම්මන්ත්‍රණ



'දකුණු ආසියාවේ ආපනශාලා කර්මාන්තයේ ආයතනික තිරසාරත්වය සඳහා නියාමන රාමුවල දායකත්වය පිළිබඳ ඇගයීම', කිමුතු කිරිංගොඩ, පර්යේෂණ නිලධාරී - ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, ජනවාරි 25.



'ශ්‍රී ලංකාවේ ග්‍රාමීය තරුණ කාන්තාවන් කෘෂිකර්මාන්තය අත්හරිනවාද? ග්‍රාමීය ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශයේ රැකියා අවස්ථා සඳහා තරුණ කාන්තාවන්ගේ මනාපය හසුරුවන සාධක පිළිබඳ ආනුභවික පරීක්ෂණයක්', රුවන් සමරවීර, පර්යේෂණ නිලධාරී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, පෙබරවාරි 28.



'උද්ධමනය පාලනය කිරීමේ ක්‍රියාමාර්ග: ශ්‍රී ලංකාවේ ජාතික පාරිභෝගික මිල දර්ශකය සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්', දිනුෂ්කා පරණවිතාන සහ කොරේ විලියම්ස්, ආචාර්ය උපාධි ශිෂ්‍යයන්, බටහිර වර්ජිනියා විශ්ව විද්‍යාලයේ ජෝන් චේම්බර්ස් ව්‍යාපාර සහ ආර්ථිකවිද්‍යා විද්‍යාලය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාවේ පැවති වීඩියෝ සම්මන්ත්‍රණයක්, මාර්තු 30



'තිරසාරභාවය සඳහා ප්ලාස්ටික් භාවිතයෙන් තොරවීම පිළිබඳ වැඩසටහන්', නිශ්ශංක ද සිල්වා, ප්ලාස්ටික් භාවිතයෙන් තොරවීම පිළිබඳ ජාතික ව්‍යාපාරයේ නිර්මාතෘ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක විවේකාගාරය, මැයි 2



'වී වගා අංශය කෙරෙහි රසායනික පොහොර තහනමෙහි බලපෑම: ප්‍රවනතා ලකුණු ගැළපීමේ විශ්ලේෂණයක්', සචිනි නිවර්තනා, ව්‍යාපෘති නිලධාරී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, මැයි 31.



'ප්‍රජා අවබෝධය: මිශ්‍ර ක්‍රමවේද පර්යේෂණ භාවිතා කරමින් හම්බන්තොට වරාය ව්‍යාපෘතිය පිළිබඳ සිද්ධි අධ්‍යයනය', චායා දිසානායක, පර්යේෂණ සහකාර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, ජුනි 28.



'කෘෂි අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නව්‍යකරණය තීරණය කරන සාධක: ශ්‍රී ලංකාවෙන් ලැබෙන සාක්ෂි', සදීෂා සේනානායක, ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී (සමන් කැලේගම අනුස්මරණ පර්යේෂණ ප්‍රදාන ජයග්‍රාහක- 2022), ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, ජූලි 31.



'වෙළඳාම සහ සාර්ථකත්වය ඉහළ නැංවීම: ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමක වෙළඳ බලපෑම පරීක්ෂා කිරීම', නිලුපුලී රත්නායක, පර්යේෂණ නිලධාරී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, අගෝස්තු 28.



'ශ්‍රී ලංකාවේ කටුපොල් කර්මාන්තය: ආර්ථික විශ්ලේෂණයක්', ආචාර්ය චිරන්දතී පතිරාජ, පර්යේෂණ සාමාජික, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, සැප්තැම්බර් 27.



'අඩු පුහුණු කම්කරුවන් සඳහා ශ්‍රම වෙළඳපොළ ප්‍රතිඵලවල ස්ත්‍රී-පුරුෂ සමාජභාව විවිධත්වයන්හි මූලාශ්‍ර: ඉන්දුනීසියාවෙන් ලැබෙන සාක්ෂි, ආචාර්ය පුලස්ති අමරසිංහ, පර්යේෂණ ආර්ථික විද්‍යාඥ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, ඔක්තෝබර් 30.



'ආර්ථික විද්‍යාව, බදු පරිපාලනය සහ ශ්‍රී ලංකාවේ ආදායම් ගැටලුව', මහාචාර්ය මික් මුවර්, බදු සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ සාමාජික සහ සංවර්ධන අධ්‍යයන ආයතනයේ මහාචාර්ය සහික, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, නොවැම්බර් 27.



'දකුණු ආසියාවේ දරිද්‍රතා ගතිකය මෙහෙයවන සාධක', ආචාර්ය විද්‍යා දිවාකර්, නියෝජ්‍ය අධ්‍යක්ෂ, නිදන්ගත දරිද්‍රතා උපදේශන ජාලය සහ පර්යේෂණ සාමාජික, සංවර්ධන අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, නොවැම්බර් 28.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සීමාවාසික වැඩසටහන 2023

	නම	තනතුර	විශ්වවිද්‍යාලය
1	සුරක්ෂි ද සිල්වා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්වවිද්‍යාලය
2	තිෂිනි පෙරේරා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කැලණිය විශ්වවිද්‍යාලය
3	අයේෂා බස්නායක	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්වවිද්‍යාලය
4	මලිති අමා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්වවිද්‍යාලය
5	මලීෂා වීරසිංහ	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	හොං කොං විශ්වවිද්‍යාලය, හොං කොං SAR
6	චමල්කා ෆොන්සේකා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	එක්සෙටර් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය
7	රුකයියා ඉර්ෂඩීන්	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	නිව් යෝර්ක් විශ්වවිද්‍යාලය, අබුඩාබි, එක්සත් අරාබි එමීර්
8	චලනි හංසමාලි	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	රුහුණ විශ්වවිද්‍යාලය
9	තරුශලිනී සිවතුරෙයි	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	යාපනය විශ්වවිද්‍යාලය
10	සන්සියා තුරෙයිරෙද්නම්	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	යාපනය විශ්වවිද්‍යාලය
11	ලලින්කා ද සිල්වා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්වවිද්‍යාලය
12	තරුෂි කාවින්ද්‍යා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්වවිද්‍යාලය
13	තිළිණි හංසිකා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්වවිද්‍යාලය
14	නෙත්මි ගුණසේකර	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්වවිද්‍යාලය
15	මහසෙන් වීරසිංහ	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	මොනෑෂ් විශ්වවිද්‍යාලය, මැලේසියාව
16	ක්‍රිස්ටින් මාෂා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්වවිද්‍යාලය
17	නේත්‍රා ජයසේකර	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	මිනසෝටා විශ්වවිද්‍යාලය, ඇ.එ.ජ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන

මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන්	**2023** රු.	2022 රු.
ආදායම			
ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ප්‍රදාන	**2**	-	
ව්‍යාපෘති ආදායම	**3**	277,798,785	105,456,710
පොළී ආදායම	**4**	130,718,970	67,934,669
ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු දායකත්වය	**22**	122,809,517	71,146,433
ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ලැබුණු ආදායම		606.025	-
විවිධ ආදායම්	**5**	3,234,129	71,146,433
මුළු ආදායම		**535,167,426**	247,535,622
වියදම්			
සේවක පිරිවැය	**6**	124,237,361	94,695,689
පර්යේෂණ පිරිවැය	**7**	86,881,629	37,905,793
උපයෝගිතා වියදම්		22,568,285	15,993,983
වෙනත් මෙහෙයුම් වියදම්	**8**	17,477,967	12,231,096
ගමන් වියදම්		340,244	150,815
ශ්‍රවණාගාරය කුලියට දීම		124,655	-
මුළු වියදම		**251,630,141**	160,977,376
වර්ෂය සඳහා ජංගම අතිරික්තය		**283,537,285**	86,558,246
ද්‍රේපළ, පිරියත සහ උපකරණ මත අගය ක්ෂය වීම	**16**	17,986,566	16,633,112
වර්ෂය සඳහා අගය ක්ෂය කිරීමෙන් පසු අතිරික්තය		**265,550,719**	69,925,134
ආදායම් බදු වියදම්	**9**	35,558,147	19,471,354
බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා අතිරික්තය		**229,992,572**	50,453,780

දෙසැම්බර් 31 වැනි දිනට	සටහන්	*දෙසැම්බර්* **2023** රු.	*දෙසැම්බර්* 2022 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	**10**	1 25,508,414	2 22,102,590
ආයෝජන	**11**	2 7,098,309	9 3,893,803
ලැබිය යුතු වෙළඳ	**12**	6 ,057,963	23,156,315
තොග - ප්‍රකාශන		1 ,798,598	1,788,177
තැන්පතු සහ පූර්ව ගෙවීම්	**13**	1 0,022,799	1 2,456,038
ලැබිය යුතු පොළී	**14**	3 9,281,367	2 1,786,049
වෙනත් ලැබිය යුතු දෑ	**15**	1 28,817,969	7 6,090,145
මුළු ජංගම වත්කම්		**338,585,419**	451,273,117
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	**16**	4 66,170,232	4 56,799,204
දීර්ඝ කාලීන ආයෝජන	**11**	5 91,212,390	2 64,961,074
තැන්පතු සහ පූර්ව ගෙවීම්	**13**	1 19,157	3,022,279
මුළු ජංගම නොවන වත්කම්		**1,057,501,779**	724,782,557
මුළු වත්කම්		**1 ,396,087,198**	1 ,176,055,674
වගකීම්			
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	**17**	48,361,749	24,285,219
ව්‍යාපෘති මත අත්තිකාරම් ලැබීම්	**18**	60,231,081	107,413,221
මුළු ජංගම වගකීම්		**108,592,830**	131,698,440
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	**19**	40,357,628	28,828,338
කාර්ය මණ්ඩල සුභසාධන අරමුදල		7 ,044,042	5,428,769
මුළු ජංගම නොවන වගකීම්		**47,401,670**	34,257,107
මුළු වගකීම්		**155,994,500**	165,955,547
ශුද්ධ වත්කම්		**1 ,240,092,698**	1 ,010,100,127
හිමිකම්			
සමුච්චිත අතිරික්තය		**1,240,092,698**	1 ,010,100,127

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කර ඇත.

.....
සකස්කළේ: ප්‍රධාන මූල්‍ය නිලධාරී අනුමත කිරීම

.....
අනුමත කළේ: විධායක අධ්‍යක්ෂ

අනුමත කළේ:

....
සභාපති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

මෙහි 5 වැනි පිටුවේ සිට 8 වැනි පිටුව දක්වා වන පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 9 වැනි පිටුවේ සිට 15 වැනි පිටුව දක්වා වන පිටුවල ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම දරයි.

.....
කොළඹදී ය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මදල් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සමුච්චිත අතිරික්තය
	රු.
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	959,646,347
වර්ෂය සඳහා ආදායම් අතිරික්තය	50,453,780
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	1,010,100,127
වර්ෂය සඳහා ආදායම් අතිරික්තය	229,992,572
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,240,092,698**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		**2023**	2022
		රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ගලනය	**සටහන්**		
බදු ගෙවීමට පෙර අතිරික්තය/(ඌනතාවය)		265,550,719	69,925,134
ගැලපීම්			
සේවක සුභසාධක අරමුදලෙහි මාරු කිරීම්		1,615,273	1,819,543
දේපළ, පිරියත හා උපකරණ මත අගය ක්ෂයවීම්	**16**	17,986,566	16,633,112
පාරිතෝෂික ප්‍රතිපාදන / (ප්‍රතිවර්තන)	**19**	11,529,290	8,272,692
පොළී ආදායම		130,718,970)	67,934,669)
බොල් ණය සඳහා ප්‍රතිපාදන (වැඩිවීම)/අඩුවීම		(116,456)	997,506
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර ශුද්ධ මුදල් ගලා ඒම/ (ගලා යාම)		**165,846,422**	**29,713,318**
ලැබිය යුතු වෙළඳ (වැඩිවීම)/අඩුවීම		17,214,808	(11,001,494)
තොග (වැඩිවීම)/අඩුවීම		(10,421)	(114,044)
තැන්පතු සහ ගෙවීම් (වැඩිවීම)/අඩුවීම		5,336,361	(3,232,832)
වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම		(52,727,824)	(53,436,717)
අත්තිකාරම් ලැබීම් (වැඩිවීම)/අඩුවීම		(47,182,140)	71,098,663
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම		20,005,355	3,233,299
මෙහෙයුම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)		**108,482,561**	**36,260,193**
පාරිතෝෂික ගෙවීම්	**19**	**-**	(707,252)
ආදායම් බදු ගෙවීම්		(31,486,972)	(13,643,097)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)		**76,995,589**	**21,909,844**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් සිදුවූ මුදල් ගලනය			
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	**16**	(27,357,593)	(6,411,476)
ලැබුණු පොළිය		113,223,651	52,383,097
ආයෝජන මිලදී ගැනීම		(321,203,553)	(325,851,178)
ආයෝජන විකිණීමෙන් ලැබුණු මුදල		158,465,113	258,186,974)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් සිදුවූ ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම)		**(76,872,383)**	**(21,692,583)**
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ (අඩුවීම) / වැඩිවීම		1 23,205	(1,332,262)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 10)		1 ,546,444	1 ,329,184
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ		**1,669,649**	**1,546,444**
(අ) මුදල් සහ මුදල් හා සමාන දෑ සැසඳුම			
බැංකුවේ ඇති මුදල්		1 ,539,649	1,239,184
අත ඇති මුදල්		1 30,000	1 30,000
		1,669,649	**1,546,444**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

1. පිහිටි ස්ථානය සහ නෛතික ස්වරූපය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 1988 අංක 53 දරණ පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවා ඇති අතර 1990 අප්‍රේල් මාසයේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය මගින් එය නීත්‍යානුකූල ආයතනයක් ලෙස විධිමත්ව ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යනයන ආයතනයෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන සේවා සැපයුම් ස්ථානය අංක 100/20, නිදහස් මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.1 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

ප්‍රතිපත්ති දිශානත කරගත් ආර්ථික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ මධ්‍ය කාලීන ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

1.2 සකස් කිරීමේ පදනම

1.2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මුදල් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සහ මුදල් අමාත්‍යංශය ඒකාබද්ධව ප්‍රකාශයට පත් කර ඇති රාජ්‍ය අංශයේ ආයතන සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රාකාශන සකස් කර ඇත.

1.2.2 මිනුම් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස චෛතිහාසික පිරිවැය පදනමෙන් සකස් කර ඇත.

1.2.3 අඛණ්ඩභාවය

ආයතනයට පූර්වේක්ෂ අනාගතයෙහි දී ස්වකීය මෙහෙයුම් අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට ආයතනයෙහි පාලක මණ්ඩලය සෑහීමකට පත්වෙති. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි අඛණ්ඩභාවය පදනම් කරගෙන සකස් කර ඇත.

1.3 වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කරන සෑම වර්ෂයකටම එක සේ අදාළ වන පරිදි යොදා ගෙන ඇත.

(අ) විදේශ මුදල් ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. විදේශීය මුදල් ඒකක වලින් සිදු කරනු ලබන ගනුදෙනු මූලිකව ම ගනුදෙනුව සිදු කරන දිනය වනවිට පවතින ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි අනුපාතයට වාර්තා කරනු ලැබේ. විදේශීය මුදල් ඒකක වලින් නාමනය කර ඇති මුදල්මය වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනය වන විට පවතින අදාළ විදේශීය මුදල් ඒකකවල ක්‍රියයාකාරී මුදල් ඒකකයෙහි තත්කාලීන අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. සියලුම වෙනස්කම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ගනු ලැබේ.

(ආ) දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභය අඩු කළ පිරිවැයට සඳහන් කරනු ලැබේ.

ඉන් පසුව කරනු ලබන වියදම්

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ අලුත් වැඩියා වියදම් ද ඇතුළුව වෙනම ම ගණන් ගනු ලබන දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධනිත කරනු ලැබේ. පසුව සිදු කරනු ලබන අනෙකුත් වියදම් මගින් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයෙහි අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභය වැඩි දියුණු වූ විට පමණක් එම වියදම් ප්‍රාග්ධනිත කරනු ලැබේ. අනෙකුත් සියලුම වියදම් දරන ලද වියදමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

දේපළ, පිරියත සහ උපකරණ (තව දුරටත් .....)

වත්කමෙහි ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පදනම් කර කර ගෙන වාර්ෂිකව පහත සඳහන් වන අනුපාත යොදා ගනිමින් සරල රේඛීය ක්‍රමයට අගය ක්ෂය කිරීම් ගණනය කරනු ලැබේ.

පරිගණක උපකරණ	16% to 33%
වෙබ් පිටු සැලසුම්	33 %
මෝටර් සයිකල්	10%
ලීබඩු	9% to 32%
කාර්යාල උපකරණ	10%
මෝටර් වාහන	8% to 10%
පුස්තකාල පොත්	25%
ගොඩනැගිලි	2% to 5 %

වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයේදී ම සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ජීවිත කාලය පෙර වර්ෂයෙහි ඇස්තමේන්තු කරන ලද කාලයට වඩා වෙනස් වී ඇත්නම්, එම වෙනස්කම් පිළිබිඹු වන පරිදි සංශෝධන සිදු කරනු ලැබේ

වත්කමක් භාවිතය සඳහා සූදානම්ව තිබෙන අවස්ථාවේ සිට එම වත්කමෙහි අගය ක්ෂය කිරීම ආරම්භ කරනු ලබන අතර, එම වත්කම විකිණීම සඳහා තිබෙන ලෙස වර්ග කරනු ලබන දිනය හෝ එම වත්කම ඉවත් කරනු ලබන දිනය යන දෙකෙන් පූර්වයෙන් යෙදෙන දිනට එම වත්කමෙහි අගය ක්ෂය කිරීම අවසන් කරනු ලැබේ.

හානිකරණය

සිද්ධීන් හෝ වාතාවරණයන්හි වෙනස්වීම් මගින් වත්කමක ධාරණ අගය නැවත අය කර ගත නොහැකි බවට පෙනී යන ඕනෑම අවස්ථාවක හානිකරණය සඳහා එම දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි මුදලට වඩා වැඩි නම්, එම වත්කමෙහි ධාරණ වටිනාකම එකෙනෙහිම එහි නැවත අයකර ගත හැකි අගයට ලියා තබනු ලැබේ.

(ඇ) කල්බදු

වත්කම් කල්බදු දීමක් යටතේ බදු දීමනාකරු විසින් හිමිකාරිත්වයෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සඵල ලෙස රඳවා ගනු ලබන කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු යටතේ වන ගෙවීම් කල්බදු කාලපරිච්ඡේදය පුරා සරල රේඛීය ක්‍රමයක් මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයයෙහි සටහන් කරනු ලැබේ.

කල්බදු කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර මෙහෙයුම් කල්බදු ගිවිසුමක් අවසන් කරන විට, දණ්ඩනයක් ආකාරයෙන් බදු දීමනාකරු වෙත කිසියම් ගෙවීමක් සිදු කිරීමට තිබේ නම්, එම ගෙවීම එකී බදු ගිවිසුම අවසන් වීම සිදු කරන ලද කාල පරිච්ඡේදය තුළ දරන ලද වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ

(ඈ) ආයෝජන

මෙම ආයෝජන ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් / ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්, භාණ්ඩාගාර බැඳුම්කර සහ සාංගමික ණයකරවලින් සමන්විත වේ.

i. ස්ථාවර තැන්පතු

ස්ථාවර තැන්පතුවල තිබෙන ආයෝජන ඒවායෙහි පිරිවැයට ගණන් ගනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට උපචිත වන පොළිය ලැබිය යුතු පොළී ලෙස දක්වනු ලැබේ

ii. භාණ්ඩාගාර බිල්පත් / ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්

භාණ්ඩාගාර බිල්පත්වල සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්වල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට පොළිය එකතු කළ පිරිවැයට දක්වනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

ආයෝජන (තවදුරටත් ...)

iii. භාණ්ඩාගාර බැඳුම්කර

භාණ්ඩාගාර බැඳුම්කරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ. ආයතනයට මෙම ආයෝජන කල්පිරීම දක්වා තබා ගැනීමේ සාධනීය අභිප්‍රායය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජනයන් ලෙස වර්ග කරනු ලැබේ.

iv. සාංගමික ණයකර

සාංගමික ණයකරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ. ආයතනයට මෙම ආයෝජන එක් වර්ෂයකට වඩා වැඩි කාලයක් දක්වා කල් තබා ගැනීමේ සාධනීය අභිප්‍රායය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජන ලෙස වර්ග කරනු ලැබේ

(ඉ) තොග

ප්‍රකාශන තොග වලින් තොග සමන්විත වේ. ප්‍රකාශන ඒවායෙහි පිරිවැයට සඳහන් කරනු ලැබේ. වසර දහයකට (10) වැඩි කාලයක් තබා ගෙන තිබෙන ප්‍රකාශන තිබේ නම් ඒවා සෙමින් චලනය වන තොග ලෙස සලකා කපා හැර ඇත.

(ඊ) අය විය යුතු දෑ

ලැබිය යුතු දෑ ඒවායෙහි අපේක්ෂිත උපලබ්ධි අගයට ධාරණය කරනු ලැබේ. ණයගැතියන් අඛණ්ඩව සිදු කෙරන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. අයකර ගත නොහැකි යැයි හඳුනාගෙන තිබෙන ණය එසේ හඳුනාගත් වර්ෂය තුළදී කපා හරිනු ලැබේ

අඩමාන ණය සඳහා වෙන් කළ යුතු ප්‍රතිපාදන හඳුනා ගැනීම පිණිස එක් එක් හානිකරණය තක්සේරු කිරීමේ ක්‍රමය යොදා ගනු ලැබේ. මාස 03 සිට මාස 06 දක්වා පැරණි ශේෂ සඳහා 10% ක් ද, මාස 06 සිට මාස 12 දක්වා පැරණි ශේෂ සඳහා 50% ක් ද, මාස 12 වැඩි ශේෂ සහිත ණය ගැතියන් සඳහා 100% ක් ද වශයෙන් එක් එක් හානිකරණයවූ ණයගැතියන් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

(උ) මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාර්යයන් සඳහා, මුදල් සහ මුදල් හා සමාන දෑ බැංකුවේ තිබෙන මුදල්, අත ඇති මුදල්, කෙටි කාලීන තැන්පතු, සාංගමික ණයකර සහ භාණ්ඩාගාර බිල්පත් සහ බැංකු සමග එළඹ ඇති මාස තුනකට අඩු කල්පිරීමේ කාලයක් සහිත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්, සහ බැංකු අයිරා ශුද්ධ අගයෙන් සමන්විත වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහිදී බැංකු අයිරා මාස තුනක හෝ එයට අඩු කල්පිරීමේ කාලයක් සහිත ජංගම වගකීම් යටතේ ඇතුළත් කර ඇත.

(ඌ) බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම් ඉල්ලීම මත ගෙවීමට ඇති හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට ඇති වගකීම් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට වර්ෂයක කාලයකට පසුව ගෙවීමට නියමිතව තිබෙන වගකීම් ජංගම නොවන වගකීම්වලට අයත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගණන් ගෙන තිබේ.

අතීත සිද්ධීවල ප්‍රතිඵලයක් ලෙස ආයතනයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විට සහ එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් සිදු වීම අවශ්‍ය වීමේ සම්භාවිතාවක් ඇති විට වගකීම් සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. බොහෝ දුරට මෙම ආයෝජනවල කෙටි කාලීන කල් පිරීමේ කාලය හේතුවෙන් මුදල් සහ කෙටිකාලීන ආයෝජන, වෙළඳ ලැබිය යුතු දෑ, වෙළඳ ගෙවිය යුතු දෑ සහ අනෙකුත් ජංගම මූල්‍ය වත්කම් ඒවායෙහි ධාරණ අගයට ආසන්න වන බවට කළමනාකරණය විසින් තක්සේරු කර තිබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

(ඇ) සේවක ප්‍රතිලාභ

i. නිර්වචිත දායක සැලසුම්
ආයතනයෙහි සියලු ම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලෙහි සාමාජිකයින් වන අතර, එම අරමුදල් දෙක සඳහා මෙම ආයතනය සේවකයින්ගේ මූලික වේතනයෙන් හෝ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවයි.

ii. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම
ආයතනය විසින් ප්‍රක්ෂිප්ත ඒකක ප්‍රතිලාභ ක්‍රමය භාවිතා කරමින් ආයුගණකයෙකුගේ උපදෙස් මත නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් වන පාරිතෝෂිකයේ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම මනිනු ලැබේ. ආයුගණක ලාභ සහ අලාභ මෙම සැලසුමට සහභාගීවන සේවකයින්ගේ ඉතිරි සාමාන්‍ය වැඩකරන අපේක්ෂිත ජීවිත කාලය පුරා ආදායම් හෝ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

(ඈ) ආදායම් හඳුනාගැනීම

i. ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වය
ශ්‍රී. ලංකා රජයෙන් ලැබෙන දායකත්වය උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

ii. ව්‍යාපෘති ආදායම
ව්‍යාපෘති ආදායම ඉටුකිරීමට භාර ගෙන ඇති ව්‍යාපෘතිවල නිම කර ඇති අදියර පදනමෙන් හඳුනා ගනු ලැබේ. වැඩ නිම කර එහෙත් සේවාදායකයින් වෙත බිල්පත ලබා දී නොමැති ව්‍යාපෘති සකස් කෙරෙමින් පවතින බිල්පත් හිණුමෙහි වාර්තා කරනු ලැබේ. ව්‍යාපෘතිවලින් ලැබෙන අත්තිකාරම් විලම්බිත ආදායම් ලෙස වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත.

iii. සම්මන්ත්‍රණ / වැඩමුළු වලින් ලැබෙන ආදායම
සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වා අවසන්වූ විට එම සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් ලැබෙන ආදායම උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

iv. පොළී ආදායම
පොළී ආදායම උපචිත පදනමකින් ගණන් ගනු ලැබේ.

(ඉ) වියදම් හඳුනාගැනීම සහ වර්ගීකරණය

i. ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම
ව්‍යාපාර කටයුතු කිරීම සඳහා යොදා ගනු ලබන හෝ ව්‍යාපාරයෙහි ආදායම් ඉපැයීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ii. පුනරාවර්තන වියදම් වර්ගීකරණය කිරීම
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් ක්‍රමයේ ස්වභාවය මගින් ආයතනයෙහි කාර්යසාධනයෙහි මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කෙරෙන බව පාලක මණ්ඩලයෙහි මතය වන බැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගත කරගෙන ඇත.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

2 ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ප්‍රදාන

2022 වර්ෂයට පෙර ආයතනයෙහි උපයෝගීතා, නඩත්තු සහ ආදායම් බදු වියදම් සඳහා ශ්‍රී ලංකා රජයෙන් ප්‍රදාන ලැබුණි. සමාලෝචිත වර්ෂය තුළ කිසිම ප්‍රදානයක් නිදහස් කොට නොමැත.

	2023	2022
	රු.	රු.
3 ව්‍යාපෘති ආදායම්	**2 77,798,785**	105,456,710
ආයතන වලින් ලැබුණු ආදායම්		

4 ආයෝජන ආදායම්

	2023	2022
	රු.	රු.
භාණ්ඩාගාර බැඳුම්කරවලින් ලැබුණු පොලී ආදායම්	7 3,192,868	20,797,423
භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබුණු පොලී ආදායම් සහ REPO	4 8,148,178	37,501,428
ස්ථාවර තැන්පතු වලින් ලැබුණු පොලී ආදායම්	7,154,733	6,282,715
සාංගමික ණයකර වලින් ලැබුණු පොලී ආදායම්	1,616,281	2,931,616
පොලී ආදායම් - වෙනත්	606,910	421,487
	1 30,718,970	67,934,669

	2023	2022
5 විවිධ ආදායම්	රු.	රු.
ප්‍රකාශන අලෙවි කිරීම්	708,373	709,115
තැපැල් ගාස්තු	18,530	3,930
සම්මන්ත්‍රණ ශාලා වෙන්කරවා ගැනීමෙන් ලැබුණු ආදායම්	802,875	-
විනිමය ලාභය / (පාඩුව)	(64,343)	2,223,125
වෙනත් ආදායම්	1,768,694	61,640
	3,234,129	2,997,810

	2023	2022
6 සේවක පිරිවැය	රු.	රු.
ප්‍ර.අ.ආ. කාර්ය මණ්ඩල වැටුප්	89,418,864	67,964,156
සේ.අ.අ.	10,662,644	8,155,090
සේ.නි.භා.අ.	2,665,661	2,038,772
කෙටි කාලීන සේවක පිරිවැය	5,177,166	5,286,321
අධ්‍යක්ෂක ගාස්තු සහ දීමනා	744,667	684,000
සෞඛ්‍ය ප්‍රතිලාභ සහ ගාස්තු	2,896,340	1,746,078
වෙනත් ප්‍රතිලාභ	1,142,729	548,580
පාරිතෝෂික සඳහා වෙන් කිරීම් (සටහන 19)	11,529,290	8,272,692
	1 24,237,361	94,695,689

	2023	2022
7 පර්යේෂණ පිරිවැය	රු.	රු.
මුද්‍රණ සහ පරිගණක යතුරුලියන ප්‍රකාශන ගාස්තු	4,879,196	987,020
අන්තර්ජාල ගාස්තු සහ මෘදුකාංග	5,650,674	3,616,052
උපදේශක ගාස්තු	20,596,649	13,952,377
කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා	20,650,189	5,376,422
ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය	13,694,962	8,508,813
ජාත්‍යන්තර ගමන්	4,239,335	1,539,579
උපකරණ	9,751,569	-
වෙනත් පර්යේෂණ පිරිවැය	7,419,055	3,925,530
	86,881,629	37,905,793

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

		2023	2022
8	**වෙනත් මෙහෙයුම් වියදම්**	රු.	රු.
	ලියාපදිංචි සහ සාමාජික ගාස්තු	724,800	457,740
	කාර්යාල පිරිවැය	1,580,344	976,228
	සාමාන්‍ය කාර්යාල පිරිවැය	1,575,982	794,985
	වෘත්තීයවේදී සහ නීති ගාස්තු	4,307,798	2,533,931
	ජාල සහ සේවාදායක නඩත්තු කිරීම (සටහන 8.1)	7,374,673	7,355,885
	බාහිර විගණන ගාස්තු	322,800	392,100
	වෙළඳ දැන්වීම්	4,800	42,400
	බැංකු ගාස්තු / කොමිස්	216,329	146,565
	අඩමාන ණය සඳහා වෙන්කිරීම්	116,456	(997,506)
	වෙනත් පරිපාලන සම්බන්ධ වියදම්	769,957	340,168
	රැස්වීම් වියදම් - සේ.නි.භා.අ.	484,028	188,600
		17,477,967	12,231,096

8.1 ජාල නඩත්තු වියදම්වලට ජාල සහ සේවා පද්ධති නඩත්තු ගිවිසුමෙහි ක්‍රමක්ෂය කළ පිරිවැය ඇතුළත් වේ. සටහන් කරන ලද ගාස්තුවලට 2023 ඔක්තෝබර් මාසය දක්වා වසර දෙකක කාලයකට අත්සන් කරන ලද ගිවිසුම සඳහා වන ගාස්තු ද ඇතුළත් වන අතර නව ගිවිසුම 2025 ඔක්තෝම්බර් දක්වා වලංගු වේ. (2022: ඔක්තෝම්බර් 2021 සිට ඔක්තෝම්බර් 2023)

9 ආදායම් බදු වියදම

ප්‍රවර්තන බදු වියදම
2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතෙහි විධිවිධානයන්ට අනුව, ආයෝජන වලින් ලැබෙන ආදායම 14% ක ආදායම් බද්දකට යටත් වේ. ඒ අනුව 2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂයෙහි ආදායම් බදු සඳහා පහත සඳහන් පරිදි ප්‍රතිපාදන වෙන් කර ඇත:

	2023
	රු.
ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු දායකත්වය (පොළී ආදායම)	122,809,517
වෙනත් පොළී ආදායම්	130,718,970
ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් ලැබෙන ලාභය මත බද්ද-සේ,භා,අ	641,591
	254,170,078
14% ක අනුපාතය යටතේ 2023 ආයෝජන සඳහා ආදායම	35,493,988
ප්‍රාග්ධන ලාභ මත බද්ද 10%	64,159
මුළු ආදායම් බදු වියදම	**35,558,147**

		2023	2022
10	**මුදල් සහ මුදල් හා සමාන දෑ**	රු.	රු.
	බැංකුවේ ඇති මුදල්	1,539,649	1,078,010
	සුළු මුදල්	130,000	130,000
	ආයතනික ණය කාඩ්පත්	-	338,434
	මාස 03 ට අඩු කාලයක් තබා ගෙන ඇති ආයෝජන		
	ස්ථාවර තැන්පතු සහ ප්‍රතිම්ලදී ගැනීම් ගිවිසුම	44,715,052	5 4,762,815
	භාණ්ඩාගාර බිල්පත්	79,123,713	165,793,332
		125,508,414	222,102,590

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

		2023	2022
11	**ආයෝජන - කෙටි කාලීන**	රු.	රු.
	භාණ්ඩාගාර බිල්පත්	21,848,309	68,241,503
	භාණ්ඩාගාර බිල්පත් - පාරිතෝෂික අරමුදල	-	25,402,300
	ස්ථාවර තැන්පත්	250,000	250,000
	සාංගමික ණයකර	5,000,000	-
		27,098,309	93,893,803

ආයෝජන - දීර්ඝ කාලීන

දීර්ඝ කාලීන ආයෝජන කල්පිරීම දක්වා තබා ගෙන ඇති ආයෝජන ලෙස වර්ග කරනු ලබන පහත සඳහන් ආයෝජන වලින් සමන්විත වේ:

	2023	2022
	රු.	රු.
භාණ්ඩාගාර බැඳුම්කර	534,212,390	244,961,074
භාණ්ඩාගාර බැඳුම්කර – කාර්ය මණ්ඩල සුභසාධන අරමුදල	5,000,000	5,000,000
සාංගමික ණයකර	20,000,000	15,000,000
ස්ථාවර තැන්පතු - පාරිතෝෂික අරමුදල	32,000,000	-
	591,212,390	264,961,074

		2023	2022
12	**වෙළඳ ලැබිය යුතු දෑ**	රු.	රු.
	වෙළඳ ලැබිය යුතු ව්‍යාපෘති	4,088,401	7,304,776
	බොල් ණය සඳහා වෙන් කිරීම්	(116,456)	-
	බිල්පත් සකස් කරමින් පවතින	2,086,018	15,851,539
		6,057,963	23,156,315

		2023	2022
13	**තැන්පතු සහ පූර්ව ගෙවීම් - කෙටි කාලීන**	රු.	රු.
	පූර්ව ගෙවීම් (සටහන 13.1)	8,789,599	10,097,990
	තැන්පතු	1,211,950	9 70,350
	අත්තිකාරම් - සේවකයින් (ගමන් ආශ්‍රිත)	-	1 28,369
	වෙනත් සැපයුම්කරුවන්ට අත්තිකාරම්	21,250	1,259,329
		10,022,799	12,456,03

	තැන්පතු සහ පූර්ව ගෙවීම් - දීර්ඝ කාලීන	2023	2022
		රු.	රු.
	පූර්ව ගෙවීම් - මෘදුකාංග බලපත්‍ර ගාස්තුව	119,157	3,022,279
		119,157	3,022,279

		2023	2022
13.1	**පූර්ව ගෙවීම්**	රු.	රු.
	වෛද්‍ය රක්ෂණය	1,038,577	1,027,822
	වෙනත් රක්ෂණ	966,639	8 21,755
	වෙනත් පූර්ව ගෙවීම්	1,227,530	1,161,603
	නඩත්තු කිරීම් - කෙටිකාලීන	1,630,780	2,476,896
	මෘදුකාංග බලපත්‍ර ගාස්තුව - කෙටිකාලීන	3,926,042	4,609,915
		8 ,908,756	10,097,990

		2023	2022
14	**ලැබිය යුතු පොළී**	රු.	රු.
	ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම	178,415	82,421
	ස්ථාවර තැන්පත්	7,149,699	13,716
	භාණ්ඩාගාර බිල්පත	6,703,572	1,912
	භාණ්ඩාගාර බැඳුම්කර	23,201,016	4,002,061
	සාංගමික ණයකර	2,048,664	783,308
		39,281,367	21,786,049

		2023	2022
15	**වෙනත් ලැබිය යුතු**	රු.	රු.
	කාර්ය මණ්ඩල ණය ගැනියෝ	5,771,741	4,959,001
	අය විය යුතු වෙනත් මුදල් (සටහන (15.1)	122,794,228	71,131,144
		128,817,969	76,090,145

		2022	2021
15.1	**අය විය යුතු වෙනත් මුදල්**	රු.	රු.
	ආයෝජන භාර අරමුදලෙන් ලැබිය යුතු මුදල්	122,794,228	71,131,144
		122,794,228	71,131,144

16 දේපළ, පිරියත සහ උපකරණ

	ඉඩම්	ගොඩනැගිලි	පරිගණක උපකරණ	මෝටර් වාහන	ලීබඩු සහ සවිකිරීම්	කාර්යාල උපකරණ	පුස්තකාල පොත්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය								
2023 ජනවාරි 01 දිනට ශේෂය	156,000,000	324,858,738	137,916,389	29,615,195	19,965,411	29,799,063	1,731,829	699,886,623
එකතු කිරීම්	-	25,971,970	1,146,990	-	73,600	163,183	1,850	27,357,593
අඩු කිරීම්: බැහැරකිරීම් (සටහන 01)					(17,270)	(125,550)	-	(142,820)
අඩු කිරීම්: වත්කම් ලියාහැරීම					-			-
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**156,000,000**	**350,830,706**	**139,063,379**	**29,615,195**	**20,021,741**	**29,836,697**	**1,733,679**	**727,101,397**
සමුච්චිත ක්ෂය								
2023 ජනවාරි 01 දිනට ශේෂය	-	7 7,093,305	1 05,540,052	1 5,763,603	1 9,576,508	23,383,891	1 ,730,061	243,087,420
අගය ක්ෂය කිරීම් ගාස්තු	-	6,883,293	7,278,402	2 ,873,140	83,904	866,231	1,596	17,986,566
අඩු කිරීම්: බැහැරකිරීම්		-	-	-	(17,270)	(125,550)	-	(142,820)
අඩු කිරීම්:වත්කම් ලියාහැරීම		-	-	-	-	-	-	-
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**83,976,598**	**112,818,454**	**18,636,743**	**19,643,142**	**24,124,571**	**1,731,657**	**260,931,165**
2023 දෙසැම්බර් 31 වැනි දිනට	**156,000,000**	**266,854,108**	**26,244,925**	**10,978,452**	**3 78,599**	**5,712,126**	**2,022**	**466,170,232**

සටහන්
බැහැර කරන ලද වත්කම්වලට පිරිවැය වූ රු.17,200 ක් වූ සහ 2011 දෙසැම්බර් වන විට සමුච්චිත ක්ෂය රු.17,200 ක් වූ චිල්ඩ් මයික්‍රෝවේව් පෝරණුවක් සහ පිරිවැය රු.125,500 ක් වූ සහ 2015 සැප්තැම්බර් වන විට සමුච්චිත ක්ෂය රු.125,550 ක් වූ සැම්සුං රූපවාහිනියක් ඇතුළත් වේ.

16 දේපළ, පිරියත සහ උපකරණ (තවදුටරත් ...)

	ඉඩම්	ගොඩනැගිලි	පරිගණක උපකරණ	මෝටර් වාහන	ලීබඩු සහ සවිකිරීම්	කාර්යාල උපකරණ	පුස්තකාල පොත්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය								
2022 ජනවාරි 01 දිනට ශේෂය	156,000,000	324,858,736	135,775,189	29,615,195	19,965,411	25,528,787	1,731,829	693,475,147
එකතු කිරීම්	-	-	2,141,200	-	-	4,270,276	-	6,411,476
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**156,000,000**	**324,858,736**	**137,916,389**	**29,615,195**	**19,965,411**	**29,799,063**	**1,731,829**	**699,886,624**
සමුච්චිත ක්ෂය								
2022 ජනවාරි 01 දිනට ශේෂය	-	70,660,729	99,010,809	12,898,423	19,492,311	22,663,574	1,728,462	226,454,308
අගය ක්ෂය කිරීම් ගාස්තු	-	6,432,576	6,529,243	2,865,180	84,197	720,317	1,599	16,633,112
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		**77,093,305**	**105,540,052**	**15,763,603**	**19,576,508**	**23,383,891**	**1,730,061**	**243,087,420**
2022 දෙසැම්බර් 31 වැනි දිනට	**156,000,000**	**247,765,431**	**32,376,337**	**13,851,592**	**388,903**	**6,415,172**	**1,768**	**456,799,204**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දින අවසන් වූ වර්ෂය

		2023	2022
17	**ලැබිය යුතු වෙළඳ**	රු.	රු.
	උපචිත (සටහන 17.1)	31,451,197	13,475,008
	සේ.භා.අ. සහ සේ.නි.භා.අ. ගෙවිය යුතු	1,768,828	2,762,060
	ගෙවිය යුතු උපයන විට බදු	2,862,130	25,565
	ගෙවිය යුතු මුද්දර බදු	4,100	3,925
	ගෙවිය යුතු ආදායම් බදු	12,089,836	8,018,661
	ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ බදු	64,160	-
	ආයතනික ක්‍රෙඩිට් කාඩ්පත	121,498	-
		48,361,749	24,285,219

		2023	202
17.1	**උපචිත**	රු.	රු.
	කාර්යාල පිරිවැය	6,660,667	2,831,256
	බාහිර විගණන ගාස්තු - IPS	612,840	624,000
	වෘත්තීය සහ නීති ගාස්තු - IPS	598,258	689,367
	වෘත්තීය සහ නීති ගාස්තු - ETF	212,889	160,000
	විදුලිය ගාස්තු	564,767	543,210
	දුරකථන / අන්තර්ජාල ගාස්තු	501,407	513,053
	ඉන්ධන	71,677	71,360
	පර්යේෂණ ව්‍යාපෘති වියදම්	22,231,039	8,042,761
		31,451,197	13,475,008

		2023	2022
18	**ව්‍යාපෘති සඳහා ලැබුණු අත්තිකාරම්**	රු.	රු.
	ජනවාරි 01 දිනට ශේෂය	107,413,221	36,314,558
	වර්ෂය තුළ ලැබීම්	239,104,657	141,537,784
	වර්ෂය තුළ ගෙවීම්	(23,705,220)	(4,885,169)
	හඳුනාගත් ආදායම්	(262,581,577)	(65,553,952)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**60,231,081**	107,413,221

		2023	2022
19	**සේවක ප්‍රතිලාභ**	රු.	රු.
	ජනවාරි 01 දිනට ශේෂය	28,828,338	21,262,898
	වර්ෂය තුළ හඳුනාගත් වියදම් (සටහන 19.1)	11,529,290	8,272,692
	වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්	-	(707,252)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**40,357,628**	28,828,338

2023 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක සංඛ්‍යාව 45 ක් වේ (2022: 45).
2023 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන සේවක සංඛ්‍යාව 48 ක් වේ (2022: 45).
මෙම වගකීම් වෘත්තීය ආයුගණක සමාගමක් විසින් තක්සේරු කර ඇත.
මෙම ප්‍රතිලාභ සපයා දීමේ දී ආයතනයට දැරීමට සිදුවන පිරිවැය තීරණය කිරීමේ දී පහත් සඳහන් උපකල්පන යොදා ගෙන ඇත.

වට්ටම් අනුපාතිකය	13% (2022: 18%)
වැටුප් අනුපාතිකයෙහි වර්ධනය	10% (2022: 15%)
කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය	18% (2022: 22%)

		2023	2022
19.1	**වර්ෂය තුළ හඳුනාගත් වියදම්**	රු.	රු.
	ප්‍රවර්තන සේවා පිරිවැය	2,826,296	2,175,856
	පොළී පිරිවැය	5,189,101	2,126,290
	ආයුගණක (ලාභය)/පාඩුව	3,513,893	3,970,546
		11,529,290	8,272,692

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

20 කල් බදු වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට කල් බදු වගකීම් නැත. (2022: නැත)

21 ප්‍රාග්ධන වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට ප්‍රාග්ධන වගකීම් නැත. (2022: නැත)

22 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

22.1 ආයතනයෙහි ආයෝජන භාර අරමුදල

ආයතනයෙහි ආයෝජන භාර අරමුදලෙහි (භාර අරමුදල) 2023 දෙසැම්බර් 31 දිනට රු. 510,340,323.25/- ක ශුද්ධ වත්කම් වටිනාකමක් තිබුණි. (2022 රු. 510,341,848/-). භාරයේ මුළු ආදායමම IPS වෙත ලබා දෙන අතර භාර අරමුදලේ කළමනාකරණ වියදම් IPS විසින් ප්‍රතිපූරණය කරනු ලැබේ. වෙනම ම විගණනය කරනු ලබන ආයෝජන භාර අරමුදල සඳහා වෙනම ම ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. මෙම භාර අරමුදල භාරකරුවන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර එයින් දෙදෙනෙකු නිල බලයෙන් පත් වන සාමාජිකයින් වේ (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සභාපතිවරයා සහ විධායක අධ්‍යක්ෂ).

22.2 ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස ("KMP")

SLPSAS 14 ට අනුව "සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්", KMP යනු ආයතනයේ ක්‍රියාකාරකම් සෘජුව හෝ වක්‍රව සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා අධිකාරියක් සහ වගකීමක් ඇති පුද්ගලයන් වේ.

IPS කාර්ය මණ්ඩල පිරිවැය තුළ (සටහන 6) ප්‍රධාන කළමනාකරණ සේවක පිරිසට ගෙවනු ලබන වැටුප රු. 37,771,128/- (2022: රු. 25,106,376/-) ඇතුළත් වේ.

22.3 වෙනත් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

2022 වර්ෂයට පෙර ආයතනයෙහි උපයෝගීතා, නඩත්තු සහ ආදයම් බදු වියදම් සඳහා ශ්‍රී ලංකා රජයයෙන් ප්‍රදාන ලැබුණි. මෙම වසර තුළ කිසිඳු මුදලක් ප්‍රදානය කොට නොමැත.
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, මහ බැංකුවේ අධිපති සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලයට නිල බලයෙන් පත් වන සාමාජිකයින් වේ.

23 අවිනිශ්චිත වගකීම්

මූල්‍ය ප්‍රකාශන දිනය වන විට අවිනිශ්චිත වගකීම් නොතිබුණි.

24 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව සිදුවුණු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවල හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් වල ගැළපීම් සිදුකිරීම අවශ්‍ය කරන සිදුවීම් සිදුවී නැත.

25 පාලක මණ්ඩලයේ වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

26. අයවැය සහ සැබෑ තත්වය පිළිබඳ සංසන්දන ප්‍රකාශය

සංශෝධිත අයවැය - 2023 රු.		සටහන්	2023 රු.	2022 රු.
	ආදායම			
-	ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ප්‍රදාන	**2**	-	
264,446,162	ව්‍යාපෘති ආදායම	**3**	277,798,785	105,456,710
126,881,415	පොළී ආදායම	**4**	130,718,970	67,934,669
128,203,771	ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු දායකත්වය	**22**	122,809,517	71,146,433
455,475	ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ලැබුණු ආදායම		606.025	-
4,164,681	විවිධ ආදායම්	**5**	3,234,129	71,146,433
524,151,504	**මුළු ආදායම**		**535,167,426**	247,535,622
	වියදම්			
117,253,472	සේවක පිරිවැය	**6**	124,237,361	94,695,689
111,224,585	පර්යේෂණ පිරිවැය	**7**	86,881,629	37,905,793
21,707,268	උපයෝගිතා වියදම්		22,568,285	15,993,983
15,204,117	වෙනත් මෙහෙයුම් වියදම්	**8**	17,477,967	12,231,096
219,749	ගමන් වියදම්		340,244	150,815
72,230	ශ්‍රවණාගාරය කුලියට දීම		124,655	-
265,681,421	**මුළු වියදම**		**251,630,141**	160,977,376
258,470,083	**වර්ෂය සඳහා ජංගම අතිරික්තය**		**283,537,285**	86,558,246.00
17,042,409	දේපළ, පිරියත සහ උපකරණ මත අගය ක්ෂය වීම	**16**	17,986,566	16,633,112.00
241,427,674	**වර්ෂය සඳහා අගය ක්ෂය කිරීමෙන් පසු අතිරික්තය**		**265,550,719**	69,925,134
35,711,926	ආදායම් බදු වියදම්	**9**	35,558,147	19,471,354
205,715,748	**බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා අතිරික්තය**		**229,992,572**	50,453,780

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ්/සී/ අයිපීඑස් / එෆ්එස්/2023

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 අප්‍රේල් 08 දින

සභාපති
ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශ තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත ගඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) මෙහෙයුම් අත්පොතෙහි සඳහන් පරිපාලන කාර්යය මණ්ඩලයට ගණකාධිකාරිවරයෙකු අනුමත කර නිබුණු නමුත් මෙම වාර්තාවේ දින දක්වා බඳවා ගැනීම් සිදුකර නොනිබුණි.

(ආ) ආයතනය සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන්ගේ ස්වභාවය හඳුනාගෙන ඊට අනුකූල වන පරිදි භාවිතා කරන ගිණුම්කරණ පද්ධති වැඩිදියුණු කරගත යුතු වුවත් එසේ කටයුතු නොකිරීමෙන් සමාලෝචිත වර්ෂය තුල පර්යේෂණ සඳහා මිලදී ගත් රු.9,509,003 ක් වූ ස්ථාවර වත්කම්, වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට නොහැකිවී නිබුණි.

ඩබ්ලිව්.පී.සි. වික්‍රමරත්න
විගණකාධිපති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

අවසන් විගණන වාර්තාව සඳහා ප්‍රතිචාර

LSW/D/IPS/FS/2023

මූල්‍ය ප්‍රකාශන විගණනය 2023

2.3

(අ)

රටේ පවතින වර්තමාන ආර්ථික තත්ත්වය හේතුවෙන් ගණකාධිකාරී තනතුර සඳහා පත්වන නිලධාරීන් වැඩි කාලයක් රැඳී නොසිටීමේ ගැටළුවක් අපි අත්විඳින්නෙමු. අවසන් ගණකාධිකාරීවරයාගේ ඉල්ලා අස්වීම 2023 ජූලි මාසයේදී සිදු වූ අතර, එය මාස 12 කට අඩු කාලයක් තුළ සිදු වූ දෙවැනි ඉල්ලා අස්වීම විය. දැනට, ගණකාධිකාරීවරයාගේ තනතුරේ රාජකාරි වැඩබලන ගණකාධිකාරීවරයා විසින් ආවරණය කරනු ලබන අතර, එබැවින් පුරවා නොමැති පුරප්පාඩුවක් නොමැත.

(ආ)

විගණන වාර්තාවේ සඳහන් ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා සිදු කරන ලද මිලදී ගැනීම් වන අතර ඒවා එක් එක් ව්‍යාපෘති මගින් අරමුදල් සපයන ලද මිලදී ගැනීම් වේ. ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ලැබෙන මෙම අරමුදල් ව්‍යාපෘති ගිවිසුම්/ප්‍රදාන ගිවිසුම් මගින් පාලනය වේ. එම මාර්ගෝපදේශ වලට අනුව, ව්‍යාපෘති සඳහා මිලදී ගන්නා සියලුම උපකරණ එම ව්‍යාපෘති සඳහා පවත්වාගෙන යන උපලෙජරවල සටහන් කළ යුතු අතර, ඒවා එම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා පමණක් අදාළ වේ. එබැවින්, මේවා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට අපට බලයක් නැත. කෙසේ වෙතත්, අපි සියලු වත්කම් සඳහා වෙනම ම වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන අතර, මෙම ව්‍යාපෘති වත්කම් ද එම වත්කම් ලේඛනයේ සටහන් කරනු ලැබේ. මේ ආකාරයට, ආයතනයේ භාවිතය සඳහා මෙන්ම විශේෂිත ව්‍යාපෘති සඳහා ද මිලදී ගත් සියලු ම වත්කම් පිළිබඳ නිසි වාර්තා අප සතුව ඇත.



ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

100/20, නිදහස් මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
ටෙලි: +94 11 2143100 • ෆැක්ස්: +94 11 2665065
ඊමේල්: ips@ips.lk • වෙබ් පිටුව: www.ips.lk
බ්ලොග්: 'Talking Economics' - http://www.ips.lk/talkingeconomics
ට්විටර්: www.twitter.com/TalkEconomicsSL
ෆේස්බුක්: www.facebook.lk/instituteofpolicystudies